Hilton
COLOMBO

වසන්ත

අසමසම. අද්විතීය.

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීවල්සී
වාර්ෂික වාර්තාව 2017

පටුන

හෝටලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්..... 15

මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු බිඳක්..... 17

සභාපතිතුමාගේ පණිවිඩය..... 19

නිසි බලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය..... 22

කළමනාකාර කණ්ඩායම..... 27

කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය..... 29

සංයුක්ත පාලනය..... 33

අවදානම් කළමනාකරණය..... 36

තිරසරකත්ව වාර්තාකරණය..... 39

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව..... 45

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම..... 47

විගණන කමිටු වාර්තාව..... 48

මූල්‍ය වාර්තා

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව..... 51

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය..... 54

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය..... 55

ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය..... 56

මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය..... 57

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්..... 58

රැස්වීම් පිළිබඳ නිවේදනය..... 80

සටහන්..... 81

පෙරකලාසි ආකෘති පත්‍රය..... 83

සමාගම පිළිබඳ තොරතුරු..... **පසුපස කවරයේ ඇතුළු පිටුව**

Hilton
COLOMBO

වසන්ත

අසමසම. අද්විතීය.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ව්‍යක්ථබව, අභිමානය හා ශෝභමානබව කැටිවූ හිල්ටන් සන්නාමයේ අනුපමේය ගුණාංගයන් අනුව යමින් හිල්ටන් කළම්බෝහිදී ඔබ ලබන අත්දැකීම අසමසම අද්විතීය අත්දැකීමක්ම වන බව තහවුරු කිරීම පිණිස අප සෙවනට සපැමිණෙන ඔබ වෙත පිරිණැමෙන අපගේ සත්කාරය සෑම අංශයකින්ම විශිෂ්ඨත්වය කරා රැගනයාමට අපි ක්‍රියාකර ඇත්තෙමු. විශිෂ්ඨත්වයේ මුද්‍රාව සනිටුහන් කිරීමේ මහත් ලැදිකමින් ක්‍රියා කරමින්, ක්ෂේත්‍රයේ උපමාන අභිබවායාමටත්, අඛණ්ඩ විකසනයටත් හිල්ටන් කළම්බෝ හෝටලයට මහෝපකාරී වන්නාවූ එහි කොඳුනාරටිය බඳු, සුවිශේෂී කාර්යශූරත්වයෙන් හෙබි කාර්ය මණ්ඩලය අප සෙවනට සපැමිණෙන අපගේ අමුත්තන් සෑමට සිය ජීවිතය පුරාවට අමතක නොවන සුමිහිරි අත්දැකීමක් ගෙන දීම සම්බන්ධයෙන් අපට අති සාර්ථක වීම සඳහා නිරන්තරයෙන් සහාය වේ.

අප කාර්ය මණ්ඩලය වෙත අප විසින් ලබාදී ඇති නව්‍යශීලී අතිවිශිෂ්ඨ පුහුණුව සහ ඔවුන් තුළ කාවද්දා ඇති සාර්ථකත්වය හඹායාමේ තිර අධිෂ්ඨානය තුළින් අපගේ සේවක කණ්ඩායම ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ඉහළම ජනාදරය දිනූවන් බවට පත්ව ඇති අතර, අපගේ මෙහෙයුම්වල අනුකල අංගයක් වශයෙන් ඔවුන් වෙත ලබාදෙනු ලබන ප්‍රමුඛත්වය ඔවුන් තුළ අප කෙරෙහි අචල හිතෛෂීභාවයක් ජනිත කර ඇත. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ සමෘද්ධිමත් පහන් සිළුව සේ ලොවම පිළිගත් අපගේ කීර්තිනාමය රැකගනිමින් දශක තුනක් අරා දිවෙන අපගේ උරුමය එළබෙන ඉදිරි වර්ෂයේදී ද අඛණ්ඩව එලෙසින් වැපඬෙනු ඇත.

විශිෂ්ඨත්වය වෙත පිය නගන්න

සුබෝපභෝගීභාවයේ හා අනර්ඝත්වයේ පහස විඳගන්න, එය දශක ගණනාවක සිට ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ අප ආරක්ෂාකර ගනිමින් සිටින ප්‍රමිතිය යි.





අප ගැන ඔබ ඇතිකර ගන්නා පළමු හැඟීම

අප සෙවනට පැමිණි මොහොතේ සිට බැහැරව යන තෙක් අපගේ අමුත්තන්ගේ අවශ්‍යතා වෙනුවෙන් අප දරන කැපවීම සැබවින්ම විශිෂ්ට වේ.




SHIRANJI

සිනහව සපිරි සේවාව

අපගේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුගේම උණුසුම් සුහදශීලී පෞරුෂය අප වෙත සපැමිණෙන අමුත්තන්ගේ සිත් තුළ අමරණීය මතක සටහන් ජනිත කරවයි.




JANITHA

නිසඟණ ඇසක්

ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ අතිශය සියුම් තැන් පිළිබඳව පවා අප දැඩි අවධානය යොමු කිරීම නිසැකයෙන්ම අද්විතීය කාර්යයක් වේ. හෝටල් කර්මාන්තයේ සෙසු පිරිස අතර අප සුවිශේෂ වන්නේ ඒ නිසාය.





විශේෂඥ සත්කාරය

තම වෘත්තීය ක්ෂේත්‍රයේ නිපුනයින් වන්නා සේම විස්මිත සේවාවක සියුම් තැන් මැනවින් තේරුම් ගත් නිසැකයෙන්ම වෘත්තීයවේදී කාර්ය මණ්ඩලයක් අප සතුවීම පිළිබඳව අපි ආඩම්බර වන අතර ඔවුහු සිය සේවා පළපුරුද්ද, සාමාන්‍යකරණයෙන් අද්විතීයත්වය කරා පත්කර ගැනීමට නිතැතින් කටයුතු කරති.





ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ උපමාන නියම කිරීම

පසුගිය දශක කිහිපය තුළ අප විසින් ශ්‍රී ලංකාව තුළ ලෝක මට්ටමේ ආගන්තුක සත්කාර සේවාවක් සඳහා ප්‍රමිති නියම කරන ලද අතර එළඹෙන වර්ෂ වලදී ද නිසි ප්‍රමිති නිර්ණායක ස්ථාපිත කිරීමට තවදුරටත් ක්‍රියා කරනු ඇත.






Hilton

හෝටලය පිළිබඳ සංක්ෂිප්ත සටහනක්



සියලු පහසුකම් සහිත කාමර 311

සුබෝපභෝගී සුවිසල් කාමර 44

විධායක විසිත්ත කාමරය

එළිමහනේ සිට ආහාර ගැනීමේ පහසුකම සහිත
දවස පුරා ක්‍රියාත්මක ආපනශාලාව

විසිත්ත කාමරය හා බාරය

කෝපිහල

සියලු නවීන පහසුකම් සහිත මුළුතැන්ගෙවල්

අසමසම චීන අවන්හල

විවිධ ප්‍රාසාංගික ප්‍රදර්ශන ශාලා සහ බෝල්රූම් නර්තන ශාලා



මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු බිඳක්

	2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
කාමර ආදායම ශ්‍රී ලං රු.'000	1,317,248	1,151,954
ආහාර හා පාන ආදායම ශ්‍රී ලං රු.'000	1,635,026	1,330,543
වෙන් ආදායම් ශ්‍රී ලං රු.'000	63,088	58,183
මුළු ආදායම ශ්‍රී ලං රු.'000	3,015,362	2,540,680
දළ ආන්තික ලාභය %	82	83
බදු පෙර අ/ලාභය ශ්‍රී ලං රු.'000	172,976	172,944
බදු ගෙවූ පසු අ/ලාභය ශ්‍රී ලං රු.'000	258,017	141,012
කොටසක ඉපැයීම් (පාඩුව) ශ්‍රී ලං රු.	0.13	0.07
සාමාන්‍ය කාමර ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලං රු.	21,077	20,408
කාමර පදිංචිව සිටීමේ අනුපාතය %	57	47
දිගු කාලීන පොළී ණය ගැනීම් ශ්‍රී ලං රු.'000	කිසිවක් නැත	කිසිවක් නැත
මුළු ස්කන්ධ ප්‍රාග්ධනය ශ්‍රී ලං රු.'000	14,022,329	13,772,897
ණය / ස්කන්ධ අනුපාතය %	1.94	2.47
සමස්ත වත්කම් ශ්‍රී ලං රු.'000	15,428,109	15,362,703
ණය / සමස්ත වත්කම් අනුපාතය %	1.77	2.21
ජංගම වත්කම් ශ්‍රී ලං රු.'000	755,730	1,016,007
ජංගම බැරකම් ශ්‍රී ලං රු.'000	875,628	862,057
ජංගම අනුපාතය (වාර) %	0.86	1.18
ක්ෂණික වත්කම් අනුපාතය (වාර) %	0.80	1.12



සභාපතිතුමාගේ පණිවිඩය

"ශ්‍රී ලංකාව ජරිනත ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙසත් මිහි මත පිහිටි වඩාත් සාමකාමී ස්ථානයක් ලෙසත් වඩවඩාත් සැලකිල්ලට භාජනය වෙමින් පවතින ජව සමපන්න පශ්චාත් යුධ වාතාවරණයක් තුළ, සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගනිමින් හිල්ටන් කළමබෝ හෝටලය රටේ සුභවාදී පරිසරය පිළිබඳව ලොවටම කියා පායි. දැනට විස්මිත පරිවර්තනයක් අභිමුව දුෂ්කර සමයක් පසුකරමින් සිටින හිල්ටන් කළමබෝ හෝටලය එම පරිවර්තනය තුළින් යෝධ පිම්මක් ඉදිරියට තබමින් ශ්‍රී ලංකාවට අලුතින් එක්වන නවතම ජාත්‍යන්තර හෝටල් අතර බොහෝ ඉදිරියෙන් සිටිමින් පෙරටම යමින් සිටී."

හිතවත් කොටස්කාරභවතුනි,

හොටේල් ඩිවේලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ 2017 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව හා විගණනය කළ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව ඉමහත් සතුටට පත්වෙමි. හොටේල් ඩිවේලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ විනෝදාස්වාද සැපයීම සඳහාම කැපකළ දේපළක් වන හිල්ටන් කළමබෝ හෝටලයේ මෙහෙයුම් පවත්වාගෙන යනු ලබන සාර්ථක 30 වන වසර මෙම වර්ෂයේදී සැමරීම ද වැදගත් සංසිද්ධියකි. ගෙවුණු දශක තුනක් තුළ අප ආ ගමන්මග අතිශය උද්වේගකර වූ අතර එම කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නියැළී සෙසු කර්මාන්තකරුවන්ට අනුගමනය කිරීම පිණිස සේවා ප්‍රමිති නිර්ණායක සකසාදෙමින්, එම කර්මාන්තයේ දීර්ඝ කාලීන තිරසරකත්වය වෙනුවෙන් කැපවූ සන්නාමයක් බවට පත්වීමට හිල්ටන් හෝටලයට හැකි විය.

මීට තිස් වසරකට පෙර ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් ආරම්භ කළ ප්‍රථම ජාත්‍යන්තර හෝටල් සන්නාමය වශයෙන් හිල්ටන් කලම්බෝ හෝටලය ගෙවුණු අභියෝගාත්මක තිස් වසර තුළ විදේශීය සංචාරකයන් මෙන්ම දේශීය අමුත්තන් වෙනුවෙන් ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පහන්ටැඹ සේ විජයග්‍රාහීව පෙරටම පැමිණ සිටින අතර දිවයින තුළ ව්‍යාපාරික කටයුතුවල හිල්ටන් සන්නාමය නිරතව සිටීම සංචාරකයන් තුළ විශ්වසනීයත්ව ගොඩනැංවීමට හේතු වී ඇත. ගෙවුණු දශක කිහිපය තුළ සීඝ්‍රයෙන් වර්ධනය වූ දැඩි තරගකාරීත්වය හමුවේ ආගන්තුක සත්කාර සේවා අංශයේ සුපහන් හිලටන් සන්නාමය හිල්ටන් පාර්ශ්වකරුවන්ගේ පක්ෂපාතීත්වය සමඟ මුසුවී සිය වෙළඳපොල පංගුව තිරසරව රැකගැනීමටත්, තවදුරටත් ව්‍යාප්ත කරගැනීමටත් සමත් වී ඇත.

ශ්‍රී ලංකාව ජරිනත ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙසත් මිහි මත පිහිටි වඩාත් සාමකාමී ස්ථානයක් ලෙසත් වඩවඩාත් සැලකිල්ලට භාජනය වෙමින් පවතින ජව සමපන්න පශ්චාත් යුධ වාතාවරණයක් තුළසිය මෙහෙයුම් කටයුතු පවත්වා ගනිමින් හිල්ටන් කළමබෝ හෝටලය රටේ සුභවාදී පරිසරය පිළිබඳව රැවී පිළිරැවී දේ, දැනට විස්මිත පරිවර්තනයක් අභිමුව දුෂ්කර සමයක් පසුකරමින් සිටින හිල්ටන් කළමබෝ හෝටලය එම පරිවර්තනය තුළින් යෝධ පිම්මක් ඉදිරියට තබමින් ශ්‍රී ලංකාවට අලුතින් එක්වන නවතම ජාත්‍යන්තර හෝටල් අතර බොහෝ ඉදිරියෙන් සිටිමින් පෙරටම යමින් සිටී. සමාලෝචිත වර්ෂය තුළ හෝටලයේ ආලින්දය හා වෙනත් පොදු ස්ථාන ආදියෙහි අලුත්වැඩියා කටයුතුවල මූලික අදියර සාර්ථකව නිම කිරීමට හැකිවීම මෙහිලා සඳහන් කිරීමට ලැබීම භාග්‍යයක් සේ සිතමි. හෝටලයේ අලුතින් පිළිසකරකළ ස්ථානවල නවතම පෙනුම හා කලාත්මක බව අපගේ පාර්ශ්වකරුවන්ගේ මනදොළ පිනවීමට සමත් වී ඇත.

සමාලෝචිත වර්ෂයේ වැඩි කාලයක් තුළ අලුත්වැඩියා කටයුතු සිදුකෙරෙමින් පැවතිය ද, පෙර වර්ෂයේ රුපියල් බිලියන 2.5ක් වූ ආදායම 2017 වර්ෂයේදී රුපියල් බිලියන 3 දක්වා ඉහළ නංවාගනිමින් සිය මූල්‍ය කාර්යසාධනය වර්ධනය කරගැනීමට සමාගමට හැකි විය. බදු ගෙවූ පසු ලාභය රු. මිලියන 141 සිට 258 දක්වා ඉහළ ගියේය. මෙම අද්විතීය සාර්ථකත්වය උදෙසා උරදුන් අප්‍රතිහත කැපවීමෙන් යුතු අපගේ කාර්ය මණ්ඩලය වෙත සහ සේවා විශිෂ්ටත්වය පිළිබඳ හිල්ටන් සන්නාමය සැම විටම අපේක්ෂා කරන, අප කෙරෙහි අචල පක්ෂපාතීත්වයෙන් යුතු හිල්ටන් ගෞරවනීය සාමාජිකයන් සහ සෙසු දේශීය හා විදේශීය අමුත්තන් වෙත මාගේ ස්තූතිය පුදකර සිටිය යුතුමය. අපගේ අමුත්තන් බොහෝමයක් තහවුරු කර සිටින්නේ හිල්ටන් කළමබෝ හෝටලය තුළ දී තමන් ලද අත්දැකීම හෝටලයට නැවත නැවතත් පැමිණීමට තමන් පොළඹවන තරමේ අසමසම අත්දැකීමක් වන බවයි. සමාලෝචිත වර්ෂය තුළ හෝටල් කර්මාන්තයේ නියාමන සහ යහ පාලන පරිචයන්ට දැඩි අනුකූලතාව තහවුරු කිරීම පිණිස ක්‍රියා කළ අප සමාගම ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගැනීමට ද ප්‍රඥාගෝචර මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද හා උපායමාර්ගික සැලසුම් උපයෝගීකර ගැනීමට ද ඉදිරියටත් ක්‍රියා කරනු ඇත. ශ්‍රී ලංකාවේ ගෞරවාදරයට පත් සන්නාමය වශයෙන් ද දිවයිනේ අගනගරයේ සළකුණ වශයෙන් ද හිල්ටන් කළමබෝ හෝටලයේ සම්ප්‍රදායන්ට අනුව ඉදිරියේදී ක්‍රියා කිරීමටත්, ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ නව ඉහළ මානයන් කරා හෝටලය රැගනයාමටත් හැකි සියල්ල ඉටු කිරීමටත් අපි ප්‍රතිඥා දෙමු.

සමාලෝචිත වර්ෂය තුළ ජාතික ආර්ථික වර්ධනයේ ප්‍රධාන සාධකයක් ලෙස සංචාරක අංශය තම ශක්තිය විදහා දැක්වීම යන කාරණය තුළින් හෝටල් කර්මාන්තයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් අචලව පැවති අපගේ ප්‍රකේෂපණවල නිරවද්‍ය බව සනාථ වීම පිළිබඳව මෙහිලා සඳහන් කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි. ජාතික ආර්ථිකය නැවත සංවර්ධනීය මාර්ගයට ගෙනඒමට රජය විසින් මෑතදී ගනු ලැබූ ක්‍රියාමාර්ග ආගන්තුක සත්කාර සහ හෝටල් ක්ෂේත්‍රවලට ඉතා යහපත් වනු ඇතැයි අපි සුභවාදීව අපේක්ෂා කරමු. ඉදිරි මාස කිහිපය තුළ ශක්තිමත් ආර්ථික වර්ධනයක් ලඟාකරගැනීම පිණිස මේ වන විට අත්තිවාරම සකසා තිබේ. යහපාලනය හා විනිවිදභාවය ස්ථාපිත කිරීමට රජය විසින් නිරහීත පියවර රැසක් ගෙන ඇත. සංචාරක කර්මාන්තය ප්‍රගමනය උදෙසා ගනු ලැබූ එවැනි නිරහීත පියවර පරිපාලනය විසින් නිසි පරිදි ක්‍රියාවට නංවනු ඇතැයි අපි තවදුරටත් අපේක්ෂා කරමු. ලොව

සභාපතිතුමාගේ පණිවිඩය

වඩාත් සාමකාමී ජාතියක් වශයෙන් ජවසම්පන්න ප්‍රජාතන්ත්‍රවාදයක් කරා පියවර තබන ශ්‍රී ලංකාව සතු විභවතාවන් ප්‍රශස්ත මට්ටමට ගෙනඒම මඟින් ජාත්‍යන්තර ගමනාන්තයක් ලෙස මෙම සුන්දර දිවයින ලොව පතල කිරීමට රජය විසින් නිර්මාණ හා සාධනීය පියවර ගනු ඇතැයි අප කර්මාන්තය අපේක්ෂා කරයි.

සාර්ව කර්මාන්තය සහ ආර්ථික පසුබිම

2017 වර්ෂය තුළ සංචාරකයන්ගේ පැමිණීමෙ සුළු වර්ධනයක් පෙන්නුම් කළ සංචාරක කර්මාන්තය දිවයිනේ තෙවැනි විශාලතම විදේශ විනිමය උපයන්නා ලෙස තවදුරටත් සිය ස්ථානය පවත්වා ගන්නා ලදී, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ සැබෑ වර්ධනය 2016 වාර්තා වූ සියයට 4.5 මට්ටමේ සිට 2017 දී සියයට 3.1 දක්වා තවදුරටත් පහළ ගියේය.

2017 වසරේදී වාර්ෂික සංචාරකයන්ගේ පැමිණීමේ ඉහළම අගය වූ 2,116,407 වාර්තා වූ අතර වසරක් පාසා එම වැඩිවීමේ අගය සියයට 3.2 ක සාමාන්‍ය වර්ධන අගයක් ගත්තේය. 2017 වර්ෂයේ අප්‍රේල් දක්වා පැවති ගුවන් ප්‍රවේ අලුත්වැඩියාවන් හා උත්ශ්‍රේණිගත කිරීම් හේතුවෙන් ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මෙහෙයුම් අර්ධ වශයෙන් සිදුකිරීම නිසා සිදුවූ ගුවන් ගමන් අවලංගුවීම් හා ප්‍රමාදයන් සංචාරක අංශයේ දුර්වල කාර්යසාධනය කෙරෙහි යම් පමණකින් දායක විය.

ලංකාවට බහුතර සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණෙන රට වශයෙන් ඉන්දියාව සිය ස්ථානය තවදුරටත් පවත්වා ගැනීමට සමත් වූ අතර 2017 වර්ෂයේදී ඉන්දියාවෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 384,628 ක් ලෙස වාර්තා කරමින් සංචාරක පැමිණීමේ වර්ධනයට වැඩි වශයෙන් දායක විය. සංචාරකයන් පැමිණෙන දෙවැනි විශාලතම රට ලෙස චීනය තම ස්ථානය රැකගත් නමුත් පැමිණි සංඛ්‍යාවේ සුළු අඩුවීමක් දක්නට ලැබුණි. සංචාරකයන් පැමිණෙන රටවල් අතර එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය පිළිවෙලින් තෙවැනි, සිවිවැනි හා පස්වන ස්ථාන හිමිකර ගත්තේය. සංචාරකයන් වැඩි වශයෙන් පැමිණෙන මෙකී රටවල් පහ එක්ව 2017 දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාවෙන් සියයට 51.2 පංගුවකට හිමිකම් කියන ලදී.

සංචාරකයන්ගේ පැමිණීමේ අපේක්ෂිත වර්ධනයට වඩා අඩු වර්ධනයක් වාර්තා වුවද, 2017 වර්ෂයේදී සංචාරකයන්ගේ සාමාන්‍ය වැයකිරීම් ප්‍රමාණය මෙන්ම දිවයිනේ රැඳී සිටීමේ කාලය ඉහළයාම සංචාරක කර්මාන්තයේ ඉපැයීම් යහපත් මට්ටමකින් පවත්වා ගැනීමට ඉවහල් විය. 2017 වර්ෂයේදී සංචාරක කර්මාන්තයේ ඉපැයීම් සියයට 11.6ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 3,925ක් බවට පත්වූ අතර 2016 වර්ෂයේදී එම අගය එ.ජ. ඩොලර් මිලියන 3,518ක් විය.

ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් උත්ශ්‍රේණිගත කිරීමට හා ව්‍යාප්ත කිරීමට අඛණ්ඩව සිදුකළ ආයෝජන ආධාරයෙන් සංචාරක කර්මාන්තයේ ඉපැයීම් ස්ථාවරව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සතු විභවතාවේ විපුල ඵල නෙළා ගැනීමට හැකිවන පරිදි සංචාරක දැක්ම 2025 සපුරා ගැනීම සඳහා පහසුකම් සලසනු පිණිසත්, එක්සත් ජාතීන්ගේ සංචාරක කර්මාන්තය පිළිබඳ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සහායවනු පිණිසත් සම්පාදිත නව සංචාරක උපායමාර්ගික සැලැස්ම 2017-2020 ආදී ප්‍රතිපත්ති මූලාරම්භන හා ක්‍රියාමාර්ග රැසක් 2017 වර්ෂයේදී ගනු ලැබීය.

ඒ අනුව, වසර 2020 වන විට සංචාරක කර්මාන්තයේ ඉපැයීම් එ.ජ. ඩොලර් බිලියන 7 දක්වා ඉහළයනු ඇතැයි ද, ආශ්‍රිත කර්මාන්ත තුළ 600,000 කට රැකියා අවස්ථා උදාවනු ඇතැයි ද, සංචාරයෙකුගේ දෛනික වැය කිරීම් එ.ජ. ඩොලර් 210ක් දක්වා වැඩිවනු ඇතැයි ද යනුවෙන් අපේක්ෂා කෙරේ.

රටේ ආර්ථිකයේ අපේක්ෂා සහගත විදේශ විනිමය උපයන්නා ලෙස සංචාරක කර්මාන්තය තවදුරටත් පවතින නමුත්, ශ්‍රී ලංකාව ස්වකීය හැකියාවන් ගෝලීය වෙළඳපොල තුළ උපරිමය දක්වා උපයෝගීකරගෙන නොමැත. ගෝලීය වශයෙන් සංචාරක කර්මාන්තය හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය ජාත්‍යන්තර ආර්ථිකයේ සෑම මට්ටමකම පාහේ දිදුලන ආර්ථික ක්‍රියාකාරකම් රැසක් අඛණ්ඩව උත්පාදනය කරමින් සිටින අතර එ.ජ. ඩොලර් ට්‍රිලියන 1.4ක් ඉක්මවන ආදායම් උපදවමින් 2017 වර්ෂයේ සමස්ත අපනයනවලින් සියයට 7ක් සහ දළ ගෝලීය නිෂ්පාදනයෙන් සියයට 10ක් සඳහා දායක වී ඇත. ලොව බොහෝ සංචාරක ගමනාන්තයන්හී තිරසර වර්ධනයක් පැවතීමත්, පසුගිය වර්ෂයේදී පසුබෑමට ලක්වූ රටවල් ශක්තිමත් ලෙස ප්‍රකෘති තත්ත්වයට පත්වීමත් සමාලෝචිත වර්ෂයේ විශේෂ ලක්ෂණය විය. ගෝලීය ආර්ථිකයේ සිදුවූ සීඝ්‍ර වර්ධනය මෙන්ම වසර කිහිපයක් පසුබා සිටි බ්‍රසීලයේ හා රුසියානු සමූහාණ්ඩුවේ සංචාරකයන්ගේ වැය කිරීම් විශේෂ කොට, සම්ප්‍රදායික හා අලුතින් එක්වූ සංචාරකයන් පැමිණෙන රටවල්වලින් ඉදිරිපත් වී ඇති ඉල්ලුම කිහිප ගුණයකින් ඉහළයාම එකී ප්‍රතිඵල උදාර දීමට හේතු විය.

මෙකී යහපත් වාතාවරණයේ ඉදිරි අපේක්ෂාවන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ අනාගතයට ඉතා යහපත් ආකාරයෙන් බලපානු ඇත. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය විසින් සංචාරක කර්මාන්තයේ තිරසර ප්‍රගමනය වෙනුවෙන් ගෙන ඇති උන්නතිකාමී මූලාරම්භනයන් මම ඉතා අගය කරමි. ගෝලීය හිල්ටන් සන්නාම ප්‍රමිතීන් අනුව යමින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු හා අලුතින් හඳුන්වාදුන් නිෂ්පාදන සමඟ මුසුවූ හිල්ටන් කළමිබෝ හෝටලය ශ්‍රී ලංකාවේ හෝටල් කළඹේ විශිෂ්ටතම හෝටලය වනු ඇත. එකී ප්‍රතිසංස්කරණ කටයුතුවල පළමු අදියර නිම කිරීම මඟින් දැනටමත් අපගේ පරමාදර්ශී සේවා පසුතලය ශක්තිමත් කරනු ලැබ ඇති අතර සිය පක්ෂපාතී ගණුදෙනුකාරභවතුන් සඳහා උත්කෘෂ්ඨ ආශ්වාදයක් ගෙනදීමේ අප පොරොන්දුව අප සමාගම විසින් ඉටු කරනු ලැබ ඇත.

මෙකී ප්‍රතිසංස්කරණ කටයුතුවල අවසන් අදියර 2018 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත අතර, හෝටලයේ ප්‍රතිරූපය ඉහළනැංවීම පිණිස එහි කාමර පරිපූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීම හා නවතම ප්‍රණීත ආහාර හා පාන වර්ග හඳුන්වාදීම මඟින් එහි ලාභදායිත්වය ඉහළයනු ඇත. මෙම උපායමාර්ගික ආයෝජනය තුළින් හිල්ටන් කළමිබෝ හෝටලය ශ්‍රී ලංකාවේ අනර්ඝතම හෝටල් අතර නිසැක තෝරාගැනීම බවට පත්වනු ඇති බවටත්, හෝටල් කර්මාන්තය පිළිබඳ ජාතික දැක්ම සාක්ෂාත්කරගැනීමට උරදෙනු ඇති බවටත් මම විශ්වාසය පළ කරමි.

හෝටල් කර්මාන්තය තුළ සීඝ්‍රයෙන් ඉහළයන තරඟකාරීත්වය පිළිබඳව අපි අවබෝධයෙන් පසුවන අතර හිල්ටන් කළමිබෝ හෝටලයේ පිහිටීම, සලසන සේවාවේ උසස් මට්ටම හා විශ්වසනීයත්වය, කාමර පහසුකම්වල ගුණාත්මය, ආහාර හා පාන විවිධත්වය, සන්නාම කීර්තිනාමය හා අපගේ කාමර පහසුකම් වෙන්කිරීම් වලින් සියයට 50 පමණකට දායකත්වය සලසන හිල්ටන් ඔනර්ස් ලොයල්ටි වැඩසටහන ආදිය ඇතුළු විවිධ අංශයන්ගෙන් අප හෝටලය ශක්තිමත්ව තරඟයට මුහුණ දී සිටින බව අපි විශ්වාස කරමු. හිල්ටන් කළමිබෝ හෝටලය ගෙවුණු දශක තුනක කාලය පුරා ස්වකීය විශිෂ්ට සේවා ප්‍රමිතිය පවත්වා ගෙන එමින් සිටින අතර ඉස්මතු වන ප්‍රවනතාවන්ට හා ක්‍රමිකව විකසනය වන පාරිභෝගික අපේක්ෂාවන්ට අනුව අඛණ්ඩව හැඩගැසෙමින් ක්‍රියා කිරීම පිළිබඳව මහත් ආඩම්බරයට පත්ව සිටී.

අපගේ සාර්ථකත්වයේ යෝධ කුළුණ

අපගේ ව්‍යාපාරික සාර්ථකත්වය අපගේ කාර්ය මණ්ඩලයේ සාර්ථකත්වය හා බැඳී පවතී. අප වෙත පැමිණෙන සේවාලාභී අමුත්තන් අපේක්ෂාකරන මට්ටම ඉක්මවමින් සේවා සැලසීමට නිතැතින් කැපවූ, කුසලතා සපිරි අපගේ ආගන්තුක සත්කාර සැලසීමේ වෘත්තියවේදී කණ්ඩායමේ වෘත්තීයවේදී බව අපගේ ප්‍රබෝධමත් සේවා මට්ටම මඟින් මොනවට පැහැදිලි වේ. අපගේ කාර්ය මණ්ඩලය ලෝක මට්ටමේ කාර්ය මණ්ඩලයක් වන අතර ලොව හොඳම කාර්ය මණ්ඩල සමඟ පහසුවෙන්

"අපගේ වෘත්තීය සාර්ථකත්වය අපගේ කාර්ය මණ්ඩලයේ සාර්ථකත්වය හා බැඳී පවතී. අප වෙත පැමිණෙන සෞඛ්‍යාරක්ෂිත අමුත්තන් අපේක්ෂාකරන මට්ටම ඉක්මවමින් සේවය සැලසීමට නිතැතින් කැපවූ, කුසලතා සහිත අපගේ ආගන්තුක සත්කාර සැලසීමේ වෘත්තීයවේදී, කණ්ඩායමේ වෘත්තීයවේදී බව අපගේ ප්‍රබෝධමත් සේවය මට්ටම මඟින් මොනවට පැහැදිලි වේ. අපගේ කාර්ය මණ්ඩලය ලෝක මට්ටමේ කාර්ය මණ්ඩලයක් වන අතර ලොව හොඳම කාර්ය මණ්ඩල සමඟ එහාමුහුණෙන් තරඟකරීමට හැකියාව ඇති අනිද්‍යක්ෂ කණ්ඩායමකි. සිය ජීවිතයේ සියලුම වැදගත් අවස්ථාවන්හිදී නැවත නැවත අප හෝටලය වෙතම පැමිණීමට අපගේ අමුත්තන් පොළඹවන අසමසම සේවාව හිල්ටන් අපගේ අද්විතීය සළකුණයි. හිල්ටන් හෝටලයෙන් ඉවත්ව යන සේවකයෝ තමන්ට හිල්ටන් හෝටලයෙන් හිමිවන ලෝක මට්ටමේ පුහුණුව, අභිමානය, හා උණුසුම් පිළිගැනීම අසාමාන්‍ය එකක් බව පවසමින් නැවතත් හෝටලයේ සේවයටම පැමිණෙති. විසුහගත කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන ආධාරයෙන් ශක්තිමත් වෘත්තීය ප්‍රගමනය සඳහා අමිල අවස්ථා හිල්ටන් හෝටල් සන්නාමය යටතේ කාර්ය මණ්ඩලය සඳහා සලසාදෙනු ලැබේ.

ගෙවුණු වසර 30 මුළුල්ලේ සිට අප සමඟ උරෙනුර ගැටී සේවයෙහි යෙදී සිටින සහෘදද සේවක පිරිස වෙත හිල්ටන් කළමිබෝ හෝටලය සිය ප්‍රණාමය පුදුකාර සිටී. අතිවිශිෂ්ට සේවාවක් නිරතුරුව සලසාදීමේ අපගේ පොරොන්දුව ඉටුකිරීමට අපට මහෝපකාරී වන්නේ අපගේ කාර්ය මණ්ඩලයේ අචල පක්ෂපාතීත්වයයි.

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අතරතුර පවා එම අපහසුතා නොසලකමින් හෝටලයේ සේවය අපේක්ෂාවෙන් මෙහි පැමිණි අපගේ හිල්ටන් ඔනර්ස් ලොයල් සාමාජිකත්වය දරන අමුත්තන් මෙහිදී විශේෂයෙන් අගයකළ යුතුය. හිල්ටන් ඔනර්ස් යනු ලොව පුරා පිහිටි හිල්ටන් හෝටල්වල නවාතැන් ගන්නා එක් එක් අවස්ථාව සඳහා අමුත්තන්ට විශේෂ ලකුණු පිරිනැමීම මඟින් කැපී පෙනෙන ලෙස ව්‍යාපාරික අවස්ථා නැවත උදාකරගැනීමට අවකාශ සලසාගැනීම සඳහා සකස්කළ විශේෂ ප්‍රවර්ධන වැඩසටහනකි. අපගේ කාමර වෙන්කිරීම් අතර විශාල පංගුවකට මෙම හිල්ටන් ඔනර්ස් ලොයල් සාමාජිකයන් දායකවන අතර වර්ෂය තුළ කැපීපෙනෙන ආදායමක් උපයාගැනීමට ද එම වැඩසටහන දායක විය.

තවද, ජන ජීවිතවල ගුණාත්මක බව වර්ධනය කිරීම පිණිස සමාජ සුභසාධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීම තුළින් අප හෝටලය දේශීය ප්‍රජාවගේ සුභසාධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. අපගේ ව්‍යාපාරික මෙහෙයුම්වලට සහසම්බන්ධ වන ප්‍රජාව වෙත යහපත් ආර්ථික හා සමාජීය බලපෑමක් ඇතිකිරීමට අපි කැපවී ක්‍රියා කරමු. ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත්වීම අපගේ කාර්ය මණ්ඩල සංස්කෘතියේ සුවිශේෂී ගුණාංගයක් වන අතර පරමාදර්ශී පුරවැසියන් ලෙස එම ගුණාංගය අප සේවක පිරිස තුළ කාවැද්දීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙමු.

පාරිසරික වගකීම යනු දශක තුනක අපගේ දිගු ගමන්මගෙහි විශේෂ අවධානට යොමුවූ කරුණක් වන අතර අපගේ මෙහෙයුම් තුළ බලශක්ති කාර්යක්ෂමතාව සහ අපද්‍රව්‍ය කළමනාකරණය අප විසින් යොදාගන්නා ලදී, ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම උදෙසා මිහිකත වඩාත් ආරක්ෂාකාරී, සුපිරිසිදු හා තිරසර ස්ථානයක් බවට පත්කිරීම සඳහා අප ක්‍රියාකරන්නේ එපරිද්දෙනි.

හිල්ටන් සන්නාමය යටතේ සැලසෙන සේවා, නවාතැන් පහසුකම්, ප්‍රණීත ආහාර පාන, අද්විතීය පාරිභෝගික සේවාව හා අප වෙතට පැමිණි මොහොතේ පටන් තම නිවසේ සිටින්නාක් බඳු හැඟීමක් අපගේ අමුත්තන් තුළ ජනිත කරවන අන්දමේ උණුසුම් හා ලෙන්ගතුබව සපිරි අපගේ ආගන්තුක සත්කාර විඳගැනීමට නින්තරයෙන් අපේක්ෂා කිරීම වෙනුවෙන් දේශීය හා විදේශීය අපගේ සේවාලාභීන් සැමට මාගේ ස්තූතිය පුදුකර සිටිමී. ඒ සැමගේ සහයෝගය හා අනුග්‍රහය වෙනුවෙන් ඒ සැමට කෘතඥතාව පළ කරමු.

කෘතඥතාව

තිස් වසරක් පුරා දිවෙන අපගේ ගමන්මග සාර්ථකකර ගැනීමට හැකි වූයේ අපගේ සියලුම පාර්ශ්වකාරභවතුන්ගේ අඟනා දායකත්වය නිසා වෙති. අපගේ අමුත්තන්, හවුල්කරුවන්, සැපයුම්කරුවන්, කොටස්කරුවන් සහ නියාමන අධිකාරීන් විසින් හිල්ටන් සන්නාමය කෙරෙහි පක්ෂපාතීව කටයුතු කරන ලද අතර ගෙවුණු වසර ගණනාව තුළ අප වෙත ලබාදුන් සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් ඔවුන්ට අපගේ ප්‍රණාමය පුදුකාර සිටිමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෘද සමාජිකයන් මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය අපගේ සාර්ථකත්වයට උරදුන් යෝධ කුළුණු වන්නේය. අපගේ සන්නාමය හා බැඳුණු අතිවිශිෂ්ඨත්වය සැමදා එකසේ පවත්වා ගැනීමට ඉවහල් වන අයුරින් තම රාජකාරිය ඉක්මවා ඉන් ඔබ්බට ගොස් තම සේවය වෙනුවෙන් කැපවී සිටින, හැකියාවට, කුසලතාවට නිසි තැන ලබාදෙමින්, ඉතා සුළු කරුණක් කෙරෙහි පවා දැඩි අවධානය යොමුකර ක්‍රියාකරන අග්‍රගණ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුගේ කාර්යශූර නායකත්වය තුළින් අපගේ උත්කෘෂ්ඨ සේවා ප්‍රමිතිය නොවෙනස්ව පවත්වා ගැනීමට අපගේ කාර්ය මණ්ඩලය සමත් වී ඇත. අපගේ මෙහෙයුම් ක්‍රියාවලියෙහි හදවත වන් අපගේ කාර්ය මණ්ඩලය එකාවන්ව ක්‍රියා කරමින් හිල්ටන් කලම්බෝ හෝටලය සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේ සැමදා හඳුණූ ආගන්තුක සත්කාර සන්නාමය ලෙසත් පරමාදර්ශී, උණුසුම් සුහදශීලී නිවහන ලෙසත් ඔවුනගේ සිත්සතන් තුළ සනිටුහන් කර ඇත.*



ක්‍රිශාන්ත ප්‍රසාද් කුරේ
සභාපති

නිසි බලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට

ප්‍රවීර් සමරසිංහ මහතා, ධනුක රන්පිත් සමරසිංහ මහතා, සොනාලි ලියනමාන මෙනවිය, දිණුක් කොළඹගේ මහතා, ශෙෂ්මින් මන්සූර මහතා, ධීෂනා අමරසේකර මෙනවිය



වමේ සිට දකුණට

ටෙහානි මැතිවිස් මෙනවිය, ජේ.එම්.ය්‍ූ.පී. ජයමහ මහතා, ක්‍රිශාන්ත ප්‍රසාද් කුරේ මහතා, සී. රාමචන්ද්‍ර මහතා, අතුල සේනානායක මහතා

නිසි බලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රිශාන්ත ප්‍රසාද් කුරේ මහතා

සභාපති

දේශපාලන විද්‍යාව හා නීතිය පිළිබඳ විද්‍යාර්ථයෙක් වන කුරේ මහතා සංස්ථා අංශයේ වසර ගණනාවක අත්දැකීම් සහිට ජ්‍යෙෂ්ඨ වෘත්තීයවේදියෙකි. මිඩ්ලසෙක්ස් විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව හා නීතිය පිළිබඳ ශ්‍රාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය ලබාගැනීමෙන් පසුව ක්‍රිශාන්ත කුරේ මහතා ව්‍යාපාර සංවර්ධන ප්‍රධානී ලෙස ඊවඩ් පීරිස් සමූහයට එක්විය.

පොදු ලැයිස්තුගත සමාගමක් සතු වූ ප්‍රථම පූර්ණ ස්වාධීන ප්‍රකාශන ආයතය නිර්මාණය කිරීමට ක්‍රියාකළ ඒ මහතා සෙලින්කෝ සමූහය, ඊවඩ් පීරිස් සමූහය, සහ මහරාජා සංවිධානය ආදී ප්‍රමුඛපෙලේ නවෝත්‍පාදී සමාගම් කිහිපයක විධායක තනතුරු දරා ඇත. ඊවඩ් පීරිස් සමූහ සමාගමේ දී ඊවිර මීඩියා කෝපරේෂන් (පෞද්ගලික) සමාගම පිහිටුවීම සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ ක්‍රිශාන්ත මහතා එහි ආරම්භක අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් සේවය කළේය. ක්‍රිශාන්ත මහතාගේ මඟපෙන්වීම යටතේ එළිදැක්වූ ඊවිර හා නේෂන් ජාතික පුවත්පත් ස්වාධීන හා බොහෝ දෙනා කියවන පුවත්පත් වශයෙන් ඉතා ටේ කලෙකින් ජනප්‍රසාදය දිනාගත්තේය. මහරාජා සමූහ සමාග මේ උපදේශකයෙක් වශයෙන් ඒ මහතා එම සමාගමේ රූපවාහිණී හා ගුවන්විදුලි නාලිකා තුළ ප්‍රවෘත්ති විකාශ යථාවත් කිරීමටත්, එකී විකාශ අතර කෝවල විධායක සම්බන්ධීකරණය තහවුරු කිරීමටත් ක්‍රියාවලි හා මනා පරිචයන් ස්ථාපිත කිරීමට කටයුතු කළේය. මහජන සුභසිද්ධිය පිණිස පුළුල් පරාසයක විහිදුනු මාතෘකා රැසක් ඔස්සේ සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දිත්වයෙන්ම ජාතික පුවත්පත් වලට නිතර නිතර ලිපි සපයන ක්‍රිශාන්ත කුරේ මහතා දැනට සීෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් මෙන්ම ලේක්හවුස් යනුවෙන් සැවොම හඳුනන ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් ද කටයුතු කරයි.

ධීෂනා අමරසේකර මෙනවිය

අධ්‍යක්ෂ

ධීෂනා අමරසේකර මෙනවිය සම්මානලාභී බුටීක් හෝටලයක් වන තේවා රෙසිඩන්සි හෝටලයේ සහ සම්මානලාභී අවන්හලක් වන මහනුවර පිහිටි තේවා කුසීන් අවන්හලේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරයි. “ලොව සුබෝපභෝගී හෝටලය 2017 සම්මාන” දිනාගත් තේවා රෙසිඩන්සි හෝටලය පසුගිය අට වසර පුරා අඛණ්ඩව “සංචාරක උපදේශක විශිෂ්ඨ සේවා සම්මාන” ජයග්‍රාහකයෙක් ද, වශයෙන් පිදුම් ලද, අතර තේවා කුසීන් අවන්හල “ලොව සුබෝපභෝගී හෝටලය 2017 ජයග්‍රාහී සම්මාන” දිනාගනිමින් පසුගිය වසර දෙක තුළ අඛණ්ඩව “සංචාරක උපදේශක සේවා විශිෂ්ඨත්ව සම්මාන” ජයග්‍රාහකයෙක් වශයෙන් පිදුම ලැබීය. ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩීසී හී ඇමරිකන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය (අන්තර්ජාතික අලෙවිකරණය පිළිබඳ විශේෂඥතාව සහිතව) පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිකරගෙන සිටින අය ඇමරිකා එක්සත් ජනපදයේ හවායි විශ්වවිද්‍යාලයේ සංචාර කළමනාකරණය (හෝටල් කළමනාකරය පිළිබඳ විශේෂඥතාව සහිතව) පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ඇමරිකා එක්සත් ජනපදයේ හවායි නුවර කැපියෝලානි කොලීජියේ අවන්හල්, සංචාර හා සංචාරක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද හිමිකරගෙන සිටී. කොළඹ, ටාරු විලා, පාරක් ස්ට්‍රීට් හෝටලයේ නේවාසික කළමනාකාරිනී වශයෙන් ද, හිල්ටන් කළුබෝ හෝටලයේ ආහාර හා පාන සම්බන්ධීකාරක සහ මහජන සම්බන්ධතා විධායක වශයෙන් ද ඇය මීට පෙර සේවය කර ඇත.

අතුල සේනානායක මහතා

අධ්‍යක්ෂ

ඕස්ට්‍රියාවේ සැල්ස්බර්ග්හී ලෝක ප්‍රසිද්ධ හෝටල් කළමනාකරණ හා සංචාරක ආයතනයෙන් සිය වෘත්තීය අධ්‍යාපනය සම්මාන සාමාර්ථයක් ද, සමඟින් නිමකළ අතුල සේනානායක මහතා ආගන්තුක සත්කාර වෘත්තීයවේදියෙකි. එක්සත් රාජධානියේ හිලටන් ඉන්ටර්නැෂනල් ආයතනයේ සේවයට එක්වූ ඒ මහතා, පාරක් ලේන්, කෙන්සිංටන් සහ ස්ට්‍රැට්ෆෝඩ් - ඔපෝන් - ඇවෝන් හෝටල්වල වසර පහක් සේවයකර ප්‍රනීත ආහාර පාන කලාවේ මෙහෙයුම් දක්වා වෘත්තීය උසස්වීම් ලැබූවෙකි. ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමෙන් අනතුරුව ලංකා ඔබරොයි (දැන් සිනමන් ග්‍රෑන්ඩ්) හෝටලයේ සහකාර ආහාර හා පාන කළමනාකරු වශයෙන් සේවයට එක්වූ සේනානායක මහතා 1987 වර්ෂයේදී හිල්ටන් කළුබෝ හෝටලයේ සමාරම්භක කාර්ය මණ්ඩලයට එක්වෙමින් එහි ආහාර හා පාන කළමනාකරු තනතුරට පත් විය. හිල්ටන් හෝටලයේ සමාරම්භයට පූර්ව හා පශ්චාත් සංවිධාන කාර්යයන් හා සම්බන්ධව ඔහු කටයුතු කළ අතර හිල්ටන් හෝටලය නොබෝ දිනකින්ම කොළඹ අගනගරයේ ප්‍රමුඛතම හෝටලය බවට පත්විය.

ප්‍රනීත ආහාර පාන පිළිගැන්වීමේ විශේෂිත අවන්හල් මෙහෙයුම්, ස්ථානීය ආහාර පාන සැපයුම් හා සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සලසාදෙනු ලබන කෝටරින් සේවා ක්ෂේත්‍රයේ විශේෂඥයන් වන දොන් ස්ටැන්ලීස් සමූහය සාර්ථකව ආරම්භ කිරීම පිණිස 1991 වරුෂයේදී සේනානායක මහතා හිල්ටන් හෝටලයේ සේවයෙන් ඉවත් විය.

මෙම ක්ෂේත්‍රයේ වසර 40ක් පුරා දිවෙන සිය සේවා කාලය තුළ ලැබූ අත්දැකීම තුළින් අත්කරගත් ජාත්‍යන්තර හෝටල් දාම මෙහෙයුම්කරුවන් සමඟ කටයුතු කිරීම පිළිබඳව තීක්ෂණ ඥානයක් සහ ආහාර හා පාන පිළිගැන්වීමේ සේවා අංශය විශේෂකොට හෝටල් මෙහෙයුම් ක්ෂේත්‍රයේ සියලු අංශ පිළිබඳ මනා අවබෝධයක් සේනානායක මහතා සතුවේ.

ජේ.එම්.යූ.පී. ජයමහ මහතා

අධ්‍යක්ෂ

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන ජයමහ මහතා ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සහ මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකරණ සේවයේ නිලධාරියෙක් වන ඒ මහතා මූල්‍ය හා ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වසර 25කට ආසන්න සිය සේවා කාලය තුළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු රජයේ ප්‍රමුඛ ආයතන රැසක සේවය කර ඇති දක්ෂ නිලධාරියෙකි. කොළඹ විශ්වවිද්‍යාලයේ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන ජයමහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රධාරී සහතිකය ද හිමිකරගෙන සිටී. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ද ජයමහ මහතා ක්‍රියාකර ඇත.

සොනාලී ලියනමාන මෙනෙවිය

අධ්‍යක්ෂිකා

දේශීය මෙන්ම විදේශීය සමාගම්වල සේවය කරමින් වසර 25කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇති සොනාලී ලියනමාන්න මෙනෙවිය චාරිකා හා සංචාරක කර්මාන්තයේ ජ්‍යෙෂ්ඨ විශේෂඥ නිලධාරිනියකි. ලාභාලාභ ප්‍රකාශ, කාර්ය මණ්ඩල කළමනාකරය, අලාභ පාලනය, ගුවන්සේවා දිරි දීමනා සම්මුති සාකච්ඡා හා නිෂ්පාදන සංවර්ධනය ආදිය තුළින් කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ප්‍රශස්ථ කිරීම ඇතුළුව සමාගමේ ප්‍රතිපත්ති හා උපායමාර්ග රැසක් ඇය විසින් ක්‍රියාවට නංවා ඇත. නිෂ්පාදන සංවර්ධනය හා ජාත්‍යන්තර ගමනාන්ත අලෙවිකරණය, කණ්ඩායම් හි විනෝදාස්වාද පූර්ණ නිදහස් සංචාරක චාරිකා සැලසුම්කරණය පිළිබඳ විශේෂඥතාව ප්‍රගුණකොට ඇති සොනාලී ලියනමාන්න මෙනෙවිය මේ වන විට වර්ල්ඩ්ලින්ක් සමාගම් සමූහයේ සාමාජික සමාගමක් වන ඉන්ටර්ග්ලෝබ් ට්‍රැවල් (පෞද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස සේවය කරයි. තවද, ශ්‍රී ලංකාවේ ඉතාලි ව්‍යාපාරික සභාවේ උප-සභාපතිනිය ලෙස ද ඇය කටයුතු කරයි.

ටෙහානි මැතිව් මෙනෙවිය

අධ්‍යක්ෂිකා

එක්සත් ජනපදයේ නිව් යෝර්ක්හී කොලුම්බියා විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරිනියක් වන ටෙහානි මැතිව්ස් මෙනෙවිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යවහාරික මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය හිමි කර ගත්තාය. මොරටුව එක්ස්පෝ 80 පදනමේ (ට්‍රෝන් ප්‍රනාඳු පදනම) ප්‍රධාන භාරකාරිය වන ඇය, විෂන් පැසෙක්පිං (පෞද්ගලික) සමාගම, පැක්වෙල් ලංකා (පෞද්ගලික) සමාගම, සහ සීමාසහිත එල්පේඑම් පීරිස් සහ සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂිකාවක් ද වේ. 1990 - 1993 දක්වා ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශයේ සහ 2001 - 2004 දක්වා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකවල සභාපතිනිය වශයෙන් සේවය කළ ටෙහානි මෙනෙවිය 1996 - 2003 දක්වා කාන්තා පිහිට ආයතනයේ ස්වේච්ඡා උපදේශිකාවක් ලෙස ද ක්‍රියා කළාය. ශ්‍රී ලංකා ඇමරිකන් ඇලුම්නි ඇසෝසියේෂන්හි සාමාජිකාවක් වන ඇය ශ්‍රී ලංකා කාන්තා කාර්මාන්ත හා වාණිජ මණ්ඩයේ සාමාජිකාවක් ද වේ.

ශෙෂ්මින් මන්සූර් මහතා

අධ්‍යක්ෂ

එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයෙන් සැපයුම් දාම කළමනාකරණය සිය ප්‍රධාන විෂය ලෙස හදාරමින් විද්‍යාවේදී උපාධිය ලබාගත් මන්සූර් මහතාට උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් හිමිවූ අතර සුවිශේෂී අධ්‍යාපන ප්‍රතිඵල වෙනුවෙන් පිරිනැමුන ගෞරවනීය අංශාධිපති ලැයිස්තුවේ ඔහුගේ නම ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ ඇඟළුම් හා රෙදිපිළි කර්මාන්තය ඇතුළු විවිධ ක්ෂේත්‍ර ගණනාවක විහිදුණ කර්මාන්ත රැසකට සම්බන්ධවෙමින් වසර 19කට අධික පළපුරුද්දක් ලබා ඇති මන්සූර් මහතා එම ක්ෂේත්‍රයේ බලයලත් සන්නාම රැසක් බිහි කරමින් නිමි ඇඳුම් නිෂ්පාදනය කොට,අපනයනය කිරීමට කටයුතු කළේය. එක්සත් ජනපදයේ විවිධ සමාගම්වල සැපයුම් දාම හා ලොජිස්ටික් අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ ඔහු මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ඔහුගේම වූ සමාගමක් ස්ථාපිත කළේය. ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සංගමයේ සාමාජිකයෙක් වන මන්සූර් මහතා ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමයේ සාමාජිකයෙක් ද වේ.

නිසි බලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩලය

දිණුක් කොළඹගේ මහතා
අධ්‍යක්ෂ

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් ශ්‍රාස්ත්‍රවේදී උපාධිය හිමිකරගත් කොළඹගේ මහතා එම උපාධියේ ප්‍රධාන විෂයය ලෙස 20වන සියවසේ ඉතිහාසය තෝරාගත්තේය. 2009 වරෂයේදී සිය උපාධිය හිමිකරගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට පෙරළා පැමිණි ඒ මහතා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ කෙටි කලක් සේවය කොට, සන්ඩේ ලීඩර් පුවත්පතේ නියෝජ්‍ය ක්‍රීඩා පුවත් සංස්කාරක ලෙස සේවය කළේය. නියෝජ්‍ය ක්‍රීඩා පුවත් සංස්කාරක ලෙස සේවය කළ සමයේදී බංග්ලාදේශය, ශ්‍රී ලංකාව හා ඉන්දියාව විසින් සංවිධානය කරන ලද 2011 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය ආවරණය කිරීමට අවස්ථාව ඔහුට හිමිවිය. 2012 වරෂයේදී සන්ඩේ ලීඩර් පුවත්පතේ විශේෂාංග සංස්කාරක ලෙස පත්වීම් ලද කොළඹගේ මහතාට එම තනතුර දරමින් සිටින සමයේදී එක්සත් ජනපද ජනාධිපතිවරණ පැවති වකවානුව තුළ එක්සත් ජනපදයේ වාර්තාකරණ චාරිකාවට සහභාගිවීම සඳහා අවස්ථාව කොළඹ පිහිටි එක්සත් ජනපද තානාපති කාර්යාලයේ අනුග්‍රාහකත්වය මත හිමි විය. 2013 වරෂයේදී අල්ජසීරා පුවත් සේවයේ ශ්‍රී ලංකා වාර්තාකරු වශයෙන් කොළඹගේ මහතා පත්වීම් ලද අතර අල-ජසීරා ආයතනයේ සේවයේ යෙදී සිටින අතරතුර 2013 වසරේ ශ්‍රී ලංකාවේ පැවැත්වූ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල රාජ්‍ය නායක හමුවේ මාධ්‍ය ආවරණ කටයුතු අතුළු විශේෂ අවස්ථා රාශියක් ආවරණය කිරීමට ඔහුට අවස්ථාව උදාවිය. සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ වශයෙන්ද කොළඹගේ මහතා කටයුතු කරයි.

ප්‍රවීර් සමරසිංහ මහතා
අධ්‍යක්ෂ

කොළඹ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය හා හැවිලොක් සිටි ආදිය නිර්මාණය කළ ප්‍රමුඛපෙළේ දේපළ සංවර්ධන සමාගමක් වන ඕවරසීස් රියල්ටි (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ප්‍රවීර සමරසිංහ මහතා සේවය කරයි.

වසර 30ක වෘත්තීය හා වාණිජමය කටයුතු පිළිබඳ අත්දැකීම් ලබා ඇති ඔහු පොදු ලයිස්තුගත හා ලැයිස්තුගත නොවන සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කරයි. ලංකා වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වන ඔහු ලංකා සේවක සංගමයේ උප-සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි. ශ්‍රී ලංකා සභාධිපත්‍ය සංවර්ධකයන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා කර්මාන්තකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙක් වන ඒ මහතා වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ හිටපු සභාපතිවරයෙක් මෙන්ම CIMA ග්ලොබල් හී හිටපු පාලකසභා සාමාජිකයෙක් ද වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අධි සාමාජිකයෙක් වන සමරසිංහ මහතා ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරියෙකි.

සී. රාමචන්ද්‍ර මහතා
නිසි බලධාරි

ආසියා ඇසට් ඉනෑන්ස් පීඑල්සී සමාගමේ සභාපති වශයෙන් ද, යූබී ඉනෑන්ස් සමාගමේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ වශයෙන් ද, ක්‍රියාකරන සී. රාමචන්ද්‍ර මහතා, ගණකාධිකරණය, තේ අපනයනය, මූල්‍ය සේවා හා ඇසුරුම්කරණ ක්ෂේත්‍රවල වසර 40ක් ඉක්මවූ සේවා අත්දැකීම් ලබා ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ අධි සාමාජිකයෙක් වන රාමචන්ද්‍ර මහතා 1975 - 78 අතර කාලය තුළ හුළුගල්ල සමරසිංහ සහ සමාගමේ හවුල්කරුවෙක් ලෙස සේවය කර පසුව 1978 වර්ෂයේදී සීමාසහිත ලිප්ටන් සිලෝන් සමාගමට බැඳී, ලිප්ටන් යුකේ එක්සත් රාජධානියේ ප්‍රධාන කාර්යාලයේ මාස හයක් පමණ සේවය කර ප්‍රධාන ගණකාධිකාරී / සමාගම් ලේකම් තනතුරු දරමින් සිටියදී 1992 වර්ෂයේදී ලිප්ටන් සමාගමෙන් ඉවත් විය. පසුව ලංකා කොමර්ෂල් බැංකු අරමුදල් කළමනාකරණ සමාගමේ සාමාන්‍යාධිකාරී වශයෙන්ද, සීමාසහිත වර්ණා සමාගමේ මූල්‍ය කළමනාකාර / සමාගම් ලේකම් වශයෙන්ද, යුනිවොකර්ස් සමූහ සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වශයෙන්ද කටයුතු කළේය. 2005 - 2015 අතර කාලය තුළ සීමාසහිත යුනිවොකර්ස් පැකේජිං සමාගමේ විධායක අධ්‍යක්ෂ ලෙස ඔහු ක්‍රියා කළේය. සීමාසහිත සතොස සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ වශයෙන් ද, සීමාසහිත කැපිටල් ඊව් හොල්ඩිංග්ස් සමාගමේ, සීමාසහිත කැපිටල් ඊව් ක්‍රෙඩිට් සමාගමේ, සහ සීමාසහිත කැපිටල් ඊව් ලීසිං සමාගමේ (දැන් සොෆ්ට්ලොජික් ඉනෑන්ස්) ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් වශයෙන් ද, ක්‍රියාකර ඇත.

ධනුක සමරසිංහ මහතා
අධ්‍යක්ෂ

සිය අධ්‍යාපන කටයුතු නිමකිරීමෙන් පසුව ඕස්ට්‍රේලියාවේ සිට පෙරළා තම මව් රටට පැමිණි ධනුක සමරසිංහ මහතා සිය පවුලේ වැවිලි හා රබර් නිෂ්පාදන ව්‍යාපාරික කටයුතුවල නිරත විය. ඔහු විසින් පසුව ආරම්භකරන ලද සීමාසහිත ටීඒඩී හොල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගමේ සභාපතිවරයා ලෙස එම සමාගම ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන ඒකාබද්ධිත සමාගමක් බවට පත්කිරීමේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේය.

ටීඒඩී හොල්ඩිංග්ස් සමාගම මේ වන විට බලශක්ති, වැවිලි, දේපළ, ආගන්තුක සත්කාර, හා වෙළඳදාණ්ඩ තැරැව්කරණය ආදී ක්ෂේත්‍රවල සිය ව්‍යාපාරික කටයුතු සිදු කරයි.



වම් සිට දකුණට

වී. කනකසබාපති මහතා, ශමාහිල් මොහිදීන් මහතා, සුදර්ශන් ශ්‍රී රයන් මහතා, ජූඩ් වික්‍රමරත්න මහතා

කළමනාකාර කණ්ඩායම

වී. කනකසබාපති මහතා

එම්පිව් (හාවර්ඩ්), සිපිඑෆ්ඒ (ලන්ඩන්), එෆ්සිඒ, එෆ්පිඑෆ්ඒ, එෆ්සිඑම්ඒ, එෆ්එම්ඒඒටී

අධ්‍යක්ෂ මණ්ඩල උපදේශක

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල් වී. කනකසබාපති මහතා, දැනට ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ලෙස ද, යාපනය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙක් ලෙස ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ රාජ්‍ය අංශයේ ශාඛාව වන රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සභාපති ලෙස ද, රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස ද, ගණකාධිකාරීවරුන්ගේ දකුණු ආසියානු ෆෙඩරේෂණයේ රජයේ හා රාජ්‍ය අංශයේ ව්‍යවසාය ගණකාධිකරණ කමිටුවේ සමාජිකයෙක් ලෙස ද කටයුතු කරයි. රාජ්‍ය අංශයේ වසර 40කට අධික සේවා කාලයක් සම්පූර්ණකර ඇති කනකසබාපති මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකාරක වශයෙන් ද සේවය කළේය. හාවර්ඩ් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනපති උපාධිය හිමිකරගත් ඒ මහතා ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙක් ද වේ. කනකසබාපති මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ අධි සාමාජිකයෙක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ නිටපු සභාපතිවරයෙක් වන කනකසබාපති මහතා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ උපදේශකවරයෙක් ලෙස ද, මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය උපදේශකයෙක් ද විය. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ ඒ මහතා මහජන බැංකුවේ, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, සහ රාජ්‍ය අංශයේ ආයතන කිහිපයකම අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කළේය. ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමෙ අධ්‍යක්ෂ /මූල්‍ය උපදේශක වශයෙන් ද ඔහු ක්‍රියා කළේය.

ශමාහිල් මොහිදීන් මහතා

ඒසිඑම්ඒ - එක්සත් රාජධානිය

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

ශමාහිල් මොහිදීන් මහතා වර්ෂ 2013 පටන් ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වශයෙන් සේවය කරන අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (CIMA UK) සාමාජිකයෙකි. දේශීය හා විදේශීය ප්‍රමුඛපෙළේ ආයතන රැසක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරමින් වසර 20ක් ඉක්මවූ සේවා කාලයක් සම්පූර්ණකර ඇත. හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමට එක් වීමට පෙර එයිටිකන් ස්පෙන්ස් සමූහ සමාගමට අයත් එයිටිකන් ස්පෙන්ස් පවර් සමාගමේ අධ්‍යක්ෂ/උප-සභාපති වශයෙන් සේවය කළේය.

සුදර්ශන් ශ්‍රී රායන් මහතා

එමබීඒ, බීඑස්සී (ගෞරව), එෆ්සිසීඒ, ඒසිඑම්ඒ

ප්‍රධාන මූල්‍ය නිලධාරී

කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සහ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය හිමිකරගෙන සිටින සුදර්ශන් ශ්‍රී රායන් මහතා එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් මෙන්ම එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ. 1987 වර්ෂයේ දෙසැම්බර් මාසයේ පටන් ඒ මහතා අප සමාගමේ සේවයේ නියුතුව සිටී.

ජූඩ් වික්‍රමරත්න මහතා

ඒසිඑම්ඒ - යුකේ

ගණකාධිකාරී

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන ජූඩ් වික්‍රමරත්න මහතා දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය හදාරමින් සිටී. 2012 වර්ෂයේ දී අප සමාගමේ සේවයට එක්වූ ජූඩ් මහතා සතුව ගණකාධිකාරී ක්ෂේත්‍රයේ වසර 9ක සේවා පළපුරුද්දක් සපුරා ඇත.

කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය

"සමාලෝචිත වර්ෂය තුළ අදායම පෙර වර්ෂයට සාපේක්ෂව 20% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 3.02 ක් වූ අතර 2016 මසරේ රු. 1.2 වූ කාමර අදායම 2017 දී රු. බිලියන 1.32 දක්වා වර්ධනය වීම මෙන්ම ආහාරපාන පිළිගැන්වීමෙන් ලද රු.බිලියන 1.33 ක අදායම රු. බිලියන 1.64 දක්වා ඉහළයාම ඒ සඳහා ඉවහල් විය."



අප ගැන බිඳක්

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම (මෙම වාර්තාවේ මින්මතු 'සමාගම' යනුවෙන් හඳුන්වනු ලැබේ) ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර සේවා ව්‍යාපාරයේ නියැලී සිටී. හිල්ටන් කළුම්බෝ හෝටලයේ හිමිකාරත්වය දරන හා මෙහෙයුම් කටයුතු ඉටු කරනු ලබන අප සමාගම වර්ෂ 1983 දී සංස්ථාපනය කරන ලදී.

2017 වසරේ අපගේ ව්‍යාපාරික ප්‍රවේශය

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ දැක්ම, අරමුණු, ශක්තීන්, දුර්වලතා හා මෙහෙයුම් පරිසරය තුළ පැහැනගින අවස්ථාවන් හා බාධක වලට අනුගතව බහුවිධ ප්‍රමුඛ උපායමාර්ගික විධික්‍රම සමාගම විසින් ක්‍රියාවට නංවන ලදී. පිළිසකර කිරීම් සහ ප්‍රශස්ථ මානව සම්පත් පරිචයන් ක්‍රියාවට නැංවීම තුළින් සේවා තත්ත්වය අඛණ්ඩව විශිෂ්ටත්වයට පත් කර එමඟින් සමායතන සංචාරක ක්ෂේත්‍රයේ හිල්ටන් කළුම්බෝ හෝටලය දිනා සිටින ප්‍රමුඛ ස්ථානය අඛණ්ඩව පවත්වා ගැනීම හා එම තත්ත්වය තවදුරටත් ඉදිරියට ගෙනයාම පිණිස අප සතු පහසුකම් හා යටිතල පහසුකම් පුළුල් කිරීමටත්, විශිෂ්ටත්වයට පත්කිරීමටත් මෙකී උපායමාර්ග මඟින් අවධානය යොමු කරන ලදී. දේශීය සංචාරක ක්ෂේත්‍රය මෙන්ම නගරාශ්‍රිත හොටල් ක්ෂේත්‍රය රැස්වීම්, ද්විරාගැන්වීම්, සමුළු හා ප්‍රදර්ශන ආදිය ක්ෂේත්‍රකර ගනිමින් සංචාරකයන් කණ්ඩායම් වශයෙන් ගෙන්වා ගැනීම (MICE tourism) කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන බැවින්, මෙම ආයෝජනයන් මඟින් හෝටල් ක්ෂේත්‍රයේ අන් සැමට ඉදිරියෙන් සිටීමට අප සමාගමට උපකාරී වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. දේශීය ආර්ථිකය සහ ගෝලීය මෙන්ම දේශීය සංචාරක කර්මාන්තයේ පැවති තත්ත්වයන් විමසා බැලීම, 2017 මූල්‍ය වර්ෂයේ සමාගමේ කාර්සාධනය විශ්ලේෂණය කිරීමට කදිම පසුබිමක් සකසා දෙනු ඇත.

සාර්ව ආර්ථික වටපිටාව

දිවයිනේ බොහෝ ප්‍රදේශවල ඇතිවූ ස්වාභාවික විපත්වල අහිතකර බලපෑම හමුවේ 2017 වසර ආර්ථිකමය වශයෙන් ශ්‍රී ලංකාවට අතිශය අභියෝගාත්මක වසරක් වූ අතර ගෙවුණු වසර 16 තුළ ආර්ථික වර්ධන අනුපාතයේ වාර්තා වූ පහළම අගය වූ 3.1% ක් වාර්තා වූ බව 2017 වසරේදී එය පහළ ගියේය. දිගුකල් පැවති නියඟය හා පසුව ඇතිවූ ජලගැලීම් ආර්ථික වර්ධනය කෙරෙහි මෙන්ම විදේශීය අංශය කෙරෙහි ද දැඩි බලපෑමක් එල්ල කළ අතර උද්ධමනය 6.6% දක්වා ඉහළ ගියේය. කෙසේවුවද, පොළී පිරිවැයෙහි සිදුවූ කැපී පෙනෙන වර්ධනය සමස්ත අයවැය හිඟය සුළු වශයෙන් ඉහළ යාමට බලපෑ අතර ප්‍රාථමික අතිරික්තය හා සාපේක්ෂ වශයෙන් පහළ අගයක් ගත් විනිමය අවප්‍රමාණය හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ රාජ්‍ය ණය අනුපාතය පහළ ගියේය. තවද, වර්ෂය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල 2% කින් අවප්‍රමාණ විය.

ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ත්‍රිත්වය (කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා) අතර දළ දේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වය සපයන (55.8%) සේවා අංශය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂය තුළ 3.2% ක සාධනීය වර්ධන අනුපාතයක් වාර්තා කළේය.

අනාගතය දෙස නෙත් යොමු කිරීමේ දී, 2018 දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පහළ අගයක සිට ක්‍රමිකව ඉහළ යනු ඇති බවටත්, පුද්ගල පරිභෝජනය හා ආයෝජන තුළින් වසර මැද දී 4.5% දක්වා ඉහළයනු ඇති බවටත් පුරෝකථනය කර ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික පෙර දැක්ම වාසිදායක ස්වරූපයෙන් තවදුරටත් පවතින නමුත්, ඒ සඳහා තරගකාරීත්වය වර්ධනය කිරීම, යහපාලනය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සිය ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය රජය විසින් ක්‍රියාවට නැංවිය යුතු වේ. තවද, ප්‍රජාතන්ත්‍රවාදය හා සංහිඳියාව, අන්තර්කරණ හා සාධාරණ සංවර්ධනය ශක්තිමත් කිරීම සහ යහ පාලනය තහවුරු කිරීම සඳහා රජය විසින් සිය 'දැක්ම 2025' පසුගිය වසර අවසන් භාගයේ දී එළිදක්වන ලදී.

ගෝලීය සංචාරක කර්මාන්තයේ කාර්යසාධනය

සමස්තයක් ලෙස බැලීමේදී, ගෝලීය සංචාරක කර්මාන්තය 2017 වසරේ ශක්තිමත් ලෙස වර්ධනය වූ අතර, ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛතම එලවුම් සාධකයක් ලෙස සංචාරක කර්මාන්තය සිය ස්ථානය තහවුරු කර ගන්නා ලදී. පසුගිය දශකයක පමණ කාලයක සිට රැස්කරගත් ඉහළ වර්ධන වේගය මත ගොඩනැගෙමින්, අන්තර්ජාතික සංචාරක කර්මාන්තය ගෙවුණු වසර හත තුළ වාර්තා කළ ඉහළම සංචාරකයන්ගේ පැමිණීමේ අගය 2017 වසරේදී වාර්තා විය. 2017 වසරේ එසේ පැමිණි සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 7%කින් වර්ධනය වෙමින් මිලියන 1,322ක් විය.

එහි සැලකිය යුතු කරුණක් වන්නේ 2017 දී ආසියා ශාන්තිකර කලාපයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 6%ක වර්ධනයක් පෙන්වමින් මිලියන 324ක් ලෙස වාර්තා වීමයි. දකුණු ආසියාවෙන් පැමිණි සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 10%කින් වර්ධනය වූ අතර නිරිතදිග ආසියාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 08%කින් ද, අග්නිදිග ආසියාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 03%කින් ද වර්ධනය විය.

ජාත්‍යන්තර වශයෙන් ගත් කල, චීන සංචාරකයන් ඉහළම වියදම් දරන්නන් ලෙස තවදුරටත් රැඳී සිටි අතර සංචාරක කර්මාන්තය සඳහා ඔවුන්ගේ දායකත්වය එ.ජ. ඩොලර් බිලියන 258ක් විය. එය පෙර වසරට සාපේක්ෂව 5%ක වර්ධනයක් වූ අතර වැඩිම වියදම් දරන්නන් අතර දෙවන ස්ථානයට පත්

කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය

ඇමරිකානු සංචාරකයන් වැය කළ මුදල එ.ජ. ඩොලර් බිලියන 135 ක් විය. එය පෙර වසරට සාපේක්ෂව 09%ක වර්ධනයකි. ජර්මාණු සංචාරකයන් එ.ජ. ඩොලර් බිලියන 84ක් වැය කරමින් ඊට දායක වූ අතර බ්‍රිතාන්‍ය සංචාරකයන් එ.ජ. ඩොලර් බිලියන 63කින් දායක විය. එම දෙරටටම වැය කිරීම් පෙර වසරට සාපේක්ෂව 03%කින් වර්ධනය විය. එසේම, ප්‍රංශ සංචාරකයන්ගේ වැයකිරීම් 1%ක වර්ධනයක් පෙන්වමින් එ.ජ. ඩොලර් බිලියන 41ක් විය.

ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ සැලකිය යුතු සංවර්ධනයන් අතර රැස්වීම්, දිරිදීමනා, සමුළු හා ප්‍රදර්ශන කෝෂ්ඨාගාර ගනිමින් කණ්ඩායම් වශයෙන් පැමිණෙන සංචාරකයන්ගෙන් ඉදිරිපත් වන ඉහළයමින් පවතින ආකර්ෂණීය ඉල්ලුම සමඟ බද්ධ වූ තිරසර සංචාරක කර්මාන්තය පිළිබඳ අවධානය ඉහළ යෑම විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. සංචාරක ආකර්ෂණය දිනාගැනීමේ අංගයක් ලෙස, සමාජ ක්‍රියාකාරකම් හා සමාජ වගකීම් ඉස්මතුකර දක්වමින් කණ්ඩායම් වශයෙන් සංචාරකයන් ගෙන්වා ගැනීමට නොයෙක් ආර්පණ ලබා දීම කැපී පෙනෙන ලෙස වර්ධනය වීමක් මෙම වසරේ දක්නට ලැබුණි. රැස්වීම්, දිරිදීමනා, සමුළු හා ප්‍රදර්ශන සඳහා පැමිණෙන සංචාරකයෝ සිය ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සිදුකළ සංචාරය අතරතුර ගුණාත්මක බවින් ඉහළ සුන්දර විවේකයක් ගත කිරීමේ අපේක්ෂාවෙන් පසුවෙති. ඉන් අදහස් වන්නේ සංචාරක කර්මාන්තයේ මෙම ලාභදායී සුපිරි අංශයේ උපරිම ඵල නෙලාගැනීම පිණිස එවැනි සංචාර සංවිධායකයන් නගර පරිපාලකයන්, දේශීය සංචාරක බලධාරීන් සහ ප්‍රජා සංවිධාන ආදී පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු බවයි. මෙහි ඇති විවිධත්වයෙන් පිරි සංචාරක ආකර්ෂණයන් එකී කණ්ඩායම් සංචාර සඳහා ශ්‍රී ලංකාව තෝතැන්නක් බව පසක් කරයි.

පුළුල් වන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක හා ආගන්තුක සත්කාර සේවා කර්මාන්තය ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, සංචාරකයන්ගේ පැමිණීම 2016 වාර්තා වූ මිලියන 2.05 ඉක්මවමින් මිලියන 2.12ක් දක්වා වර්ධනය විය. මෙකී ශක්තිමත් වර්ධනයන් සඳහා හෝටල් කාමර ධාරිතාව හා සෙසු අනුපූරක සංචාරක සේවා සැලකිය යුතු ලෙස පුළුල් කිරීම අරමුණු කරගත් සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් කැපී පෙනෙන ලෙසත් අබණ්ඩවත් සංවර්ධනය කිරීම බෙහෙවින් ඉවහල් විය.

සංචාරකයන් පැමිණෙන රටවල් පිළිබඳව සලකා බැලීමේදී, ඉන්දියාව සංචාරකයන් වැඩිම පිරිසක් පැමිණෙන රට වශයෙන් තවදුරටත් පසුවූ අතර 2017 දී පැමිණි සංඛ්‍යාව 384,628 ක් දක්වා ඉහළ ගොස් පෙර වර්ෂයට සාපේක්ෂව 8%ක වර්ධනයක් පෙන්වීය. එහි දෙවන ස්ථානයේ රැඳී සිටින චීනයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 268,952ක් වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව 1%ක පහළයාමක් දක්නට ලැබුණි.

එක්සත් රාජධානියෙන් පැමිණි සංචාරකවන්ගේ සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 7%ක වර්ධනයක් පෙන්වමින් ලෙස වාර්තා වූ අතර ජර්මණියෙන් පැමිණි සංචාරකවන්ගේ සංඛ්‍යාව130,227කි. එය පෙර වර්ෂයට සාපේක්ෂව 2% පහළ යාමකි. මෙම වර්ෂයේ සාපේක්ෂ වශයෙන් අවලව පැවති ප්‍රංශයෙන් හා ඕස්ට්‍රේලියාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යා 97,282 සහ 81,281වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව පිලිවෙලින් 1%ක සහ 9%ක වර්ධනයක් පෙන් විය.

2017 වසරේ සංචාරකයන්ගේ පැමිණීමේ තවත් එක් කැපී පෙනෙන ප්‍රවනතාවක් වන්නේ, මාලදිවයිනෙන් පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 17%ක පහළ යාමක් වර්තා කරමින් 79,371ක් ලෙස වාර්තා වීමත්, නෙදර්ලන්තයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව වර්ෂයේ ඉහළම වර්ධන අනුපාතය වාර්තා කරමින් පෙර වර්ෂයට සාපේක්ෂව 24%කින් ඉහළ ගොස් 51,18ක් වීමත් ය.

සමාලෝචිත වර්ෂය තුළ සංචාරකයන්ගේ පැමිණීමේ තවත් එක් කැපී පෙනෙන ප්‍රවනතාවක් වූයේ ලතින් ඇමරිකානු රටවලින් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 15%ක සීඝ්‍ර වර්ධනයක් පෙන්වමින් 6,482 දක්වා ඉහළයාමයි. එසේම, ඕස්ට්‍රේලේසියාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව ද 10%ක වර්ධනයක් පෙන්වමින් 92,003 දක්වා ඉහළ ගියේය. මැදපෙරදිග පැවති අස්ථාවර වාතාවරණය එම කලාපයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 11%ක පසුබෑමකට ලක්වෙමින් 95,581 දක්වා පහළයාම මඟින් පිළිබිඹු වූ නමුත් එම කලාපයෙන් බැහැරවූ අනෙකුත් කලාපයන්හී සංචාරකයන්ගේ පැමිණීමේ මට්ටම් සමස්ථයක් ලෙස ස්ථාවරව පවතුණි.

2017 වර්ෂයේ සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණීමේ අරමුණ විමසා බැලීමේදී බහුතරයක් සංචාරකයන් (83.9%) පැමිණ ඇත්තේ විවේකය ලබා ගැනීම පිණිස බව පෙනීයන අතර ව්‍යාපාරික කාර්යයන් සඳහා පැමිණි සංචාරකයන්ගේ ප්‍රතිශතය 2.9%ක් ද, මිතුරන් හා ඥාතීන් හමුවීම, ආගමික හා සංස්කෘතික කාරණා, සෞඛ්‍යය, අධ්‍යාපන හා ක්‍රීඩා ආදී වෙනත් කාර්යයන් සඳහා පැමිණි සංචාරකයන්ගේ ප්‍රතිශතය 13.2%ක් ද විය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද නවතම වාර්ෂික සංගණනයට අනුව, සංචාරකයෙකුගේ දිනක සාමාන්‍ය වැය කිරීම් 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 168.2ක සිට 2017 වර්ෂය තුළ එ.ජ. ඩොලර් 170.1ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, 2016 දී සංචාරකයෙක් දිවයිනේ නැවතී සිටිනැයි ඇස්තමේන්තුගත සාමාන්‍ය කාල පරිච්ඡේදය වූ දින 10.2ක හා සැසඳීමේදී 2017 වසරේදී එය 10.9 ක් විය.

ඉදිරි වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇතැයි අපේක්ෂිත සමස්ත සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 2.78ක් වනු ඇති අතර, පැමිණෙන සංඛ්‍යාවන්හි ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන නමුත්, පෙර වර්ෂයේ මෙම වකවානුව තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද ශ්‍රේණිගත හෝටල් කාමරවල වාසය කිරීමේ අනුපාතය 2016 වසරේ පැවති 74.8% ක ප්‍රතිශතය හා සැසඳීමේදී 2017 දී 73.3% දක්වා සුළු වශයෙන් පහළගිය බව සැලකිල්ලට ගතයුතු කරුණකි. ශ්‍රී ලංකාවේ නොවිධිමත් සංචාරක අංශයේ ශ්‍රේණිගත නොවූ කාමරවල වාසය කිරීම් නිල ගණන් ගැනීම් වලට ඇතුළත් නොවන බැවින් එසේ නොවිධිමත් සංචාරක අංශය අබණ්ඩව ඉදිරියට පැමිණීම, පෙරකී ශ්‍රේණිගත හෝටල් කාමරවල වාසය කිරීමේ අනුපාතයේ පහළයාම සම්බන්ධයෙන් යම් බලපෑමක් සිදුකර ඇතැයි විශ්වාස කෙරේ.

මේ සම්බන්ධයෙන් සලකා බැලීමේදී, සංචාරක කර්මාන්තයේ සමස්ත කාර්යසාධනය පිළිබඳව උනන්දුකරවන සුළු ඉඟි පළකරමින් සමාලෝචිත වර්ෂයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ඉපැයීම් කාර්යසාධනය පෙර වසරට සාපේක්ෂව 3.2% ක ඉහළයාමක් පෙන්වමින් එ.ජ. ඩොලර් බිලියන 3.6ක් දක්වා වර්ධනය වූ අතර එමඟින් ශ්‍රී ලංකාවේ තෙවැනි විශාලතම ආදායම් උපයන්නා ලෙස සිය ස්ථාවරය පවත්වා ගැනීමටත්, විදේශ විනිමය ඉපැයීම් වලින් 14.2% කින් ජාතික ආර්ථිකයට දායකවීමටත් හැකි විය.

වසර 2020 දී ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් මිලියන 4.5කට අවශ්‍ය පහසුකම් සලසාදීම පිණිස හෝටල් කාමර 75,000ක් ස්ථාපිත කිරීමේ රජයේ ඉලක්කය සාක්ෂාත් කරගැනීම උදෙසා සංචාරක කර්මාන්තය ප්‍රශංසනීය ප්‍රගතියක් අබණ්ඩව අත්කරගනිමින් සිටින මෙවන් අවස්ථාවක සංචාරක කර්මාන්තයේ අවධානය යොමුවිය යුතු එක් වැදගත් කරුණක් වන්නේ, පවත්නා ඉල්ලුමට සාපේක්ෂව පුහුණු වෘත්තීයවේදීන් සංචාරක කර්මාන්තයේ සේවයට

එක්වීමේ පවතින ඌණතාවයි. දේශීය වශයෙන් ධාරිතා වර්ධන පුහුණු අවස්ථා ඉහළ යමින් පවතින නමුත්, හෝටල් කර්මාන්තයේ නියැළි ජාත්‍යන්තර සමාගම් වැඩි වශයෙන් සිය ව්‍යාපාරික මෙහෙයුම් අප රටතුළ ස්ථාපිත කිරීමට කටයුතු කිරීමත් සමඟ ඉදිරි කෙටි හා මැදි කාලීනව එකී සේවක හිඟය වඩාත් උග්‍රවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ ඵලදායී අංශවලට ශ්‍රමිකයන් යොමු කිරීමේ අරමුණින් රටේ ශ්‍රම බලකාය උචිත ආකාරයෙන් සංයුක්තකරණයට ලක් කිරීම පිණිස ප්‍රමාණවත් ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම අවශ්‍ය වේ.

මෙහෙයුම් සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ හෝටලයේ අලුත්වැඩියා කටයුතුවල පළමු අදියරේ අවසානය කරා ලඟාවීම හොටලය අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි. දෙසැම්බර් මස එළඹෙන කාර්යබහුල සංචාරක සමයට පෙර 2017 වසරේ අගෝස්තු මාසයේදී සැලසුම්කළ පරිදි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට හැකිවූ හෝටලයේ ආලින්දය හා පොදු ස්ථාන පිළිසකර කිරීම පිළිබඳව වර්ෂය තුළ සිදු කළ අලුත්වැඩියා කටයුතුවල අවධානය යොමු විය. ශ්‍රී ලංකාවේ පොහොසත් පාරිසරික උරුමය කැටිවූ අද්විතීය බවින් අනූන දේශීය අංගෝපාංග සමඟ ජාත්‍යන්තර මොස්තර මුසු කිරීමත්, හිල්ටන් කළමිබෝ සන්නාමය හා බද්ධ වූ ව්‍යක්ත හා සුබෝපභෝගී ආගන්තුක සත්කාර සැලසීමේ විශිෂ්ට සේවාව සමඟ එකී අංගෝපාංග සම්මිශ්‍රණය කිරීමත් මෙකී අලුත්වැඩියා මඟින් මූලිකව අරමුණු කරන ලදී.

කොළඹ නගරාශ්‍රිත හෝටල් අංශය විශේෂකොට, දේශීය සංචාරක කර්මාන්තයේ පවතින තරඟය සීඝ්‍රයෙන් උත්සන්න වෙමින් පැවතීම පිළිබඳ මනා



අවබෝධයෙන් පසුවන හිල්ටන් කළමිබෝ හෝටලයේ කළමනාකාරිත්වය, හිල්ටන් කළමිබෝ හෝටලයේ ප්‍රධාන පොදු ස්ථානවල පුළුල් අලුත්වැඩියාවන් ආරම්භ කිරීමට ප්‍රගතිශීලී පියවර රැසක් ගෙන තිබුණි. හෝටල් ක්ෂේත්‍රයට අලුතින් ඇතුළුවන්නන් සමඟ සාර්ථකව තරඟ කිරීමටත්, හිල්ටන් කළමිබෝ හෝටලය අබණ්ඩව ප්‍රමුඛත්වය රැකගෙන සිටින, ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින රැස්වීම්, දිරිගැන්වීම්, සමුළු හා ප්‍රදර්ශන සඳහා කණ්ඩායම් වශයෙන් පැමිණෙන සංචාරකයන් වෙනුවෙන් සේවා සැලසීමේ අංශය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් එළඹෙන ඉදිරි වර්ෂවලදී ද ස්වකීය අද්විතීය සන්නාම ප්‍රතිරූපය එලෙසින්ම රැක ගැනීමටත් හිල්ටන් කළමිබෝ හෝටලය සතු හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් මෙකී මූලාරම්භනයන් ගෙන තිබුණි.



දේශීය මෙන්ම ජාත්‍යන්තර රැස්වීම්, සමුළු හා ප්‍රදර්ශන ආදීය පැවැත්වීම සඳහා ප්‍රමුඛව තෝරාගනු ලබන හෝටලය වශයෙන් සිය ස්ථානය ආරක්ෂාකර ගැනීමට හෝටලයට හැකිවීම මෙහිලා සඳහන් කළයුතු කරුණකි. දිවයිනේ වාණිජ අගනගරය අබණ්ඩව සංවර්ධනයේ පෙරටම ගමන් කරමින් පවතින අතර විශේෂයෙන් කොළඹ නගරයේ පිහිටි හෝටල් සංයුක්ත සංචාරක අංශයේ විශාල කොටසක ආකර්ෂණය දිනාගැනීම පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ක්‍රියා කරන වාතාවරණයක් තුළ එවැනි උත්සව අවස්ථා සඳහා සත්කාරකත්වය ලබාදීමට හිල්ටන් කළමිබෝ හෝටලය සතු හැකියාව තවදුරටත් වර්ධනය කිරීම පිණිස කරන ලද ආයෝජන මඟින් හෝටලයේ ආදායම් උත්පාදන ධාරිතාව තව තවත් ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු පරිදි දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කාලීන අලෙවිකරණ වැඩසටහන් සමඟ ඒකාබද්ධ වූ හිල්ටන් ඔනර්ස් ලොයල්ටි වැඩසටහන අප සමාගමේ තවත් එක් වැදගත් එමෙන්ම ශක්තිමත් ආදායම් උත්පාදන මාර්ගයක් වන අතර ලොව පුරා විහිදුණු හිල්ටන් සන්නාමය කෙරෙහි විශ්වාසවන්ත සේවාලාභීන් අබණ්ඩව හිල්ටන් හෝටල් කරා ආකර්ෂණය කරගැනීමට සහ අද්විතීය වටිනාකම් අර්පණය හා ලොව පතළ හිල්ටන් සන්නාමය හා ප්‍රතිරූපයට අනුගතව ක්‍රියාකිරීමට හිල්ටන් කළමිබෝ හෝටලයට සහායවෙමින් ආදායම් ඉහළ නංවා ගැනීමට එම වැඩසටහන බෙහෙවින් ඉවහල් විය.

සුවිශේෂ සිදුවීම් බහුල වසරක්

සුබෝපභෝගී හා අතිවිශිෂ්ට ආගන්තුක සත්කාර සේවාව පිළිබඳ හිල්ටන් කළමිබෝ හෝටලය සතු අද්විතීය කීර්තිනාමය තුළින් දිවයිනේ ආයතන

කළමනාකරණ සමාලෝචනය



ක්ෂේත්‍රයේ විවිධ උත්සව අවස්ථා හා ජන ජීවිතයේ නානාවිධ සොඳුරු අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීමට නිතැතින් තෝරාගන්නා හෝටලය ලෙස අප දිදුලන ස්ථාවරය වර්ෂය පුරා අබණ්ඩව රඳවා ගැනීමට සමත් වුනෙමු.

දේශීය හා ජාත්‍යන්තර සංස්කෘතිකමය වැදගත්කමක් සහිත උත්සව සහ විශේෂ උත්සව සමයන් සමරනු වස් අප හොටලයේදී පවත්වන ලද විවිධවූත්, අද්විතීයවූත්, උත්සව සඳහා එකී විශේෂාංග අලංකාරය එක් කළේය. හෝටලයට සංචරකයන් බහුලව පැමිණීම දෙසැම්බර් මාසයේ පවත්වන ලද උළුවප් උත්සව සමයට සමගමීව සංවිධානය කරන ලද එකී උත්සව මාලාවකින් එහි කූටප්‍රාප්තිය සනිටුහන් විය. හිල්ටන් කළමිබෝ හෝටලය සතු අද්විතිය හොජනාගාර ත්‍රිත්වය තුළින් පිළිගන්වන රසපිරි විවිධ විචිත්‍ර ආහාර පාන මගින් අප හෝටලයේ වටිනාකම් ප්‍රස්තුතය තව තවත් ශක්තිමත් කරන ලදී. අප හෝටලයේ ඔබ වෙනුවෙන් විවෘතකර ඇති ඔබගේ කැමැත්ත පරිදි ඔබට තෝරාගත හැකි හෝජනාගාර තුනක් වේ. 'ද කැරිලිග්' හෝජනාගාරයේදී බොහෝ දෙනා ප්‍රියකරන තරු පන්තියේ අව්‍යාජ ශ්‍රී ලාංකීය ආහාර වර්ග පිළිගැන්වෙන අතර අපගේ අමුත්තන්ගේ රුචිය හා මනාපයට ගැලපෙන පරිදි ඔවුන් විසින්ම තෝරා ගන්නා මත්ස්‍ය ආහාර වර්ග ඔවුන්ට රිසිසේ පිළියෙල කරවා ගැනීමට මෙහිදී අවස්ථාව ලබා දී ඇත. 'ග්‍රේස් කිචන්' හිල්ටන් කළමිබෝ හෝටලයට ඉතා මැතකදී එක් කරන ලද විශේෂාංගයක් වන මෙම හෝජනාගාරය ශ්‍රී ලාංකීය ආහාර වර්ග වලට අමතරව ඉන්දියානු, චීන, ජපන්, ඉතාලියානු, මධ්‍යධරණී හා තායී විශේෂ ආහාර වර්ග ආදියෙන් සැදුම්ලත් නානාවිධ ආහාර වර්ග ඒ මොහොතේදීම සාදවා ගැනීමට පහසුකම් සලසා ඇති සුවිශේෂී හෝජනාගාරයක් වන මෙහිදී ආහාර ගැනීමේ අශ්වාදජනක අපූරු අත්දැකීමක් විඳගත හැකිය.

'ඉල් පොන්ටේ' හෝජනාගාරය හෝටලයේ පිහිනුම් තටාකය මැනවින් දර්ශනය වන පරිදි සැකසූ සරල හා නිස්කලංක වටපිටාවක හිඳ නිවසේ සෑදු පැස්ටා සහ දර පෝරණුවේ පිසූ පිටිසා ආදී ඉතාලියානු විශේෂිත ආහාර රැසක් අතරින් මනාපය පරිදි තෝරා ගත හැකි ඉතාලි ආහාර රුචි කරන්නන් සඳහාම වෙන්වූ විශේෂිත හෝජනාගාරයකි.

මෙකී හෝජනාගාර හෝටලයේ අතිශයෙන් ජනප්‍රිය අංගවයන් වන බාරය හා ලෝංග් ඇෆෝඩ් බාර් ආදියෙන් අංගසම්පූර්ණ වී ඇති අතර හෝටලයේ චිත්තාකර්ශනීය නෙළුම් පොකුණ ඉදිරියෙන් පෙනෙන පරිදි සංගෘහිත නාගරික උද්‍යානයක් අනුසාරයෙන් ඉතා අලංකාර ලෙස ප්‍රතිනිර්මාණය කරන ලද හෝජනාගාර හෝටලය ඇතුළත පිහිටි පරිපූර්ණ සමාජ හා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් බවට පත්වී ඇත.

මූල්‍ය සමාලෝචනය

සමලෝචිත වර්ෂය තුල ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරණ ලැබුවද, අපගේ ව්‍යාපාරික කටයුතු වල සියලු ප්‍රධාන අංශයන් හී ප්‍රගතිශීලි මූල්‍ය කාර්යය සාදනයක් අත්කර ගැනීමට අප සමාගමට හැකි විය. එතකුදු උවත් වසර පුරාම විවේකය සොයා පැමිණි සංචාරකයන් මඟින් සමාගමට වාසි අත් විය.

ආදායම

සමාලෝචිත වර්ෂය තුළ අදායම පෙර වර්ෂයට සපේක්ෂව 20% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 3.02 ක් වූ අතර ඒ සඳහා 2016 වසරේ රු. 1.2 වූ කාමර අදායම 2017 දී රු. බිලියන 1.32 දක්වා වර්ධනය වීම හේතු සාධක විය. හෝටලයේ විවිධත්වයෙන් පිරි හෝජනාගාර අප අමුත්තන්ගේ ආකර්ශනය දිනා ගැනීමට සමත් වූ අතර පෙර වර්ෂයේ ආහාර හා පාන පිළිගැන්වීමෙන් ලද රු. බිලියන 1.33 ක අදායම රු.බිලියන 1.64 දක්වා ඉහළ ගියේය. ඒ පරිද්දෙන් අනෙකුත් මෙහෙයුම් අදායම් 2016 දී වර්තා කළ රු. මිලියන 58.2 සිට රු. මිලියන 63.1 දක්වා ඉහළ ගියේය.

2017 වර්ෂයේ ශක්තිමත් ඉහළ පෙළ කාර්යසාධනය දළ ලාභය රුපියල් බිලියන 2.5ක් දක්වා වර්ධනය වීමට මහෝපකාරී වූ අතර ප්‍රතිසංස්කරණය කරන ලද වත්කම් ප්‍රාගධනීකරයණය මඟින් සිදුවූ අතිරේක අවප්‍රමාණවීමේ (රු. මිලියන 100) ප්‍රතිඵලයක් ලෙස බදු පෙර ලාභය රු. මිලියන 173ක් ලෙස ස්ථාවරව පැවතුණි.

බදු ගෙවූ පසු ලාභය

පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 141 හා සැසඳීමේදී 2017 වර්ෂ අවසානයේදී බදු ගෙවූ පසු ලාභය රු. මිලියන 258 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වීමක් නිරීක්ෂණය කරන ලදී.

කොටස්හිමිකරුවන් සඳහා අගය නිර්මාණය කිරීම

2016 දී වාර්තා වූ කොටසක ඉපැයීම් රු. 0.07 ක සිට සමාලෝචිත වර්ෂ අවසානයේදී රු. 0.13 ක් දක්වා වර්ධනය විය.

ඉදිරි දැක්ම

ද්වයිනේ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සන්නාමය වශයෙන් හිල්ටන් කළමිබෝ හෝටලයට සිය වෙළඳපල පංගුව තිරසරව පවත්වා ගැනීමටත් වර්ධනය කරගැනීමටත් සාර්ථකව නිමකළ පෙරකී අලුත්වැඩියා කටයුතු ඉවහල් විය. එළඹෙන ඉදිරි මූල්‍ය වර්ෂය තුළ ඉස්මතුවන අවස්ථා ග්‍රහණයකර ගැනීම පිණිස හිල්ටන් ජාත්‍යන්තර සන්නාමය දිනා සිටින කීර්තිනාමය හා පිළිගැනීම, එහි අසමසම සේවා තත්ත්වය සහ එහි නිකඳෙළුල් තත්ත්ව ප්‍රතිඥය මත විශ්වාසය තබා කටයුතු කිරීමට නව පනක් ලද හිල්ටන් කළමිබෝ හෝටලයට හැකියාව උදාවී ඇත.

හෝටලයේ දෙවන අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සමාගම සූදානම් වෙමින් සිටින අතර 2018 වසරේ නෙවැනි කාර්තුවේ ආරම්භ කිරීමට නියමිත එම අලුත් වැඩියා මඟින් හෝටලයේ හෝජනාගාර, බෝල්රූම් ශාලා සහ අමුත්තන්ගේ කාමර තවදුරටත් වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ඇත.

පුරෝකථනය කළ ආර්ථිකයේ සුභවාදී වර්ධනය හා විවේකය පතා සහ ව්‍යාපාරික කටයුතු සඳහා මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාවේ වර්ධනය කොළඹ නගර මධ්‍යයේ පිහිටි හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් ආශ්වාදජනක ඉදිරි වසරක් පෙන්නුම් කෙරේ.

සංයුක්ත පාලනය

කොළඹ කොටස් හුවමාරුවේ සංයුක්ත පාලන රීති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සංයුක්ත පාලනය පිළිබඳ මනා පරිචය සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව සංයුක්ත පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීම මෙන්ම එසේ පවත්වා ගැනීමේ වගකීම හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. සිය සමස්ත කාර්යයන් හීදී, ව්‍යාපාරික අවංකභාවය, ආචාරධර්ම, විනිවිදභාවය හා වෘත්තීයවේදීභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමේ සමාගම සතු වගකීම නොපිරිහෙළා ඉටු කරනු ලබන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ව්‍යවසායකත්ව නායකත්වය ගෙන ක්‍රියාකරන අතර සමාගමේ කොටස් හිමියන් සම්බන්ධයෙන් සමාගම සතු වගකීම් ඉටුකිරීමට සමාගමට හැකිවන පරිදි සංයුක්ත උපාය මාර්ගික ඉලක්ක, හරයන් හා ප්‍රමිති සකස්කිරීම සහ කාර්යසාධන සමාලෝචනය ආදී කාර්යභාරයන් ද අධ්‍යක්ෂ මණ්ඩලය ඉටු කරයි. 2017 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය:

ක්‍රිශාන්ත ප්‍රසාද් කුරේ මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ධීෂනා එස්. අමරසේකර මෙනවිය	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
පේ.එම්.යූ.පී. ජයමහ මහතා	-	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ
අතුල සේනානායක මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ටෙහානි එස්.ඒ. මැතිව්ස් මෙනවිය	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
දිණුක් කොළඹගේ මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ශෙෂ්මින් මන්සූර් මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
සොනාලි ලියනමාන මෙනවිය	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් නවයක් (09) පැවැත්වූ අතර එම රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
කේ.පී. කුරේ මහතා (2016.04.08 දින සිට පත් කරන ලදී)	09
ඩී.එස්. අමරසේකර මෙනවිය (2015.04.07 දින සිට පත් කරන ලදී)	07
පේ.එම්.යූ.පී. ජයමහ මහතා (2016.03.01 දින සිට පත් කරන ලදී)	09
ඒ. සේනානායක මහතා (2016.04.08 දින සිට පත් කරන ලදී)	08
ටී.එස්.ඒ. මැතිව්ස් මෙනවිය (2016.04.08 දින සිට පත් කරන ලදී)	06
ඩී. කොළඹගේ මහතා (2016.04.08 දින සිට පත් කරන ලදී)	09
එස්. මන්සූර් මහතා (2016.04.08 දින සිට පත් කරන ලදී)	06
ඩබ්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා (2016.04.08 දින සිට පත් කරන ලදී)	07
එස්. ලියනමාන මෙනවිය (2016.04.08 දින සිට පත් කරන ලදී)	09
පී.ඩී. සමරසිංහ මහතා (2016.07.29 දින සිට පත් කරන ලදී)	07

මාසික ගිණුම් වාර්තා හා ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වෙත ලබාදෙනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සියලුම වැදගත් කරුණු සාකච්ඡාවට ලක්කර ඒ පිළිබඳව තීරණ ගනු ලැබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිශ්චිත අනුමැතිය අවශ්‍ය වන කරුණු පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය. සමාගම් ලේකම්වරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා නිසි පරිදි සටහන්කර, පවත්වාගත යුතු ය.

අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණය

සමාගමේ කොටස්හිමියන්ගේ ආයෝජන හා සමාගමේ වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධති හඳුන්වා දී ඇත. අභ්‍යන්තර පාලන පද්ධතිවල ඊටම ආවේනික වූ සීමාවන් පවතින බවත්, වංචා හා වැරදීම් සිදුනොවන බවට ඒකාන්ත සහතිකයක් ඒවාට ලබාදිය නොහැකි බවත් අධ්‍යක්ෂ මණ්ඩලය මෙනවින් අවබෝධකරගත් කාරණයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමවත් පදනමක් මත අනුමත අවයැය සීමාවන් ඇතුළත සමාගමේ මාසික ගිණුම් සහ කාර්ය සාධනය සමාලෝචනය කරයි.

විගණන කමිටුව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය:

අධ්‍යක්ෂවරයාගේ නම

ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සභාපති)

ජේ.එම්.ශ්‍රූ.පී. ජයමහ මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)

එම්. ශෙෂ්මින් මන්සූර් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)

සමාගමේ අභ්‍යන්තර විගණකයන් වන අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය විසින් සකස් කරනු ලබන හෝටලයේ මෙහෙයුම් වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ වාර්තාව විගණන කමිටුව විසින් මැනවින් අධ්‍යනය කර, විශ්ලේෂණයට ලක් කිරීමෙන් අනතුරුව හෝටලයේ මෙන්ම සමාගමේ කටයුතු දැඩි පාලනයකට ලක් කරනු ලබන බව තහවුරු කරනු ලැබේ. හෝටලයේ/සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් පිළිබඳව විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි. කොළඹ කොටස් හුවමාරුව වෙත යවනු ලබන තෙයිමාසික මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පෙර විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

විගණන කමිටුවේ වාර්තාව මෙම වාර්තාවේ පිටු අංක 48හි දක්වා ඇත.

පාරිශ්‍රමික කමිටුව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් පරිදි ස්ථාපිත කරන ලදී:

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකගේ නම	පත්කළ / ඉවත්කළ දිනය
අතුල සේනානායක මහතා (සභාපති)	2016.04.28 දින සිට පත් කරන ලදී
දිනුක් කොළඹගේ මහතා (සාමාජික)	2016.04.28 දින සිට පත් කරන ලදී
ඩබ්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	2016.04.28 දින සිට පත් කරන ලදී
ක්‍රිෂාන්ත කුරේ මහතා	2017.01.16 දින සිට පත් කරන ලදී

පාරිශ්‍රමික කමිටුව පාරිශ්‍රමික කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

සමාගම් ලේකම්වරුන්

අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු විසින් ප්‍රශස්ත පාලන පරිචයන් ක්‍රියාවට නංවනු ලබන බව තහවුරු කිරීම පිණිස සමාගම් ලේකම්වරුන් විසින් සමාගම් පනතට හා කොළඹ කොටස් හුවමාරුවේ නියාමන වලට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

නෛතික නියමයන්ට අනුකූලතාව

සමාගමේ සියලු මූල්‍ය හා කළමනාකරණ තොරතුරු වලට ප්‍රවේශය අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන්ට හිමි වේ. සමාගම නීති හා නියාමන සියල්ලටම අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීමටත්, සමාගමේ කටයුතු කළමනාකරණය කර ගැනීමේදී නිසි ඇතලස් බවින් යුතුව ක්‍රියාකිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලය සෑම ප්‍රයත්නයක්ම ගනී. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරනු ලබන බව තහවුරු කිරීම සඳහා නිසි අවේක්ෂණ හා පාලන පද්ධති ක්‍රියාවට නංවා ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති සංග්‍රහයේ අංක 7.10 වගන්තියට අනුව සහ සමායතන පාලන රීති වලට අනුකූලව කරන ලද අනාවරණයන් පහත සඳහන් වගුවේ අක්වා ඇත:

රීති අංකය	විෂයය	අදාළ නියමය	අනුකූලතා මට්ටම	විස්තරය
7.10.1	විධායක නොවන අධ්‍යක්ෂවරු	යටත් පිරිසෙයින් අධ්‍යක්ෂ මණ්ඩල සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය	අනුකූලව ක්‍රියා කර ඇත.	අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
7.10.2 (අ) හා (ආ)	ස්වාධීන අධ්‍යක්ෂවරු	අධ්‍යක්ෂවරුන් 2ක් හෝ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3ක් වඩා වැඩි අගය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. සෑම ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින්ම තමා ස්වාධීන බවට / ස්වාධීන නොවන බවට නියමිත ආකෘති පත්‍රය මත ප්‍රකාශයක් කළ යුතුය.	අනුකූලව ක්‍රියා කර ඇත. අනුකූලව ක්‍රියා කර ඇත.	

රීති අංකය	විෂයය	අදාළ නියමය	අනුකූලතා මට්ටම	විස්තරය
7.10.3	අධ්‍යක්ෂවරුන්ට අදාළ අනාවරණය	(අ) ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතුය.	අනුකූලව ක්‍රියා කර ඇත.	කරුණාකර, වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල අනු-කමිටු වලට අදාළ තොරතුරු බලන්න
7.10.5	පාරිශ්‍රමික කමිටුව	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත පාරිශ්‍රමික කමිටුවක් තිබිය යුතුය.	අනුකූලව ක්‍රියා කර ඇත.	කරුණාකර, වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල අනු-කමිටු වලට අදාළ තොරතුරු බලන්න
7.10.6	විගණන කමිටුව 7.10.6 (අ) විගණන කමිටුවේ සංයුතිය	සමාගමේ විගණන කමිටුවක් තිබිය යුතුය. (අ) විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර ඉන් බහුතරයක් දෙනා ස්වාධීන විය යුතුය. (ආ) විගණන කමිටුවේ සභාපති හෝ එක් සාමාජිකයෙක් වෘත්තීය ගණකාධිකරණ ආයතනයක සාමාජිකයෙක් විය යුතුය.	අනුකූලව ක්‍රියා කර ඇත. අනුකූලව ක්‍රියා කර ඇත. අනුකූලව ක්‍රියා කර ඇත.	කරුණාකර, වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යක්ෂ මණ්ඩල අනු-කමිටු වලට අදාළ තොරතුරු බලන්න විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් දෙදෙනෙක් ස්වාධීන විය යුතුය. විගණන කමිටුවේ සභාපතිගණකාධිකරණ ආයතනයක සාමාජිකයෙක් වේ.

සෙසු ප්‍රතිපත්ති හා පරිචයන්

ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම

අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාර්යයන් ඉටුකිරීමේදී අවශ්‍ය වන පරිදි බාහිර පාර්ශව වලින් ස්වාධීන වෘත්තීය උපදෙස් සමාගමේ වියදමින් ලබාගනී.

සමාගමේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් කැපවීම

සමාගම සම්බන්ධයෙන් වන සිය යුතුකම් ඉටුකිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් කාලයක් කැප කරයි. සමාගමේ දෛනික මෙහෙයුම් කාර්යයන් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත පවරා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ධනුක රන්පිත් සමරසිංහ
අධ්‍යක්ෂ

දිනුක් කොළඹගේ
අධ්‍යක්ෂ

2018 ජූලි මස 23 දින දී ය.

අවදානම් කළමනාකරණය

අනේකවිධ අභියෝග හමුවේ විවිධාංගීකෘත සංචාරක මූලාශ්‍ර ආකර්ෂණය කරගැනීමටත්, නොවෙනස්ව පවත්වා ගැනීමටත් පවතින ඉල්ලුම රාවප්‍රතිරාව නංවන ඉහළ තරඟකාරීත්වයකින් යුත් කර්මාන්තයක ඉදිරියෙන්ම සිටිමින් හිල්ටන් කළමිබෝ හෝටලය සිය පාර්ශ්වකරුවන් සඳහා ඉහළ වටිනාකම් ලබාදීම පිණිස ගනු ලබන ප්‍රයත්නයේ එක් අනුකල ක්‍රියාවලියක් වශයෙන් අවදානම් කළමනාකරණය සලකයි. අපේක්ෂාව පරදා වෙනස්වීම ප්‍රතිමානය බවට පත්ව ඇති වත්මන් ව්‍යාපාරික වටපිටාව තුළ ව්‍යාපාරික කටයුතු ඉටු කිරීම හා නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීම සහ උපාය මාර්ගික සැලසුම්කරණය අතර සමබරතාවක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් හෝටලය විසින් ඉටුකළ යුතු අතිශය වැදගත් කාර්යභාරය පිළිබඳව නිරන්තරයෙන් අවබෝධයෙන් පසුවේ. දැණුවත් තීරණ ගැනීම සඳහාත්, අවස්ථා හා ඒවායේ නෛසර්ගික අවදානම් තක්සේරු කිරීම සඳහාත් එමඟින් පහසුකම් සැලසෙන අතර තම ප්‍රමුඛ වත්කම් නිසි පරිදි ආරක්ෂාකර ගැනීමට හෝ වර්ධනය කරගැනීමට හෝටලයට හැකියාව උදාවේ.

හිල්ටන් කළම්බෝ හෝටලයේ අවදානම් කළමනාකරණ වේදිකාව සමාගමේ අවදානම් පාත්‍රතා ප්‍රභේද කවරක් දැයි හඳුනාගෙන, විභව්‍ය අවදානම් තක්සේරුකොට, ඒවා අවමකිරීමේ හෝ පාලනය කිරීමේ ක්‍රමෝපායන් සකස් කිරීම සඳහා සැලසුම් කරන ලද්දකි. අවදානම් කළමනාකරණය අප සමාගමේ සංයුක්ත පාලන ව්‍යුහය සහ උපායමාර්ග සම්පාදන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර සිය සමස්ත මෙහෙයුම් ක්ෂේත්‍ර තුළ ප්‍රමාණවත් බව හා අනුකූලතාව තහවුරු කිරීම පිණිස කරනු ලබන කාලීන සමාලෝචන සහිත යෝග්‍ය පද්ධති, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සාර්ථකව හා ක්‍රමෝපායිකව සකස් කරනු ලැබ ඇත.

මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වන ගතිකත්වයන් නිරන්තරයෙන් පිළිබිඹු කරන අපගේ අවදානම් කළමනාකරණ රාමුව අපගේ ප්‍රතිපත්ති රාමුවට මෙන්ම අදාළ වන පරිදි ජාත්‍යන්තර ප්‍රශස්ථ පරිචයන්ට අනුගත වන ලෙස සම්පාදනය කරනු ලැබ ඇත.

හිල්ටන් කළම්බෝ හෝටලයේ අවදානම් කළමනාකරණ රාමුව අධීක්ෂණය හා ඒ පිළිබඳ අවසන් වගකීම කළමනාකාරීත්වය සතුවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමස්ත වගකීම අවදානම් කළමනාකරණ කණ්ඩායමට හිමිවේ.

අවදානම් කළමනාකරණ රාමුව

හිල්ටන් කළම්බෝ හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධානත්වය ගෙන ක්‍රියාකරන සාමාන්‍යාධිකාරීවරයා, ස්වකීය ව්‍යවස්ථාපිත, විශ්වස්තතා, සහ නියාමන වගකීම් මැනවින් සම්පාදිත අවදානම් කළමනාකරණ රාමුවක් ඇතුළත ඉටුකිරීමේදී හිල්ටන් වර්ල්ඩ්වයිඩ් අප මව් සමාගම සමඟ සමීප සම්බන්ධතාවෙන් යුතුව කටයුතු කරයි. සාමාන්‍යාධිකාරීවරයා සමඟ හෝටලයේ කාර්ය ප්‍රධානීන්ගෙන් අවදානම් කළමනාකරණ කණ්ඩායම සමන්විත වේ. බුද්ධි තොරතුරු රැස්කිරීම, තත්ත්ව විගණනය, ආරක්ෂක විගණනය, අභ්‍යන්තර විගණනය සහ සේවාලාභී ප්‍රතිපෝෂණය හා සිදුවීම් ආදී ක්‍රමවේද උපයෝගී කරගනිමින් අදාළ සියලු අභ්‍යන්තර හා බාහිර අවදානම් හඳුනාගනු ලබන බව ඉතා ක්‍රමවත් ක්‍රියාවලියක් මඟින් තහවුරු කරනු ලැබේ.

එසේ හඳුනාගනු ලබන අවදානම් ඉන් අනතුරුව ව්‍යාපාරය කෙරෙහි ඇති කරන බලපෑම, සිදුවීමට ඇති අවකාශය හා ප්‍රවේගය යන සාධකවලට අනුව තක්සේරු කරනු ලැබේ. එමඟින් ඇතිකරන බලපෑමට හා සම්භාවිතාවට අනුව පෙළගස්වනු ලබන අතර එතුළින් ප්‍රමුඛ අවදානම් පාත්‍රතා ප්‍රමුඛගත කිරීමට අවස්ථාව සැලසේ.

මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම්වල ප්‍රතිඵල ඉහළම අවදානමේ සිට නොවැදගත් අවදානම දක්වා අනුපිළිවෙලින් අවදානම් ශ්‍රිතයක වගුගත කරනු ඇති අතර එය, අවදානම් ප්‍රමුඛතාගත කිරීමටත්, නිවාරණ, අභිකෂක හා විමෝධක යන වර්ගීකරණය කාර්ය සැලසුම් යටතේ අවදානම් අවම කරන උපායමාර්ග සැලසුම් කිරීමත් හෝටලයට අවස්ථාව උදාකරයි.

එසේ හඳුනාගත් අවදානම් හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් මාසික පදනමකින් සමාලෝචනය කරනු ලබන අතර, කවර හෝ අවමකරන සැලසුමක් ක්‍රියාත්මක කිරීමේ වගකීම අදාළ අවදානම් හිමිකාරත්වය පවරා දී ඇති කණ්ඩායම සතුවේ. අවදානම් සමාලෝචනය අවදානම් කළමනාකරණ රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ද අවදානම් කළමනාකරණ කණ්ඩායම කටයුතු කර ඇත.

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවමකිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
තාක්ෂණික හා තොරතුරු අවදානම විද්‍යුත් පද්ධති අක්‍රීයවීමේ හා තොරතුරු පද්ධති ප්‍රමාණවත් නොවීමේ අවදානම	කිසිදු බිඳවැටීමකින් තොර තොරතුරු ප්‍රවාහයක් හා කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් තහවුරු කරමින් පූර්ණසමෝධානික, දේපළ කළමනාකරණ, ද්‍රව්‍ය කළමනාකරණ, විකුණුම් ස්ථානීය හා මූල්‍ය තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. පද්ධතියේ කිසියම් බිඳවැටීමක් සිදුවුවහොත්, ඒ සඳහා ආපදා යථාතත්වයට පත් කිරීමේ සැලැස්මක් තිබීම හා එය අඛණ්ඩව වැඩි දියුණු කිරීම. ඇණහිටීම් අවමකිරීමට හා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගැනීම තහවුරු කිරීමට හෝටලයේ පරිගණක සවිකිරීම් වල ආරක්ෂාව පිණිස හෝටලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් පාලන යාන්ත්‍රණ ක්‍රියාවට නංවා ඇත. තොරතුරු ආරක්ෂාව හා අවංකභාවය තහවුරු කිරීම සඳහා පරිගණක ජාල ආරක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවමකිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
අභ්‍යන්තර ක්‍රියාවලි හා පටිපාටි මූල්‍ය අලාභ හා ව්‍යාපාරික කටයුතු අවදානම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද බිඳවැටීමේ අවදානම	අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග වලට අනුකූලතාව තහවුරු කිරීම පිණිස පැහැදිලිව අර්ථනිරූපිත, පද්ධති හා පටිපාටි ක්‍රියාවට නංවා ඇති අතර ඒවායේ අඛණ්ඩ ඵලදායිතාව පවත්වා ගැනීම සඳහා කාලීනව සමාලෝචනය කරනු ලැබේ. හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ආයතනයේ අභ්‍යන්තර විගණන කණ්ඩායමක් විසින් නිරන්තර සමාලෝචන සිදුකරනු ලබන අතර මෙකී පද්ධතිවල ප්‍රමාණවත් බව හා සඵලතාව පිළිබඳව මෙන්ම අනුකූලතා මට්ටම පිළිබඳව ද වාර්තා කරනු ලැබේ.
ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කළ ආපදා දේපළ හා උපකරණවලට සිදුවන සැලකිය යුතු අලාභ	රක්ෂණාවරණවල ප්‍රමාණවත් බව නිරන්තරයෙන් සමාලෝචනය කර අවශ්‍ය පරිදි යාවත්කාලීන කරනු ලැබේ. වත්කම් ආරක්ෂා කිරීම හා කඩිනමින් යථාවත් කිරීම සඳහා ඉතා අවදානම්කාරී තත්ත්වයන් කළමනාකරණය කිරීමේ හා ව්‍යාපාර යථාවත් කිරීමේ සැලසුම් ක්‍රියාවට නංවා ඇති අතර ඒවා කාලීනව සමාලෝචනය කරනු ලැබේ.
ණය අවදානම ණයගැතියන් ණය බේරුම් නොකිරීම නිසා ඇතිවන අවදානම් පාත්‍රතාව හා අලාභ	ණය ආපසුගෙවීම පැහැරහැරීමේ බලපෑම අවම කිරීමට ණය ප්‍රතිපත්තියක් හා දැඩි පාලන ක්‍රමවේද ක්‍රියාවට නංවා ඇත. ණය සීමාවන් නිරන්තර පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ණයගැති ශේෂ සහ ණය ආපසු අයකර ගැනීමේ ඉලක්ක සහ අවශ්‍ය ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම.
ද්‍රවශීලතා අවදානම මූල්‍ය බැඳීම් නියමිත දින වකවානු තුළ ඉටුකිරීමට නොහැකිවීම.	ද්‍රවශීලතාව හා ලාභදායිත්වය අතර සමතුලිතාවක් ඇතිකර ගැනීම සඳහා අනුමත අයවැය ඉලක්කවලට සාපේක්ෂව සමාගමේ කාර්යසාධනය අධීක්ෂණය කිරීමට ක්‍රමවත් සමාලෝචන යාන්ත්‍රණ ක්‍රියාවට නංවා ඇත. මුදල් ප්‍රවාහය සහ සමාගමේ ඵලවුම් තත්ත්වය මත අහිතකර බලපෑමක් නොවන පරිදි ප්‍රාග්ධන ආයෝජන සැලසුම් කරනු ලැබේ.

ඇ.එ. ජනපදයේ හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූලව හෝටලයේ උපායමාර්ගික සලැස්ම යථාර්ථයක් බවට පත්කර ගැනීම අනතුරෙහි හෙළීමේ හැකියාව ඇති අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් වර්ෂය පුරා ක්‍රියාත්මක කර ඇත. මෙහිදී, හොටල් කර්මාන්තයේ ප්‍රශස්ථ පරිචයන් මෙන්ම විභව්‍ය මූල්‍ය අවදානම් සැලකිල්ලට ගන්නා ලදී, හෝටලය විසින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපාරික අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් සමාලෝචනය කර ඇති අතර අවදානම් කළමනාකරණ ව්‍යායාම සිදුකර ඇති බව සැලකිල්ලට ගෙන ඇත.

හිල්ටන් කළුබෝ හෝටලයේ 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂයේ අවදානම් ලේඛනයේ ඇතුළත් ප්‍රධාන අයිතමයන් කිහිපයක් සහ ඒවායේ තත්ත්වය හා ඒවා වළක්වා ගැනීම සඳහා වන උපාය මාර්ගයන් පහත දක්වා ඇත:

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවමකිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
මෙහෙයුම් අවදානම්	
තරඟකාරිත්ව අවදානම වෙළඳපොල පංගුව අවමවීම, ප්‍රතිසංස්කරණ වැඩසටහන නිසා තරඟකාරීවීමට අපොහොසත් වීම හේතුවෙන් හෝටල් කාමරවල පදිංචිය හා කාමර ගාස්තු පහළයාම	සේවා සත්කාරයේ ඉහළම ගුණාත්මය හා ගෙවන මුදලට උපරිම තෘප්තිය සහතික කිරීම සඳහා සේවා ප්‍රමිතීන්ට දැඩි අනුකූලතාව. පහසුකම් හා සේවාවන් උත්ශ්‍රේණිගත කිරීම හා වැඩිදියුණු කිරීම. සන්නාම ප්‍රමිතීන්ට හා ප්‍රමිතිගත මෙහෙයුම් පටිපාටි වලට (SOP) අනුකූලතාව පිළිබඳ සමාලෝචනය හා අධීක්ෂණය. තරඟකරුවන්ගේ උපායමාර්ග හා ක්ෂේත්‍රයට අලුතින් පැමිණෙන්නන් අපේක්ෂාවෙන් පසුවීම හා ඒ අනුව උපායමාර්ග සකස් කිරීම. අමුත්තන්ගේ ප්‍රතිපෝෂණ අඛණ්ඩව සමාලෝචනය කිරීම හා අමුත්තන් තෘප්තියට පත්වන පරිදි මතුවන ගැටලු කඩිනමින් විසඳාලීම.

අවදානම් කළමනාකරණය

අවදානම් කාණ්ඩය හා විස්තරය	අවදානම් අවමකිරීමේ පාලන ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරී සැලසුම්
සන්නාම ප්‍රතිරූපය හා කීර්තිනාම අවදානම සමාගමෙ සන්නාමයට හෝ කීර්තිනාමයට සැලකියයුතු හානියක් සිදුකළ හැකි ක්‍රියා හෝ ක්‍රියාමාර්ග	HACCP සහ වෙනත් තත්ත්ව හා ප්‍රමිති සහතික ලබාගැනීම තුළින් පාරිසරික, සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රශස්ථ පරිචයන්ට අනුකූලව කටයුතු කිරීම නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් කර්මාන්තයේ ප්‍රශස්ථ පරිචයන් පිළිබඳ මිණුම්දඬු නියම කිරීම හෝටල් ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් සහිත යෝග්‍ය සුදුසුකම් සපුරා ඇති, පුහුණු කාර්ය මණ්ඩලයක් විසින් ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන බව තහවුරු කිරීම සන්නාම ප්‍රතිඥාවට අනුකූලව නව්‍යශීලී සේවා සම්පාදනය සාමූහික සමාජ වගකීම් මූලාරම්භනයන් තුළින් වගකිවයුතු සමායතන පුරවැසිභාවය
මානව සම්පත් අවදානම ප්‍රමුඛ හා පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉවත්ව යාම, අයෝග්‍ය කම්කරු ක්‍රියාකාරකම් අනුරාදායක සේවා තත්ත්වයන්/රසායනික ද්‍රව්‍ය හේතුවෙන් තුවාල/සෞඛ්‍ය උවදුරු හටගැනීම	කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය තුළින් විසුහගත පුහුණු වැඩසටහන්, තීරයක් පාත්‍රතා පුහුණු අවස්ථා බිහිකිරීම යහපත් සේවය-සේවක සබඳතාව, සේවක සුභසාධනය, සහ සැමට ජයග්‍රහණය හිමිවන පිරිදි වෘත්තීය සමිති සමඟ සඵලදායී හා විවෘත සංනීවේදනය පිළිබඳව අවධාණය යොමු කිරීම සමූහ විනෝද හමු, චාරිකා, පවුල් සුහද හමු, සහ ආගමික උත්සව ආදිය මඟින් සමස්ත ආයතනය තුළ ඒකීයත්වය හා තමා ආයතනය තුළ තමා අත්‍යවශ්‍ය කෙනෙකු බවට හැඟීමක් ජනිත කිරීම. ක්ෂේත්‍රයේ වඩාත් තරගකාරී වන පරිදි ප්‍රමුඛ තනතුරු සඳහා වැටුප් පරිමාණ සකස් කිරීම. නියමිත ආරක්ෂක ප්‍රමිති හා පටිපාටිවලට දැඩි අනුකූලතාව.

තිරසරකත්ව වාර්තාකරණය

හිල්ටන් කළමිබෝ හෝටලයේ කළමනාකරණ කටයුතු ඉටුකරන හොටෙල් ඩිවෙලොපර්ස් පීඑල්සී (HDI) සමාගම විසින් වගකිවයුතු ආගන්තුක සත්කාරක සේවාවේ නවතම මිණුමිදඬු සැකසීම පිණිස දරන්නා වූ අඛණ්ඩ හා සාකල්‍ය ප්‍රයත්නයේ අනුකල අංගයක් ලෙසක්‍රියාවට නංවා ඇති තිරසර උපායමාර්ගය, හිලටන් කළමිබෝ හෝටලයේ මෙහෙයුම් මඟින් ඇතිවන සියලු ආකාර සැලකිය යුතු ආර්ථික, සාමාජීය, හා පරිසර බලපෑම් සමෝධානිත විශ්ලෙෂණය, කළමනාකරණ හා වාර්තාකරණය මත පදනම් වී ඇත.

මෙම කුළුණු ත්‍රිත්වය මත පිහිටා ක්‍රියාවට නංවා ඇති හිලිටන් කළමිබෝ හෝටලයේ මූලාරම්භනයන් අදාළ සියලු පාර්ශ්වයන් සමඟ පාරදෘශ්‍ය සංවාදය ගොඩනංවා ගැනීමට මහෝපකාරීවන අතර දිගු කාලීන වශයෙන් තිරසර සංවර්ධනයක් තහවුරු කෙරෙන ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් කළමනාකරණය හා අවමකිරීම පිණිස අනාගත පරාමිතීන් නිරූපණය කිරීම සඳහා පහසුකම් සපයයි.

තිරසර සංචාරක

ශ්‍රී ලංකාවේ දිදුලන අතිවිශිෂ්ට ආගන්තුක සත්කාරක ආයතනය ලෙස 30 වර්ෂ පූර්ණය සමරණ හිල්ටන් කළමිබෝ හෝටලය වගකිවයුතු සමායතන පුරවැසියෙකු ලෙස ස්වකීය දීර්ඝ කාලීන උරුමය තවදුරටත් ව්‍යාප්ත කිරීමට පූර්ණ ලෙස කැපවී සිටී. 2017 වර්ෂය පිළිබඳව විශේෂයෙන් සලකා බැලීමේදී, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එම වර්ෂය ජාත්‍යන්තර තිරසර සංචාරක වර්ෂය ලෙස ප්‍රකාශයට පත්කර ඇති සන්දර්භය තුළ, ගෝලීය වශයෙන් හිල්ටන් සන්නාමය ස්ථාපිත කරගත් සුබෝපභෝගී ආගන්තුක සත්කාරය හා අර්ථාන්විත තිරසරබව සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන උසස් ප්‍රමිති වලට අනුකූලව ගෝලීය තිරසර ප්‍රශස්ත පරිචයන්ට අනුගතව ක්‍රියාකිරීමට හෝටලය අඛණ්ඩව වෙර දරමින් සිටී.

සමාලෝචිත වර්ෂය තුළ, හෝටලයේ මානව ප්‍රාග්ධනය අඛණ්ඩව ප්‍රශස්තකරණය අරමුණු කරගත් සාමූහික ප්‍රයත්නයක් තුළින් තිරසර කළමනාකරණයේ නවතම සුසමාදර්ශ රෝපණය කිරීමට හෝටලය විසින් සාර්ථකව ප්‍රයත්නයන් දරන ලදී, හෝටලය මෙම ජයග්‍රහණය ලබාගත්තේ, පුළුල් ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නංවමින් ද, දේශීය ප්‍රජාව කෙරෙහි ධනාත්මකව බලපෑමක් ඇතිකරමින්, කොටස්හිමියන් සඳහා අඛණ්ඩ මූල්‍ය වටිනාකම් සලසාදෙමින්, හෝටලයට පැමිණෙන අමුත්තන්ගේ, කාර්ය මණ්ඩලයේ, සැපයුම්කරුවන්ගේ හා ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අවශ්‍යතා ක්‍රියාශීලී අයුරින් සපුරාලන ආකාරයෙන් තම මෙහෙයුම්වල පාරිසරික බලපෑම අවම කිරීම සඳහා ආයෝජන යොමුකරමින් සිටින වාතාවරණයක් තුළ වීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

අපගේ කාර්ය මණ්ඩලය

කොළඹ නගරයේ හෝටල් අංශයේ සුපැහැදිලි පෙරගමන්කරු වශයෙන් හිල්ටන් කළමිබෝ හෝටලය ඉහළින්ම වැජඹේ. අතිවිශිෂ්ට සේවාව සම්බන්ධයෙන් අප සතු කීර්තිනාමය අපගේ අගනා කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගේ අප්‍රතිහත ප්‍රයත්නයේ සෘජු ප්‍රතිඵලයකි. එම ප්‍රයත්නය සාර්ථක කරගනු වස් කාර්ය මණ්ඩලයේ ගතිකත්වයන් ශක්තිමත් කිරීම, රැකියාව හා ජීවිතය අතර සමබරතාව පවත්වාගැනීම මෙන්ම එළඹෙන ඉදිරි වර්ෂවලදී ද, ක්ෂේත්‍රයේ පෙරමුණේ ගමන් කිරීම පිණිස හෝටලය බලගැන්වීමේ වේතනාව පෙරදැරිව සේවය කරන නව නායක පරපුරක් බිහිකිරීම අරමුණ කරගත් නානාවිධ මූලාරම්භනයන් සමඟ මුසුවූ බඳවාගැනීම, පුහුණු කිරීම සහ කුසලතා සංවර්ධන ආදී සෑම ක්ෂේත්‍රයකම ව්‍යාප්තවූ අතිශයින් ව්‍යුහාත්මක මෙන්ම ප්‍රගතිශීලී මානව සම්පත් කළමනාකරණයක් පවත්වා ගැනීමට හිල්ටන් කළමිබෝ හෝටලය අඛණ්ඩව ක්‍රියා කරයි.

හරිත බලශක්ති වර්ධනය

ගෙවුණු වසරේ හිල්ටන් කළමිබෝ හෝටලය අඛණ්ඩව භූක්තිවිඳි අති සාර්ථකත්වය අපගේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය හා රැඳවා ගැනීම පිණිස දරන ලද ප්‍රගතිශීලි ප්‍රවේශයේ සෘජු ප්‍රතිඵලයකි. හෝටලයේ එකී සාර්ථකත්වය අප වෙත පැමිණෙන සෑම අමුත්තෙකුටම ඉහළම මට්ටමේ තෘප්තිමත් බවක් ගෙනදීමට අප සතු හැකියාව මත රැඳා පවතින බැවින් තෘප්තිමත් බව හා විශ්වාසවන්ත බව විමසාබැලීමේ මාර්ගගත සමීක්ෂණ වැඩසටහන (SALT) මඟින් සේවාදායක තෘප්තිමත් බව අපි අඛණ්ඩව අධීක්ෂණය කරමු. මේ සඳහා සේවාදායක අත්දැකීම් අධීක්ෂණය කර, අපගේ සේවාවන් හා අගය එකතුකිරීම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා යොදාගනු ලබන වැදගත් ප්‍රතිපෝෂණයක් ලබාගැනීම දක්වා එය ප්‍රමාණනය කරන ලකුණු 10ක විස්තීරණ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් උපයෝගී කරගනී.

සේවාදායක තෘප්තිමත් බව ඉහළ නැංවීම සම්බන්ධයෙන් යටිතල පහසුකම් හා සෙසු පහසුකම් වැදගත් කාර්යයක් ඉටු කරන අතර සමාගමේ සැබෑ සාර්ථකත්වය රැඳී ඇත්තේ එහි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය සාධනය මතයි. අප වෙතට පැමිණෙන සෑම අමුත්තෙකුටම නිසි ගෞරවාදරය පිරී, සුහදශීලී ඉහළම සත්කාරයක් හිමිවූ බව හැඟීයන බව තහවුරු කෙරෙන හිල්ටන් සන්නාම ප්‍රතිඥාව අනුව කාර්ය මණ්ඩල සාමාජිකයන් සියලුම දෙනා කටයුතු කරන බවත් ඒ සඳහා කැපවී සිටින බවත් තහවුරු කෙරේ.

ප්‍රජා සබඳතා, කණ්ඩායම් සබඳතා, සේවාදායක සබඳතා හා තිරසාරකත්වය යන කුළුණු මත ගොඩනැගෙමින් අමුත්තන්, කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ප්‍රජාවන් වෙත හෝටලය ලබා දෙන අත්දැකීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරවමින් ද, වටිනාකම් නොනැසී පවත්වා ගැනීමට, පොරොන්දු ඉටු කිරීමට හා ජයග්‍රහණ පිළිබඳ රසමුසු කථා බෙදාහදා ගැනීමට හෝටලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සතු හැකියාව ඔප්නංවන සේවා සංස්කෘතියක් පවත්වාගැනීම අරමුණු කරගනිමින් ද, මෙම කාර්යය සඳහා හරිත බලශක්ති කමිටුව හරහා පහසුකම් සලස්වා දෙන ලදී.



තිරසරකත්ව වාර්තාකරණය

හිල්ටන් හෝටලයේ මානව සම්පත් අංශයේ ප්‍රධානත්වයෙන් විවිධ දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල සාමාජිකයන් අතරින් තෝරාගත් 50 දෙනෙකුගෙන් මෙම කමිටුව සමන්විත වන අතර හෝටලයේ සාමාන්‍යාධිකාරීවරයා එම කමිටුවේ සමස්ත නායකත්වය ගෙන ක්‍රියා කරයි. සමාලෝචිත වර්ෂය තුළ ආහාෂය, නිර්මාණශීලිත්වය හා අර්ථාන්විත සබඳතා තුළින් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සමෘද්ධිමත් වීමට අවස්ථාව උදාකරවන කාර්ය මණ්ඩලයේ යහපත වෙනුවෙන් අබණ්ඩව සිදුකරන ආයෝජන හරහා කායිකව, මානසිකව හා ආධ්‍යාත්මිකව වර්ධනය වීමටත් සමෘද්ධිමත් වීමටත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවකාශ සලසාදීම පිළිබඳව අවධානය යොමු කෙරෙන thrive@Hilton මූලාරම්භනය දියත් කිරීම ඉහත කී කාර්යයන් සඳහා මහත් ශක්තියක් විය.



වාඩිවී (වමේ සිට දකුණට)
ආර්.ජේ. ප්‍රනාඳු (රෙඩ්ක්ලිෆ්), ටී.එන්. ද මෙල් (ටානියා), එම්.ටී. බෝධිනාගොඩ (බෝධි), එච්.සී.ඩී. පෙරේරා (දේවිකා), එච්.ටී.එ. මෙන්ඩිස් (හේද්‍රා), කේ.එස්.ඊ. මොහොට්ටි (කපිල)

හිටගෙන (වමේ සිට දකුණට)
වී.ජී.එස්. රෝහණ (රෝහණ), ආර්.එම්. වයිස් (වයිස්), ඒ. සැමිසන් (ඇලෙක්ස්), ඩී.ඩී. උපාලි (උපාලි), එන්.ජේ. දේශප්‍රිය (දේශප්‍රිය), ටී.ඩී.ඒ. ජයන්ත (ජයන්ත)

බඳවාගැනීම, පුහුණුව හා කුසලතා සංවර්ධනය

සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ සීඝ්‍රයෙන් වර්ධනය වන අවශ්‍යතාවන්ට සාපේක්ෂව හෝටල් ක්ෂේත්‍රයට එක්වන පුහුණු වෘත්තීයවේදීන්ගේ හිඟය තවදුරටත් වර්ධනය වන වාතාවරණයක් තුළ කාර්ය මණ්ඩල බඳවාගැනීම අභියෝගාත්මක මෙන්ම ඉහළ ප්‍රමුඛත්වයක් හිමිවන කාර්යයකි. හිල්ටන් කළුබෝවිල හෝටලයේ සැමට සම අවස්ථා සලසාදීමේ ප්‍රතිපත්තියට අනුකූලව වඩාත් සුදුසුකම් සහිත අපේක්ෂකයන් පමණක් තෝරාගනු ලබන බව තහවුරු කිරීම පිණිස අපක්ෂපාතී නිර්ණායක මත පදනම්ව හෝටලය කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම සිදුකරයි. යම් විශේෂිත කුසලතාවක් හා පළපුරුද්දක් අවශ්‍ය තනතුරු හැර සෙසු තනතුරු සඳහා බොහෝ විට සීමාවාසිකයන්/පුහුණුවන්නන් වශයෙන් බඳවාගැනීම් සිදු කරයි.

හිල්ටන් කළුබෝවිල හෝටලයේ පසුගිය දශක තුනක මෙහෙයුම් අතරතුර, මෙකී ප්‍රතිපත්තිය මඟින් ප්‍රබල ප්‍රතිඵල උදාකරගැනීමට හැකිවූ අතර හෝටලයට බඳවාගත් බොහෝමයක් සේවකයන් හෝටලයෙන් පිරිනැමෙන ජාත්‍යන්තර තත්ත්වයේ වෘත්තීය සංවර්ධන හා අභිවෘද්ධි මූලාරම්භනයන් තුළින් ප්‍රතිලාභ ලැබ නායකත්ව තනතුරු සඳහා මංපෙත් විවර කරගන්නා කාර්යශූර සේවකවන් ලෙස ඉදිරියට පැමිණ ඇත.

සමාලෝචිත වර්ෂය තුළ හිල්ටන් සමාගමේ ගෝලීය වශයෙන් ක්‍රියාත්මක මාර්ගගත කුසලතා සංවර්ධන වැඩසටහන් සමඟ මුසුකළ හෝටලය තුළම නිතිපතා ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් තුලින් පහත සඳහන් කාණ්ඩ යටතේ දැනට සිටින කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පුහුණු අවස්ථා සලසා දී ඇත:

- තාක්ෂණික කුශලතා
- විවිධ තත්ත්ව හා ආරක්ෂක ප්‍රමිතිවලට අදාළ පුහුණුව
- මෘදු කුශලතා
- නායකත්ව සංවර්ධන

ආධුනිකත්ව පුහුණුව

ස්ථීර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ නිපුණතා සංවර්ධනය කරන අතරම තරුණ පිරිස් මෙම කර්මාන්තය සඳහා ආකර්ෂණය කරගැනීමත්, කර්මාන්තය තුළ රැඳවාතබා ගැනීමත් අරමුණු කොට ගත් වැඩසටහන් ද හෝටලය විසින් ක්‍රියාත්මක කරයි. එවැනි ක්‍රියාකරකම් අතර, ප්‍රමුඛ පෙළේ ආගන්තුක සත්කාරක අධ්‍යාපන ආයතන සමඟ ඒකාබද්ධ සංවිධානය කරනු ලබන සීමාවාසික, කර්මාන්ත හා ආධුනිකත්ව පුහුණු අවස්ථා සලසාදීම ආදිය ඇතුළත් වේ.



ශිල්පීය රැකියා සඳහා තරුණයින් පුහුණු කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් වන ජාතික අධ්‍යනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සමඟ සමීප සහයෝගයෙන් යුතුව ක්‍රියාකරමින් හෝටලයේ විවිධ දෙපාර්තමේන්තු මඟින් ආධුනිකත්ව පුහුණු වැඩසටහන් පහක් විසින් දැනට ක්‍රියාත්මක කර ඇත.

එකී ආධුනිකත්ව පුහුණු වැඩසටහන් පහ අතරට පහත සඳහන් වැඩසටහන් අයත් වේ:

- සූපවේද ආධුනිකත්ව පුහුණු වැඩසටහන (පුහුණු කාලය : මාස 30)
- ඉංජිනේරුමය ආධුනිකත්ව පුහුණු වැඩසටහන (පුහුණු කාලය : මාස 24)
- ගේදොර පිරිසිදු කිරීම හා අලංකරණය ආධුනිකත්ව පුහුණු වැඩසටහන (පුහුණු කාලය : මාස 12)
- ආහාර හා පාන සැකසීම පිළිබඳ ආධුනිකත්ව පුහුණු වැඩසටහන (පුහුණු කාලය : මාස 18)
- මුළුතැන්ගේ සහායක ආධුනිකත්ව පුහුණු වැඩසටහන (පුහුණු කාලය : මාස 12)

හිල්ටන් කළම්බෝ හෝටලයේ වෘත්තීය දිවිය

ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පවතින රැකියා සහ ප්‍රතිලාභ පිළිබඳව දේශීය තරුණ තරුණියන්ට මෙන්ම රැකියා සොයායන්නන් ඉලක්කකර ගනිමින් අධ්‍යාපනික හා උනන්දුකරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලොව පුරා පිහිටි හිල්ටන් හෝටල් සියල්ල සහ ඒවායේ නිලධාරීන් එක්ව වාර්ෂිකව සංවිධානය කරන මැයි මාසයේදී පැවැත්වෙන Careers@Hilton වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. 2014 වසරේදී හිල්ටන් ප්‍රධාන විධායක නිලධාරී, ක්‍රිස් නෙස්ෙටා මහතා විසින් මුලපුරණ ලද Careers@Hilton වැඩසටහන සඳහා ලොව පුරා පිහිටි හිල්ටන් හෝටල්වලින් අනුග්‍රහය හිමිවන අතර 2019 වන විට තරුණයින් මිලියනයක් සම්බන්ධ කර ගැනීම, සූදානම් කිරීම හෝ රැකියාවේ නියුක්ත කරවීම වෙනුවෙන් හිල්ටන් සමාගමේ කැපවීම සඳහා සහාය වීමට උදාවූ අනගි අවස්ථාවක් ලෙස මෙය සැලකිය හැකිය.

හිල්ටන් කළම්බෝ හෝටලයේ වෘත්තීය හා ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් 2017/2018 වර්ෂය මුළුල්ලේ ක්‍රියාවට නංවන ලද අතර එසේ පැවැත්වූ විශේෂ වැදගත්කමකින් යුතු වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ:

- කාමරයෙන් පොතපතට : මොණරාගල දිස්ත්‍රික්කයේ කාන්තා සිසුවියන් අප හෝටලයේ පැවැත් වූ රැකියා අනුකරණ වැඩසටහනකට සහභාගී වූ අතර හෝටලයේ රාත්‍රිය ගතකිරීමට අවස්ථාවද ඔවුන්ට හිමිවිය.
- පුස්ථකාල චාරිකාව අනුරාධපුරයට : මැයි මස 31 දින අනුරාධපුරයේ පැවැත්වූ මෙම පුස්ථකාල චාරිකා වැඩසටහනට හිල්ටන් කළම්බෝ හෝටලයේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවෝ සහභාගී වූහ. මෙම චාරිකාවේදී තඹුත්තේගම හා නොච්චියාගම ප්‍රදේශයේ පාසල්වල සිසුවියන් 60 දෙනෙකු සැබැවින්ම අධ්‍යාපනය ලබන ආකාරය නිරීක්ෂණය කිරීමටත්, ඔවුන් සමඟ අදහස් හුවමාරුකර ගැනීමටත්, ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පවතින රැකියා අවස්ථා ගැන ඔවුන්ට කරුණු පැහැදිලිකර දීමටත් අපගේ කණ්ඩායමට අවස්ථාව උදාවිය.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව හා හුරුකෙරවීමේ චාරිකාව : කොළඹ, ආගන්තුක සත්කාරක අධ්‍යාපන ආයතනයේ සිසු සිසුවියන් ආගන්තුක සත්කාරක කර්මාන්තයේ රැකියා අවස්ථාවන් පිළිබඳව තොරතුරු දැනගැනීමේ සැසියක් සඳහා හෝටලයට පැමිණීමට අවස්ථාව උදාකර දෙන ලදී.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව : හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රදේශයේ වයස අවුරුදු 16 - 20 අතර පසුවූ තරුණයින් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් වෘත්තීය මාර්ගෝපදේශ හා වෘත්තීය පුහුණු සැසියකට සහභාගීවීම සඳහා හිල්ටන් කළම්බෝ හෝටලයට පැමිණි අතර පුරා පැය දෙකක් පමණ පැවති එම සැසියේදී ආගන්තුක සත්කාරක කර්මාන්තයේ හා මෙම හෝටලයේ පවතින අවස්ථාවන් පිළිබඳව මනා අධ්‍යාපනයක් ඔවුන්ට ලබාගත හැකි විය.
- ශ්‍රී ලංකා බාලදක්ෂයින් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව : දිවයිනේ නන් දෙසින් පැමිණි තරුණ බාලදක්ෂයින් 450කගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා බාලදක්ෂයින් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව මැයි මස 21 වන දින හිල්ටන් කළම්බෝ හෝටලයේ ග්‍රෑන්ඩ් බාල්රූම් ශාලාවේ දී පැවැත්විනි. එම වැඩමුළුවේදී හිල්ටන් කළම්බෝ හෝටලය විසින් වෘත්තීය මාර්ගෝපදේශ, ආහාර ගැනීමේ සුසිරිත් හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ අනාගතය පිළිබඳව සැසිවාර පවත්වන ලදී.
- හිල්ටන් කළම්බෝ හෝටලයේ තරුණ සමූළුව 2017 : මැයි මස 25 වන දින පැවැත්වූ සිව්වන වාර්ෂික තරුණ සමූළුවට දිවයිනේ නොයෙක් ප්‍රදේශවල පිහිටි පාසල් හා ආයතන නියෝජනය කරමින් සිසුන් 359 දෙනෙකු සහභාගී වූ අතර අනාගතවාදී තේමාවක් යටතේ පැවැත්වූ මෙම සැසිවාරය මානව පරිනාමයේ සිට වැදගත් ඓතිහාසික දිනවකවානු හා හිල්ටන් හෝටලයට වැදගත් වන දිනවකවානු විද්‍යා දැක්වෙන වීඩියෝ දර්ශනයකින් ආරම්භ කරන ලද අතර අවසන් ප්‍රශ්න හා පිළිතුරු සැසිවාරයේදී හෝටලයේ සාමාන්‍යාධිකාරිවරයා සමඟ සාකච්ඡා කිරීමට මහඟු අවස්ථාවක් සැසියට සහභාගී වූ සිසුන්ට හිමිවිය. එහිදී අනාගතයේ සිදුවිය හැකි යම් සිදුවීමක් සම්බන්ධයෙන් තම නවෝත්පාදන හැකියාවන් අදහස් ඉදිරිපත් කිරීමට අවකාශ ලබාදුන් ක්‍රියාකාරකමක් සිසුන්ට ලබාදුන් අතර සිසුන් ඊට ඉතා උද්‍යෝගයෙන් යුතුව සහභාගී වූහ. ඉතා සාර්ථකව පැවැත්වූ තරුණ සමූළුව සම්බන්ධයෙන් සහභාගී වූ සිසුන් සියල්ලන්ම ඉතා ධනාත්මක ආකාරයෙන් සිය අදහස් පළකළේය.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුව : මැයි මස 23 දින හම්බන්තොට, සෙවනගල විද්‍යාලයේ අ.පො.ස. (උ/පෙළ) නිමකළ සිසුන් 47දෙනෙකු හුරුකෙරවීමේ චාරිකාවකට එක්වෙමින් එදින හිල්ටන් කළම්බෝ හෝටලයේ දී පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළුවට ද සහභාගී විය. සහභාගීවූ සියලුම සිසුන් සිය ප්‍රාථමික අධ්‍යාපනය නිමකළ අය වූ අතර රැකියා අපේක්ෂාවෙන් පසුවූවෝ වූහ. කොළඹට පැමිණි ඔවුන්ට ආගන්තුක සත්කාරයේ මූලික කරුණු ඉගෙන්වූ අතර හෝටලයේ වැදගත් මෙහෙයුම් ස්ථාන ඇතුළු සිරි නැරඹීමට ඔවුන් රැගෙන යන ලදී. එහිදී ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පවතින සීමාවිරහිත අවස්ථාවන් පිලිබඳව ඔවුන්ගේ නෙත් විවර කිරීමට හැකි විය.

කාන්තවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ක්‍රියාකිරීම

මානව සම්පත් ප්‍රශස්ත භාවිතාවන් පිළිබඳ හිල්ටන් සන්නාම ප්‍රවේශයේ අවධානය යොමුවූ තවත් එක් වැදගත් අංශයක් වන්නේ, කාන්තවන් සවිබල ගැන්වීම සඳහා නිරන්තරයෙන් ක්‍රියා කිරීමයි. මාර්තු 8 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ගිණිකොණදිග ආසියාවේ හා ඉන්දියාවේ පිහිටි හිල්ටන් හෝටල් එක්ව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා කාන්තවන් සවිබල ගැන්වීම සඳහා දක්වන කැපවීම තීව්‍රකිරීමේ අරමුණින් ප්‍රජා ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවන ලදී.





2014 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ කාන්තවන් සම්බල ගැන්වීම පිළිබඳ ප්‍රතිපත්තියට සහාය පළකිරීමේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රකාශයේ අත්සන්කරුවකු ලෙස හිල්ටන් හෝටලය, කාන්තා නායකත්වය, ව්‍යාපාරික හවුල්කරුවන් ලෙස කාන්තාවන් සම්බන්ධ කර ගැනීම සහ අධ්‍යාපනය, පුහුණුව හා වෘත්තීය සංවර්ධනය තුළින් කාන්තාවන් වෙනුවෙන් ආයෝජනය කෙරෙන ප්‍රජා හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකර ඇත.

2017 වර්ෂය තුළදී හෝටලය විසින් දැනට පාසල්වල හා හෝටල් පාසල්වල ඉගෙනුම ලබන සිසුවියන් ඉලක්කකර ගනිමින් වැඩමුළු, වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සහ හුරුකරවීමේ චාරිකා ආදී විවිධ වැඩසටහන් රැසක් පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ කාන්තා සාමාජිකාවන් විසින් ඉටුකරනු ලබන සියල්ල වෙනුවෙන් ඔවුන් දරන කැපවීම හා ප්‍රයත්නය අගය කිරීම පිණිසත්, ඉහළ අපේක්ෂාවන් කැටිවූ මිහිරි සිහින දැකීමට ඔවුන්ට අනුබලදීම පිණිසත් වැඩමුළු පවත්වන ලදී. තවද, "සිත, කය හා ආත්මය සුවපත් කරගැනීම" යන තේමාව යටතේ විවිධ සැසි සංවිධානය කරන ලදී.

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සමගාමීව, හිල්ටන් කළුබෝවිල හෝටලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ සංචාරක ආර්ථික හා ආගන්තුක සත්කාරක කළමනාකරණ ඒකකය සමඟ එක්ව මාර්තු මස 11 දින හිල්ටන් කළුබෝවිල හෝටලයේදී "සංචාරක කර්මාන්තයේ කාන්තා නායකත්ව සමුළුව" සංවිධානය කළේය. එම සමුළුවේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා කාන්තාවන් සවිබල ගැන්වීම යන තේමාවන් අවධාරනය කරන ලදී.

කොළඹ පළමු පුරපතිනියගේ සහ නේද්‍රලන්ත රාජධානියේ ගරු තානාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැති එම උත්සවයේදී හිල්ටන් කළුබෝවිල හෝටලයේ මානව සම්පත් අධ්‍යක්ෂවරියගේ සහ ශ්‍රී ලංකාවේ කාන්තා ක්‍රියාකාරීන් රැසකගේ උද්‍යෝගිමත් සහභාගිත්වයෙන් මණ්ඩල සාකච්ඡාවාර දෙකක් සහ ප්‍රශ්න හා පිලිතුරු සැසිවාර දෙකක් පවත්වන ලදී. වර්ෂ 2020 වන විට ගොලීය සංචාරක කර්මාන්තයේ වැඩිම පිරිසක් පැමිණෙනු ඇතැයි අපේක්ෂිත රටවල් අතර එකක් වන ශ්‍රී ලංකාවේ සංචාරක අංශය සඳහා කාන්තා නිපුණතා වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනීමටත්, ඒ තුළ රඳවා ගැනීමටත් ඉවහල් වන නව්‍යශීලී උපායමාර්ග සම්පාදනය කිරීමේ වැදගත්කම එහිදී අවධාරණය කෙරුණි.

සෞඛ්‍යය හා ආරක්ෂාව

අතිවිශිෂ්ට ආගන්තුක සත්කාරක සේවාවක් තහවුරු කිරීමේ අතිශය වැදගත් අංගයක් වන්නේ අපවෙත පැමිණෙන අමුත්තන්ගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම පිණිස නියමිත ඉහළම ආරක්ෂක ප්‍රමිති දැඩි ලෙස අනුගමනය කිරීමයි. ගෝලීය හිල්ටන් වර්ල්ඩ්වයිඩ් ප්‍රමිතිවලට අනුව, හෝටලයේ සමස්ත ආහාර සුරක්ෂිතතා හා සනීපාරක්ෂක ප්‍රමිති අධීක්ෂණය හා කළමනාකරණය කිරීම සඳහා ආහාර සුරක්ෂිතතා හා සනීපාරක්ෂක කළමනාකරුවෙකු හිල්ටන් කළුබෝවිල හෝටලය සතුවේ. ඒ අනුව, සියලුම ආහාර පිරිසැකසුම්/ගබඩාකරණ උපකරණ ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම පිණිස නිවාරණ නඩත්තු වැඩසටහන් ඉහළම ප්‍රමිතියට අනුකූලව නිරන්තරයෙන් සැලසුම් කරමින් පවත්වා ගනු ලැබේ. තවද, ආහාර සුරක්ෂිතතාව හා සනීපාරක්ෂාව සහ ආහාර විෂවීම පිළිබඳව මුළුතැන්ගෙයි කාර්ය මණ්ඩලයට නිරන්තරයෙන් අධ්‍යාපනය හා පුහුණුව ලබාදෙමින් අධීක්ෂණයට ලක් කරන අතර එමඟින් අප අමුත්තන්ගේ අවශ්‍යතා ඔවුන්ගේ මනාපය පරිදි සෑම විටම සම්පූර්ණයෙන් ඉටුවන බව තහවුරු කරගත හැකිවේ.

සෞඛ්‍යාරක්ෂාව හා අවශ්‍යතා අධීක්ෂණය කිරීම පිණිස බලයලත් රසායනාගාරයක් මඟින් පානීය ජලයේ, නානතටාකයේ ජලයේ, සිසිලන කුළුනේ ජලයේ, අමුත්තන්ගේ කාමරවල ජලයේ හා ආහාර සැකසීමට ගන්නා ජලයේ ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණ නිරන්තරයෙන් සිදු කරනු ලැබේ.

තවද, ඇතුළත වායු තත්ත්ව (IAQ) පරාමිතීන්ට අනුගත බව සහතික කිරීමට හෝටලයේ සහ කාමරවල වායුවේ ගුණත්වය නිරන්තරයෙන් පරීක්ෂා කරනු ලැබේ. ගිණිගැනීම් අවදානම අවම කිරීම සඳහා හෝටලයේ උපගෘහය මට්ටමින් නව සිංචක පද්ධතියක් සවිකර ඇත. ශබ්ද දූෂණය අවම කිරීම මඟින් ප්‍රතිසංස්කරණ කටයුතු අතරතුරදී අපගේ අමුත්තන්ට සිදුවූ අපහසුව ඉතා අවම කිරීමට අපි සමත් වුනෙමු.

ප්‍රජාව

හරිත බලශක්ති ප්‍රජා කණ්ඩායමේ සේවනැල්ල යටතේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ස්වේච්ඡා සහභාගිත්වය හෝටලයේ ප්‍රජා කටයුතු පිළිබඳ උපායමාර්ගයේ වැදගත් අංගයක් වේ. සියලුම ප්‍රජා කාර්යයන්හිදී ස්වේච්ඡාවෙන් ඊට සහසම්බන්ධවීමට අප කාර්ය මණ්ඩල සාමාජිකත්වය දක්වන උද්‌‍‍‍

තිරසරකත්ව වාර්තාකරණය

- **ළමා නිවාස සඳහා ආධාර ලබාදීම**

  පීටර් වීරසේකර ළමා නිවාසයේ "ගමේ පොල" පැවැත්වීම සඳහා එම ළමා නිවාසයට සහාය වනු පිණිස සමාගම විසින් අප කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දායකත්වය තුළින් ලිනන් රෙදිපිළි ප්‍රදානය කරන ලදී.

- **ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ මිත්‍යාමත බිඳ හෙළීම පිළිබඳ සංවාද මණ්ඩපය**

  හිල්ටන් කළුබෝ හෝටලය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ කොළඹ අගන්තුක සත්කාර කළමනාකරණ ඇකඩමිය සමග එක්ව පාසල් සිසුවියන් 35 දෙනෙකු සඳහා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ මිත්‍යාමත බිඳ හෙළීම යන මැයෙන් සංවාද මණ්ඩපයක් හිල්ටන් කළුබෝ හෝටලයේ කන්තා ක්‍රියාකාරිණියන් දසදෙනෙකු විසින් පවත්වන ලදී.

කාන්තා ක්‍රියාකාරීන් පස්දෙනෙකුගේ සහභාගිත්වයෙන් මාර්තු මස 9 වන දින කොළඹ කන්තා විද්‍යාලයේ දී "ආගමිතුක සත්කාරක කර්මාන්තයේ පවතින විපුල අවස්ථා සහ මිත්‍යාමත" යන තේමාව මත තවත් සංවාද මණ්ඩපයක් පවත්වන ලදී.

පානදුර ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලයේ ශිෂ්‍ය නායිකාවන් හැටදෙනෙකු හිල්ටන් කලුබු හෝටලයේදී දින භාගයක් පුරා පැවැත්වුණු වැඩමුළුවට සහභාගි වුණු අතර එහිදී හෝටල් කර්මාන්තය පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම වෘත්තීය මාර්ගෝපදේශ ලබා දෙමින් කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කරන ලදී.

පරිසරය

සේවාලාභී ප්‍රජාව කෙරෙහි වන අපගේ කැපවීමේ අංගයක් වශයෙන් හිල්ටන් හෝටලය විසින් සමස්ත විශ්වය පුරා සෙනෙහස හා ආලෝකය පතුරුවා හරින එක් ක්‍රමවේදයක් වන්නේ ජලය හා බලශක්ති සංරක්ෂණය සහ සෙසු එලදායී තිරසර භාවිතාවන් ක්‍රියාවට නැංවීමයි.

අවම බලශක්ති පරිභෝජනය දිරිගන්වන 'LightStay' වැඩසටහන මඟින් බලශක්ති සංරක්ෂණය

'LightStay' වැඩසටහන තුළින් ජලය හා බලශක්ති පරිභෝජනය ඇතුළු සිය පාරිසරික කාර්යසාධනය මැණ බැලීමට ලොවපුරා විසිරුණු 4,440ක් පමණ වන හිල්ටන් හෝටල්වලට හැකියාව සලසමින් සිය පද්ධති හා තාක්ෂණය උත්ශ්‍රේණිගත කිරීමට හිල්ටන් සමාගම උනන්දුවෙන් ක්‍රියාකර ඇත. 'LightStay' වැඩසටහන යනු කාලගුණය, හෝටලයේ රැඳී සිටින අමුත්තන්ගේ සංඛ්‍යාව සහ වෙනත් තත්ත්වයන් පදනම්කර ගනිමින් ජලය හා බලශක්ති පරිභෝජනය මැණ බැලීම හා පුරෝකථනය කිරීමට එක් එක් හෝටලයට අවකාශ සලසන අති නවීන හෝටලය තුළදීම යොදාගත හැකි මිණුම් ක්‍රමවේදයකි. හෝටලයේ සමස්ත කාර්ය සාධනය හා පරිභෝජනය පිළිබඳව අනතුරු හැඟවීම් කළමනාකාරිත්වයට ලබාදීමත්, ඉදිරි කාර්යසාධනය කෙරෙහි ධනාත්මකව බලපාන පරිදි ප්‍රතිශෝධන ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කිරීම ඉලක්ක කරගත් දැනුවත් තීන්දු තීරණ ගැනීම උනන්දු කරවීම හා ඒ සඳහා සහාය වීමත් මෙමඟින් ඉටුවේ.

දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ මඟින් හිල්ටන් කළුබෝ හෝටලයේ අලුත්වැඩියාවට ලක්වන ප්‍රදේශවල සැලැස්මට නවතම බලශක්ති පිරිමසන අංගෝපාංග ගණනාවක් ඇතුළත්කර ඇත. සිදුකරමින් පවතින අලුත්වැඩියා කටයුතුවල අංගයක් ලෙස කාර්යක්ෂම වායු සමීකරණ පද්ධති හා LED විදුලි බුබුළු ආදී බලශක්ති පිරිමසන නවතම උපාංග සවිකිරීමට ක්‍රියා කරන අතර හිල්ටන් කළුබෝ හෝටලයේ ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක වීමේදී තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කෙරෙනු ඇත. හාත්පස විහිදුවන කාමර උණුසුම් කරන හා අහෙකුත් බලශක්ති පිරිමසන අතිනවීන උපකරණ ප්‍රතිසංස්කරණ කටයුතු අතරතුර අලුතින් එක්කිරීමට ද නියමිතය.

එලදායී කසළ කළමනාකරණය

ප්‍රශස්ත පාරිසරික ප්‍රමිතීන් පවත්වාගැනීම තහවුරු කිරීම සඳහා හිල්ටන් කළුබෝ හෝටලයේ අඛණ්ඩ කැපවීමේ අතිරේක ගුණාංගයක් ලෙස කාබනික හා අකාබනික කසළ බැහැර කිරීමට අදාළ අපද්‍රව්‍ය කළමනාකරණය පෙන්වාදිය හැකිය. කාබනික අපද්‍රව්‍ය රැස්කොට, කොම්පොස් පෙහොර හා සත්ත්ව ආහාර සෑදීමට භාවිත කෙරේ.

ඉතිරිවන කසළ, වීදුරු හා ලෝහ අපද්‍රව්‍ය වෙන්කර තවදුරටත් වියලි හා තෙත අපද්‍රව්‍ය වශයෙන් වෙන්කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී අපද්‍රව්‍ය ඒවා එකතුවන ස්ථානවලදීම එනම් මුළුතැන්ගෙය, ආපනශාලාව හා බාරය, පිරිසුදු කිරීම්, ලිනන් කාමරය, නඩත්තු ඒකකය, ගබඩාව හා අමුත්තන්ගේ කාමර ආදී සෑම දෙපාර්තමේන්තුවකම දීම සක්‍රීයව වෙන්කරනු ලැබේ. මෙම කසළ වෙන්කිරීම දෛනිකව හෝටල් පරිශ්‍රයේදීම සිදු කෙරේ. තෙවන පාර්ශ්වීය ප්‍රතිචක්‍රීකරණ සමාගමක් සමඟ එළැඹී ගිවිසුම් ප්‍රකාරව ප්ලාස්ටික් බොතල් ප්‍රතිචක්‍රීකරණ කරනු ලැබේ.

එපමණක් නොව, හෝටලයේ සමස්ත මෙහෙයුම් තුළ අපද්‍රව්‍ය අවම කිරීම අරමුණු කරගත් වෙනත් පුහුණු හා කළමනාකරණ මූලාරම්භනයන් සමඟ ඒකාබද්ධ කරමින් ආහාර අපතේ යාම පිළිබඳව කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දැනුවත් කිරීමේ පෝස්ටර් ව්‍යාපාරයක් ද හෝටලය විසින් ක්‍රියාත්මක කරන ලදී.

හිල්ටන් කළුබෝ හෝටලය පරිසරය සුරැකීමේ අංශයෙන් ඉදිරියටම යමින්, ස්වාභාවික සම්පත් වගකිවයුතු හා තිරසර ආකාරයෙන් භාවිතා කිරීම අවධාරණය කෙරෙන පරිසර ආරක්ෂණ ප්‍රවේශයක් අඛණ්ඩව අනුගමනය කරමින් සිටී. ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ නියමුවා වශයෙන් ද, දේශීය කර්මාන්ත අංශයේ වැදගත් ප්‍රමුඛතාවක් ලෙස තිරසරභාවය හා පාරිසරික බලපෑම් සැලකිල්ලට යොමු නොවූ මීට දශක දෙකකට ආසන්න කාලයකට පෙර සිටම හෝටලය විසින් ස්ථාපිත කරන ලද වටිනාකම් වලට අනුගතව මෙහිදී ක්‍රියාකරනු ඇත. විස්තීර්ණ පරිසර ආරක්ෂණ මූලාරම්භනයන් ගණනාවක පුරෝගාමිත්වය ගෙන ක්‍රියා කළ ආයතනයක් වශයෙන් හිල්ටන් කළුබෝ හෝටලය, සම්පත් පරිභෝජනය තවදුරටත් අවම කිරීමේ සහ කසළ ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍රාගාර සවිකිරීම හා වායු සමීකරණය සඳහා මධ්‍යගත ජල සිසිලන භාවිත කිරීම වැනි තිරසර බලශක්ති සංරක්ෂණ පරිවයන් සැලසුම් කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ නවතම ක්‍රමවේද ගවේෂණය කරමින් සිටින අතර එසේ කටයුතු කිරීමේ දිගුකාලීන අරමුණ වන්නේ ගෝලීය වශයෙන් කාබන් ආවරණය අවම කිරීම සම්බන්ධයෙන් වැදගත් භූමිකාවක් ඉටුකිරීමයි.

එකී ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ගෙවුණු වසර ගණනාව තුළ විවිධ ක්‍රමෝපායන් අනුගමනය කළ අතර බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘති කෙරෙහි වැරදී චරියාවන් මඟින් ඇතිවිය හැකි බලපෑම පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් මෙන්ම අමුත්තන් ද දැනුවත් කිරීම සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් පරිසරය පිළිබඳ වගකිවයුතු පිරිසක් බවටත්, සැපයුම් කරුවන් හා අමුත්තන් සමඟ ඔවුන් කටයුතු කිරීමේදී මෙකී මූලධර්ම වලට අනුකූලව කටයුතු කරන බවටත් තහවුරු කිරීම එකී ක්‍රමෝපායන් අතර විය.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂවරුන් 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ස්වකීය වාර්තාව සහ විගණනය කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශය ඉමහත් සතුටින් යුතුව ඉදිරිපත් කර සිටී.

1. වර්ෂය පිළිබඳ සමාලෝචනය

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාරික කටයුතු හා එහි කාර්ය සාධනය, මූල්‍ය ප්‍රතිඵල හා උපායමාර්ග පිළිබඳ අදහස් දැක්වීම් සමඟ කරන ලද සමාලෝචනය සභාපතිතුමාගේ ප්‍රකාශයේ දක්වා ඇත. (පිටු අංක 19)

2. ප්‍රධාන ක්‍රියාකාරකම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ සමාගමේ හිමිකරුවන් සහ ගොඩනැගිලි හා සෙසු දේපළ සම්බන්ධ ව්‍යාපාරික කටයුතු ඉටු කිරීමත්, ඒවා වැඩි දියුණු කිරීම, සූදානම් කිරීම හා සම්පාදනය කිරීමත් ය.

3. මූල්‍ය ප්‍රකාශ

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිටු අංක 54 සිට 79 දක්වා සඳහන් කර ඇත.

4. අබණ්ඩ පැවැත්ම

කලින් අනුමාන කළ හැකි අනාගත තත්ත්වයකදී සිය ව්‍යාපාරික මෙහෙයුම් පවත්වා ගැනීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුවන බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්ව සිටිති. ඒ අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශ අබණ්ඩ පැවැත්ම පදනම් කරගනිමින් සකස් කරනු ලැබ ඇත.

5. විගණක වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණක වාර්තාව පිටු අංක 51 හි දක්වා ඇත.

6. ගණකාධිකරණ ප්‍රතිපත්තිය

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී උපයෝගී කරගත් වැදගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති පිටු අංක 59හි 4 වන සටහනෙහි දක්වා ඇත.

7. බදුකරණය

මූල්‍ය ප්‍රකාශයේ 26 වන සටහනෙහි දක්වා ඇති අනුපාතික මත බදු ප්‍රතිපාදන ගණනය කර ඇත.

8. ලාභාංශ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් මත ලාභාංශ ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

9. අධ්‍යක්ෂ මණ්ඩලය හා ඔවුන්ගේ කොටස් හිමිකාරත්වය

2017 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය:

ක්‍රිශාන්ත ප්‍රසාද් කුරේ මහතා	- සභාපති
ධීෂනා අමරසේකර මෙනවිය	- අධ්‍යක්ෂ
පේ.එම්.යූ.පී. ජයමහ මහතා	- අධ්‍යක්ෂ
අතුල සේනානායක මහතා	- අධ්‍යක්ෂ
ටෙහානි එස්.ඒ. මැතිව්ස් මෙනවිය	- අධ්‍යක්ෂ
දිණුක් කොළඹගේ මහතා	- අධ්‍යක්ෂ
එම්. ශෙෂ්මින් මන්සූර් මහතා	- අධ්‍යක්ෂ
ඩබ්.එස්.අයි.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	- අධ්‍යක්ෂ
සොනාලි ලියනමාන්න මෙනවිය	- අධ්‍යක්ෂ
ප්‍රවීර ධනෝෂ් සමරසිංහ මහතා	- අධ්‍යක්ෂ

සමාගමේ ඉහත සඳහන් කවර හෝ අධ්‍යක්ෂවරයෙකු සමාගමේ කොටස් හිමිකරුවකු නොවේ.

10. පිළිබැඳියා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 192 (2) වගන්තියේ විධිවිධාන සලසා දී ඇති පරිදි අධ්‍යක්ෂවරුන් විසින් නියමිත ප්‍රකාශයන් සිදුකර ඇත. මෙම නියමය පරිදි, අධ්‍යක්ෂවරුන් සතුව යම් පිළිබැඳියාවක් ඇති කවර හෝ ගිවිසුමක් වෙතොත් ඒ පිළිබඳ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශවල 34.1 සටහන යටතේ දක්වා ඇත.

11. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

ගණකාධිකරණ කාලපරිච්ඡේදයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය හා සෙසු වරප්‍රසාද පහත දක්වා ඇති පරිදි වේ:

අධ්‍යක්ෂවරයෙකුගේ සංවේතනය රු. 4,853,000/-

12. අධ්‍යක්ෂවරුන්ගේ පිළිබැඳියා/ඥාතීන් සම්බන්ධ වන ගණුදෙනු

ඉහත කී ගණුදෙනු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අංක 34 සටහන යටතේ දක්වා ඇත. එහි අනාවරණය කර ඇති බැඳීම් සම්බන්ධයෙන් හැර අන් කවර හෝ සෘජු හෝ වක්‍ර බැඳීම් කිසිවක් අධ්‍යක්ෂවරුන් සතු නොවේ.

13. විගණකයින් සඳහා ගෙවීම්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකයින් සඳහා ගෙවූ හා ගෙවීමට ඇති මුදල රු. 2,469,000/- ක් වේ.

14. පරිත්‍යාග

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම විසින් කිසිදු පරිත්‍යාගයක් සිදුකර නොමැත.

15. සංයුක්ත පාලනය

සංයුක්ත පාලනය පිළිබඳ යහපත් මූලධර්ම ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා සමාගම විසින් පද්ධති හා පටිපාටි ක්‍රියාවට නංවා ඇත. සමාගම තුළ එසේ ක්‍රියාවට නංවා ඇති පරිචයන් පිළිබඳ විශ්ලේෂණයක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 33 සිට 35 දක්වා සඳහන් කර ඇත.

16. විගණන කමිටුව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ:

ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සභාපති)
ජේ.එම්.ශ්‍රූ.පී. ජයමහ මහතා	-	ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)
එම්. ශෙෂ්මින් මන්සූර් මහතා	-	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (සාමාජික)

විගණන කමිටුවේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 48හි දක්වා ඇත.

17. පාර්ශ්වමික කමිටුව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් අයගෙන් සමන්විත වන පරිදි පාර්ශ්වමික කමිටුව ස්ථාපිත කරන ලදී:

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකගේ නම	පත්කළ / ඉවත්කළ දිනය
අතුල සේනානායක මහතා (සභාපති)	2016.04.28 දින සිට පත් කරන ලදී
දිනුක් කොළඹගේ මහතා (සාමාජික)	2016.04.28 දින සිට පත් කරන ලදී
ඩබ්.එස්.එල්.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා	2016.04.28 දින සිට පත් කරන ලදී
ක්‍රිෂාන්ත කුරේ මහතා	2017.01.16 දින සිට පත් කරන ලදී

18. ප්‍රාග්ධන පිරිවැය

ප්‍රධාන ප්‍රාග්ධන ප්‍රයාපන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශයේ 31 සටහනේ දක්වා ඇත.

19. දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශයේ 12 සටහනේ දක්වා ඇත.

20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.20,466,456,858/- ක් වූ අතර එකක් රු. 10ක් වන සාමාන්‍ය කොටස් 2,046,645,686කින් එය සමන්විත විය.

21. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ කටයුතු පිළිබඳ සැබෑ හා සාධාරණ අදහසක් ප්‍රකාශවන පරිදි එහි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට හා 2017 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස් කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂවරු අදහස් කරති. ඒ අනුව, මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ මඟින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ කටයුතු පිළිබඳවත්, එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය පිළිබඳවත් සැබෑ හා සාධාරණ අදහසක් ප්‍රකාශවන බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වී සිටිති.

22. ව්‍යවස්ථාපිත ගෙවීම්

සිය අවබෝධය හා විශ්වාසයේ තරමට රජයට සහ සමාගමේ සේවකයන්ට මේ දක්වා ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වී සිටිති.

23. ශේෂ පත්‍ර සැකසීමට පසු සිදුවීම්

ගිණුම්වල 30 සටහනේ දක්වා ඇති සිදුවීම් හැර ශේෂ පත්‍ර දිනට පසුව අද්දාළ ගිණුම්වල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කළ යුතු කිසිදු සිදුවීමක් සිදු වී නොමැත.

24. විගණකවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ප්‍රකාර විගණකාධිපතිවරයා සමාගමේ විගණක වශයෙන් තවදුරටත් ක්‍රියා කරයි.

25. රැස්වීම් පිළිබඳ නිවේදන

සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය වාර්ෂික වාර්තාවේ පිටු අංක 80හි දක්වා ඇත.

හෝටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



ධණුක රන්පිත් සමරසිංහ
අධ්‍යක්ෂ



දිනුක් කොළඹගේ
අධ්‍යක්ෂ



සීමාසහිත එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම
සමාගම් ලේකම්වරු

2018 ජූලි මස 23 දින
කොළඹ දී ය.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති සහ 2017 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස් කර ඉදිරිපත් කරනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ මඟින් සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් පිළිබඳවත්, සමාගමේ ස්ථාවරත්වය පිළිබඳවත්, සැබෑ හා සාධාරණ අදහසක් ප්‍රකාශ වේ.

ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීම පිණිසත්, නිරවද්‍ය වාර්තා පවත්වා ගැනීමට පහසුකම් සැලසීම පිණිසත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පද්ධති හා පටිපාටි ක්‍රියාවට නංවා ඇත.

යෝග්‍ය ගණකාධිකරණ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබ ඇත.

ජාත්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාවට නංවා ඇත.

සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමටත්, අවංකභාවය හා නිරවද්‍යභාවය තහවුරු කිරීමටත්, මෙහෙයුම් දැත්ත ආරක්ෂාකර ගැනීමටත්, වංචනික ක්‍රියා හා වෙනත් අක්‍රමිකතා අනාවරණය කරගැනීම හා වැළැක්වීමටත් සියලු සාධාරණ පියවරයන් ගෙන ඇති බවට අධ්‍යක්ෂවරු විශ්වාසය පළ කරති.

සිය අවබෝධයට අනුව, ශේෂ පත්‍ර දිනට සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු, තීරුබදු, හා ගාස්තු ගෙවා නිමකර ඇති බව නැතහොත් අදාළ පරිදි සලසාදී ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කර සිටිති.

සමාගමේ මූල්‍ය හා වෙනත් වාර්තා විගණකාධිපති විසින් පරීක්ෂාකර බලා ඇත. විගණකවරුන්ගේ මතය ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

ධණුක රන්පිත් සමරසිංහ
අධ්‍යක්ෂ

දිණුක් කොළඹගේ
අධ්‍යක්ෂ

2018 ජූලි මස 23 දින
කොළඹ දී ය.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු ප්‍රඥප්තිය මඟින් ලබාදී ඇති අධිකාරී බලය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු-කමිටුවක් ලෙස විගණන කමිටුව ක්‍රියාත්මක වන අතර, සමාගමේ මූල්‍ය කටයුතු වලට අදාළ සෑම කරුණක්ම පරීක්ෂාකර බලා මූල්‍ය වාර්තා සමාලෝචනය හා අධීක්ෂණය විගණන කමිටුව ඉටු කරයි.

විගණන කමිටුවේ භූමිකාව

පහත සඳහන් කරුණු වලට අදාළව මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය තහවුරු කිරීමේ සිය වගකීම් ඉටුකිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන ඵලදායී අනු-කමිටුවක් සේ විගණන කමිටුව ක්‍රියා කරයි:

- සමාගමේ මූල්‍ය ප්‍රකාශයේ සහ සමාගමේ අභ්‍යන්තර විගණනය හා මූල්‍ය පාලන පද්ධතිවල අවංකභාවය
- අභ්‍යන්තර විගණකයන්ගේ කාර්යසාධනය
- සමාගමේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ වාර්ෂික ස්වාධීන විගණනය
- අභ්‍යන්තර හා බාහිර විගණකයන්ගේ වාර්තා අපක්ෂපාතී සමාලෝචනය
- ව්‍යවස්තාපිත අවශ්‍යතාවන්ට සමාගමේ අනුකූලතාව
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ දැඩිව පිළිපැදීම

විගණන කමිටුවේ සංයුතිය:

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ:

- ප්‍රවීර සමරසිංහ මහතා (සභාපති) (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- එම්. ශෙෂ්මින් මන්සූර් මහතා (ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ)
- ප්‍රියන්ත ජයමහ මහතා (විධායක නොවන අධ්‍යක්ෂ හා භාණ්ඩාගාර නියෝජිත)

ප්‍රවීර් සමරසිංහ මහතා ශ්‍රී ලංකාවරලත් ගණකාධිකරණ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරියෙකි. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු දරමින් වසර 30කට අධික වෘත්තීයමය හා වාණිජ කටයුතු පිළිබඳ අත්දැකීම් ඔහු ලබා ඇත.

ජේ.එම්.ඌ.පී. ජයමහ මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙක් වන අතර රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වසර ගණනාවක අත්දැකීම් ලබා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශ්‍රාස්ත්‍රපති උපාධිධාරියෙක් වන ජයමහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රධාරී සහතිකය ද හිමිකරගෙන සිටී.

ශෙෂ්මින් මන්සූර් මහතා එක්සත් ජනපදයේ ඇරිසෝනා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයෙන් සැපයුම් දාම කළමනාකරණය සිය ප්‍රධාන විෂය ලෙස හදාරමින් විද්‍යාවේදී උපාධිය ලබාගත්තේය. උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් හිමිවූ අතර සුවිශේෂී අධ්‍යාපන ප්‍රතිඵල වෙනුවෙන් හිමිවන ගෞරවනීය අංශාධිපති ලැයිස්තුවේ ඔහුගේ නම ඇතුළත් විය.

විගණන කමිටු රැස්වීම්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 4ක් පවත්වන ලදී, නිසි බලධාරී, අධ්‍යක්ෂ මණ්ඩල උපදේශක, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, හොටේල් ඩිවෙලොපර්ස් සමාගමේ ගණකාධිකාරී, සාමාන්‍යාධිකාරී සහ හිල්ටන් කළම්බෝ හෝටලයේ මූල්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණක - අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය, බාහිර විගණකගේ නියෝජිතයන්, සහ හිල්ටන් කළම්බෝ හෝටලයේ කළමනාකරණ විගණකවරුන් ආරධනාව මත විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූහ.

බාහිර විගණකයින් වෙනස් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය බලාත්මක කිරීමත් සමඟ විගණකාධිපතිවරයා වර්ෂ 2016 සිට සමාගමේ බාහිර විගණක බවට පත්විය. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී, එවක් පටන් විගණකාධිපතිවරයාගේ නියෝජිතයා විගණන කමිටු රැස්වීම්වලට නිරීක්ෂකයෙක් ලෙස සහභාගී වෙමින් සිටී.

අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනයි

විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණක, අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනය විසින් හෝටලයේ මෙහෙයුම් පිළිබඳව සවිස්තර විගණනයක් සිදු කරන ලදී, අභ්‍යන්තර විගණනයේ අරමුණ වූයේ කළමනාකාරිත්වය විසින් ස්ථාපිත කළ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීමත්, අදාළ කර්තව්‍ය පිළිබඳ වගකීම උසුලන කාර්ය මණ්ඩලය කොතෙක් දුරට එකී පාලන පද්ධති වලට අනුකූලව කටයුතු කරන්නේ දැයි නිශ්චය කිරීමත් ය. අභ්‍යන්තර විගණකයන්ගේ වාර්තාවේ අන්තර්ගතය හා නිගමන පිළිබඳව කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කොට, කාලීන පදනමකින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර එවැනි වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

තෛමාසික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය

විගණන කමිටුව විසින් සමාගමේ තෛමාසික මූල්‍ය ප්‍රකාශ කොළඹ කොටස් හුවමාරුවට (CSE) නිකුත් කිරීමට පෙරාතුව සමාලෝචනය කර, අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරනු ලැබේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති / ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS/ SLFRS) අනුගමනය කිරීම

මේ දක්වා වූ අදාළ සෑම කාලවකවානුවක් සම්බන්ධයෙන්ම සමාගම විසින් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සමඟ ඒකාබද්ධ කිරීමෙන් පසුව, පැවති/ නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති SIFRS සහ IKAS (මෙම වාර්තාවේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යනුවෙන් සඳහන් කරනු ලැබේ.) යනුවෙන් හඳුන්වනු ලැබූ අතර 2012 අප්‍රේල් 01 දින සිට ආරම්භවන මූල්‍ය කාල පරිච්ඡේදවල සිට ක්‍රියාත්මක වන පරිදි එකී / ප්‍රතිශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සමාගමට අනිවාර්ය විය. මෙම නව/ප්‍රතිශෝධිත මූල්‍ය වාර්තාකරණ රාමුව සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශවල පිළිගැනීමේ, මැණීමේ හා අනාවරණය කිරීමේ පදනම් සංශෝධනය කිරීම අවශ්‍ය වූ අතර, එකී කරුණු නිසි පරිදි අවධානයට ලක් කර, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ ඒ අනුව සම්පාදනය ඇත.

මෙම නව/ප්‍රතිශෝධිත ගණකාධිකරණ ප්‍රමිති යොදා ගැනීම මඟින් සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට සිදුවූ බලපෑම 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විගණකාධිවරයා විසින් විගණනය කරන ලදී.

අනුකූලතා ප්‍රකාශ සමාලෝචනය

සමාගම අදාළ සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව ක්‍රියාකරන බව තහවුරු කිරීම සඳහා කමිටුව විසින් අදාළ අනුකූලතා ප්‍රකාශ සමාලෝචනය කරන ලදී. ඊට අමතරව, සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණවල අනුව කටයුතු කරන බවට කමිටුව සැහිමට පත්ව සිටී.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශය සමාලෝචනය

හිල්ටන් කළමිබෝ හෝටලයේ විගණන කමිටුව, බාහිර විගණකයන්, අභ්‍යන්තර විගණකයන් හා කළමනාකරණ විගණකයන් සමග එක්ව සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කරන ලදී. එහිදී විගණන කමිටුවට අවශ්‍ය තහවුරු කිරීම් හා ප්‍රකාශ ප්‍රධාන විධායක නිලධාරී විසින් ලබාදෙන ලදී. ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 2007 අංක 07 දරන සමාගම් පනතින් නියමකර ඇති තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා විගණන කමිටු සමාලෝචනය පහසුකම් සලසන ලද අතර එදිනට සමාගමේ ස්ථාවරත්වය පිළිබඳවත්, සමාලෝචිත වර්ෂයේ සමාගමේ කටයුතු පිළිබඳවත් සත්‍ය වූ හා යුක්ති සහගත වූ අදහස් දැක්වීමක් එමඟින් සිදු විය.

නිගමනය

සමාගමේ වත්කම් සහ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ලැබ ඇති බවත්, විගණනය කරන ලද ගිණුම්වල අනාවරණයකර ඇති මූල්‍ය ප්‍රතිඵල සැලකියයුතු අව-ප්‍රකාශ වලින් තොර වන බවත් විගණන කමිටුව අදහස් කරයි.

ප්‍රවීර් සමරසිංහ
සභාපති
විගණන කමිටුව

2018 ජූලි මස 23 දින දී ය.

මූල්‍ය වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/සී/එච්ඩීඑල්/1/17/එෆ්ජ්-01 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූලි 03 දින

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ කොටස් හිමියන් වෙත

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අවධාරණය කළ යුතු කරුණු

සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,986,019,251 ක වත්කම් පිළිබඳව දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 12.3 ට අවධානය යොමු කරවමි. වරලත් තක්සේරුකරුවෙකුගේ සහාය ඇතිව සමාගම එක් එක් සහ සෑම වත්කමක් සම්බන්ධයෙන්ම සවිස්තරාත්මක වත්කම් සත්‍යාක්ෂණයක් සහ තක්සේරු කිරීමක් සිදුකර තිබුණු අතර එම පැවරුම් එහි අවසන් සංසන්දනය කිරීමේ අදියරට පැමිණ තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.



අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

වාර්ෂික වාර්තාව 2017
තොරෙල් බිම්බොපර්ස් (ලංකා) පිවුළිසි

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

		දිනෙන් අවසන් වර්ෂය සඳහා	
		31.12.2017	31.12.2016
	සටහන්	රු. '000	රු. '000
ආදායම	05	3,015,362	2,540,680
විකිණුම් පිරිවැය		(550,824)	(440,698)
දළ ලාභය		2,464,538	2,099,982
ආයෝජන ආදායම	06	25,533	27,575
වෙනත් ලාභ හා අලාභ	07	29,429	39,914
පරිපාලන වියදම්		(1,491,586)	(1,331,329)
ක්ෂය කිරීම්		(461,542)	(368,254)
වෙනත් වියදම්		(383,491)	(294,905)
මූල්‍ය පිරිවැය	08	(9,905)	(38)
බදු පෙර ලාභය	09	172,976	172,945
ආදායම් බදු වියදම	10	85,041	(31,933)
අදාළ කාලය සඳහා බදු පසු ලාභය		258,017	141,012
වෙනත් විස්තීර්ණ ආදායම්			
සේවක ප්‍රතිලාභ බැඳීම් මත අයුගණක ලාභ (අලාභ)		2,415	(5,065)
අදාළ කාලය සඳහා මුළු විස්තීර්ණ ආදායම /වියදම		260,431	135,947
කොටසක ඉපැයීම් - මූලික (රු.)	11	0.13	0.07

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 5 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අනුකල අංගයන් වේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්		31.12.2017 දිනට රු. '000	31.12.2016 දිනට රු. '000
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	12	7,818,434	7,449,712
කල් බදු ඉඩම්	13	6,610,530	6,681,237
නොනිමි ප්‍රාග්ධනය		243,414	215,747
මුළු ජංගම නොවන වත්කම්		14,672,378	14,346,696
ජංගම වත්කම්			
භාණ්ඩ තොගය	14	58,009	51,488
ලැබිය යුතු වෙළඳ හා වෙනත් ශේෂ	15	151,640	148,843
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්	16	1,354	1,767
වෙනත් වත්කම්	17	183,520	216,145
ජංගම මූල්‍ය වත්කම්	18	135,608	202,660
මුදල් හා බැංකු ශේෂ	19	225,599	395,104
මුළු ජංගම වත්කම්		755,730	1,016,007
මුළු වත්කම්		15,428,109	15,362,703
කොටස් හිමියන්ගේ ස්කන්ධය හා වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	20	20,466,456	20,466,456
සංචිත	21	161,348	21,896
උපචිත අලාභය		(6,594,476)	(6,715,455)
මුළු ස්කන්ධය		14,033,329	13,772,897
දිගුකාලීන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	22	122,581	125,326
විලම්බිත බදු වගකීම්	23	396,570	499,215
රාඳවාගැනීමේ ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය		-	103,208
මුළු අජංගම වගකීම්		519,152	727,749
ජංගම වගකීම්			
ගෙවිය යුතු වෙළඳ හා වෙනත්	24	479,574	511,209
සම්බන්ධිත පාර්ශවයකට ගෙවිය යුතු මුදල්	25	12,558	10,598
රාඳවා ගැනීමේ ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය		111,028	-
බැංකු අයිරාව		272,468	340,250
මුළු ජංගම වගකීම්		875,628	862,057
මුළු වගකීම්		1,394,780	1,589,806
මුළු ස්කන්ධය හා වගකීම්		15,428,109	15,362,703
කොටසක ශුද්ධ වත්කම - (රු.)		6.86	6.73

2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇති බව මම සහතික කරමි.

මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2018 මැයි මස 28 වන දින අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ *අධ්‍යක්ෂ*

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 35 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අනුකල අංගයන් වේ.

ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශික ප්‍රාග්ධනය	ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපන සංචිතයි	උපචිත අලාභ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
2016 ජනවාරි 01 දිනට ශේෂය	20,466,456	117,421	(6,946,927)	13,636,951
මාස 12 කාලය තුළ ලාභය	-	-	141,012	141,012
සේවක ප්‍රතිලාභ මත ආයු ගණන ලාභය/අලාභය බැඳීම්, ශුද්ධ බදු - අලාභය			(5,065)	(5,065)
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය	-	(203,914)	203,914	-
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ මාරු කිරීම ප්‍රතිෂ්ඨාපනය	-	108,389	(108,389)	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	20,466,456	21,896	(6,715,455)	13,772,897
මාස 12ක කාලය සඳහා ලාභය	-	-	258,017	258,017
සේවක ප්‍රතිලාභ මත ආයුගණන ලාභය/අලාභය බැඳීම්, ශුද්ධ බදු - අලාභය	-	-	2,415	2,415
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය	-	(128,983)	128,983	-
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ මාරු කිරීම ප්‍රතිෂ්ඨාපනය	-	268,435	(268,435)	-
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	20,466,456	161,348	(6,594,476)	14,033,329

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 35 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අනුකල අංගයන් වේ.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	දිනෙන් අවසන් වර්ෂය සඳහා	
	31.12.2017	31.12.2016
	රු.'000	රු.'000
බදු පෙර ලාභය	172,976	172,944
ගැලපීම්		
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	461,542	368,254
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	22,576	18,307
බිඳවැටීම සඳහා ප්‍රතිපාදන	1,329	(98)
පොළී වියදම්	9,905	38
දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් ලද ලාභය	(6,620)	(4,238)
ණයගැතියන්ගේ අපහායනය	-	(9,158)
උපලබ්ධි නොවූ විනිමය ලාභ	(884)	(9,428)
පොළී ආදායම	(25,533)	(27,575)
කාර්ය ප්‍රාග්ධන වෙනස්වීම් වට පෙර මෙහෙයමු ලාභය	635,291	509,047
භාණ්ඩ තොගවල වැඩිවීම් / අඩුවීම්	(6,521)	(13,378)
ලැබිය යුතු මුදල් වැඩිවීම / අඩුවීම	(2,797)	10,551
සම්බන්ධිත පාර්ශ්ව වෙත ගෙවිය යුතු මුදල් වැඩිවීම / අඩුවීම	2,373	(6,872)
වෙනත් වත්කම් වැඩිවීම් / අඩුවීම	(2,570)	191,714
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් වැඩිවීම / අඩුවීම	(32,963)	114,162
මෙහෙයුම් මඟින් උපයාගත් මුදල්	592,813	805,223
ගෙවූ බදු	(20,737)	(45,366)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම	(22,907)	(2,571)
මෙහෙයුම් කාර්යයන් මඟින් උපයාගත් ශුද්ධ මුදල	549,169	757,286
ආයෝජන කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය		
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(111,128)	(181,729)
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්වල ආයෝජන	(629,947)	(1,325,914)
දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ආදායම	6,620	4,238
මූල්‍ය වත්කම්වල ආයෝජන	-	561,334
ලද පොළී ආදායම	25,533	27,575
ආයෝජන කාරයන් සඳහා යෙදවූ ශුද්ධ මුදල	(708,923)	(914,495)
මූල්‍යකරණ කාර්යයන්හි මුදල් ප්‍රවාහය		
මූල්‍ය පිරිවැය	(9,905)	(38)
මූල්‍යකරණ කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල	(9,905)	(38)
මුදල් හා මුදල් හා සම වත්කම්වල ශුද්ධ වැඩිවීම /අඩුවීම	(169,659)	(157,247)
වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල් හා සම වත්කම් (සටහන 27.1)	258,398	414,761
වර්ෂ අවසානයේදී මුදල් හා මුදල් හා සම වත්කම් (සටහන 27.2)	**88,739**	257,514

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 35 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ අනුකල අංගයන් වේ.

1. සමායතන තොරතුරු

1.1 පොදු තොරතුරු

හොටේල් ඩිවේලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර, පවත්වාගෙන යනු ලබන සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 02, ශ්‍රීමත් විත්තප්පලම් ගාර්ඩිනර් මාවත, කොළඹ 2 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

හොටේල් ඩිවේලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතු වල නිරත වී ඇති අතර හිල්ටන් කළමිබෝ හෝටලයේ හිමිකාරිත්වය උසුලයි.

1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මැයි මස 28 වන දින මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

2. මෙහෙයුම් පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස් ප්‍රාග්ධනයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, සහ ගණකාධිකරණ ප්‍රතිපත්ති හා සටහන්), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද පොදුවේ SIFRS යයි කියනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති වලට හා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව සම්පාදනය කරනු ලැබ ඇත.

2.2 මිණුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත සඳහන් වැදගත් අයිතමයන් හැර සෙසු මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස්කර ඇත:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ආධීනතාව වත්මන් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ අගය ලෙස පිළිගැනුලැබේ.

2.3 ක්‍රියාකෘත විනිමය හා ප්‍රදර්ශක විනිමය

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති අතර එය සමාගමේ ක්‍රියාකෘත විනිමය ඒකකය මෙන්ම ප්‍රදර්ශක විනිමය ඒකකය ද වේ. ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති සියලුම මූල්‍ය තොරතුරු, අන්‍යාකාරයෙන් දක්වා නොමැති නම් ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4 තුලනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳ LKAS 01 අනුව සමාගම විසින් ගණකාධිකරණ ප්‍රතිපත්ති පූර්ව මූල්‍ය ප්‍රකාශ සමග නිරන්තරයෙන් අදාළ කරගනු ලැබීය.

2.5 වාස්තවිකතාව සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳ LKAS 01 අනුව, වැදගත් එක් එක් සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශ වල වෙන වෙනම දක්වා ඇත. එකිනෙකට වෙනස් ආකාරයේ හෝ කාර්යය සඳහා වූ අයිතමයන් වැදගත් වන පරිදි වෙන වෙනම දක්වා ඇත.

හඳුනාගත් අගයන් හිලවි කිරීමට නෛතික අයිතිය ඇති අවස්ථා සම්බන්ධයෙන් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එකිනෙකට හිලවිකර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර ශුද්ධ පදනමින් පියවා දැමීමට හෝ වත්කම් උපලබ්ධි කොට, ඊට සමගාමීව වගකීම් පියවා දැමීමට අපේක්ෂා කර ඇත.යම් ගණකාධිකරණ ප්‍රමිතියක් මඟින් හෝ අර්ථ නිරූපණයක් මඟින් නියමකර හෝ අවසර ලබාදී ඇත්නම් මිස, ගණකාධිකරණ ප්‍රතිපත්තිවල නිශ්චිතව අනාවරණය කර ඇති පරිදි, විස්තීරණ ආදායම් ප්‍රකාශයේආදායම් හා වියදම් හිලවිකර නොමැත.

3. විශේෂිත ගණකාධිකරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අනාගතය පිළිබඳව ඇතැම් විචක්ෂණ ගණකාධිකරණ උපකල්පන යොදා ගැනීමට සිදුවේ. තවද, එහිදී ආදායම, වියදම, වත්කම් හා වගකීම් පිළිබඳ වාර්තාගත අගයන්ට සහ වාර්තාගත කෙරෙන කාල පරිච්ඡේදය අවසානයේදී අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම සඳහා බලපෑම් ඇතිකරවන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. කෙසේ වුවද, මෙම උපකල්පනවල හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව හේතුවෙන් හටගන්නා ප්‍රතිඵල මඟින් මෙම වත්කම් හෝ වගකීම් වල අනාගත කාල ධාරණ පිරිවැය සඳහා ගැලපීම් සිදු කිරීමට සිදු විය හැකි ය. එබැවින්, මෙම තීරණ හා ඇස්තමේන්තු වලින් සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල වෙනස් විය හැකි ය.

සමාගමේ ගණකාධිකරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ ක්‍රියාවලිය තුළ කළමනාකාරිත්වය විසින් පහත සඳහන් තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරන ලද, අතර එමඟින් මූල්‍ය ප්‍රකාශවල පිළිගත් අගයන් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකර තිබේ:

අ) බදුකරණය

ආදායම් බදු සහ එකතුකළ අගය මත (වැට්) බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළු වෙනත් බදු ගෙවීමට සමාගම යටත් වන අතර, මූල්‍ය ප්‍රකාශවල SIFRS ප්‍රමිතිය අදාළකර ගැනීම පිළිබඳ, බදු මාර්ගෝපදේශ නිකුත් කරනු ලබන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා වෙන් කළයුතු මුළු ප්‍රතිපාදන සහ බදු පැහැදීමේ කාර්යය සඳහා බදු අයකළහැකි ලාභය නිශ්චය කිරීම සඳහා විශේෂිත තීන්දු තීරණ ගැනීම අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලද කාලවකවානු වල බදු නීති අදාළකර ගැනීම පිළිබඳ, අර්ථ නිරූපණ සම්බන්ධයෙන් යම් යම් අවිනිශ්චිතතා පැවතියේය.

අතිරේක බදු ගෙවීමට සිදුවේයැයි අනුමාන කරන ඇස්තමේන්තු මත පදනම්ව සමාගම විසින් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදුවලට අදාළව වත්කම් හා වගකීම් හඳුනාගනු ලැබේ. මූලිකව වාර්තා කළ අගයන්ගෙන් අවසන් බදු ප්‍රතිඵලය වෙනස්වන අවස්ථාවලදී, එම වෙනස මඟින් ආදායමට හා එම තීරණය කරනු ලැබූ කාලයට අදාළ විලම්බිත වෙනත් බදු අගයන්ට බලපෑමක් ඇති වේ.

ආ) දේපළ, පිරිවිතර හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමාගම විසින් එක් එක් වාර්තාකරණ දිනයකදීම ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීව කාලය හා වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමවේදි සමාලෝචනය කරනු ලැබේ. මෙකී අගයන්, ගාස්තු ප්‍රමාණ, ක්‍රමවේදි පිළිබඳව ඇස්තමේන්තු කිරීමේදී, කළමනාකාරිත්වයේ තීන්දු තීරණ ක්‍රියාවට නංවනු ඇති අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවට බඳුන් වේ.

ඈ) ව්‍යාපාරයේ අඛණ්ඩතාව

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරු කර ඇති අතර පැහැදිලිව පෙනෙන අනාගතය කරා සිය ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සියලු සම්පත් සමාගම සතුවන බවට ඔවුනු සෑහීමට පත්ව සිටිති. තවද, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස සමාගම අඛණ්ඩව පවත්වාගැනීමේ හැකියාව පිළිබඳ කිසියම් සැකයක් ජනිත කරවන කිසිදු සැලකියයුතු අවිනිශ්චිතතාවක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා අතර සමාගමේ කටයුතු අඩාල කිරීමට හෝ මෙහෙයුම් අවසන් කිරීමට කිසිදු අපේක්ෂාවක් ඔවුන් සතු නොවේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශ තවදුරටත් ව්‍යාපාරයේ අඛණ්ඩතාව පදනම්කර ගනිමින් සිදු කරනු ලැබේ.

ඈ) වත්කම් මත අවකරණ පාඩු

එක් එක් වාර්තා කරන දිනයෙදී හෝ ඊට පෙර දිනකදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කළ යුතු අවකරණ පාඩුවක් සිදුව ඇතිදැයි නිශ්චය කිරීම පිණිස වාස්තවික සාක්ෂි පවතීද යන්න සමාගම තක්සේරු කරයි.

ඉ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

ආයුගණක තක්සේරු කිරීම් උපයෝගීකර ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලැබේ. ආයුගණක තක්සේරු කිරීමකදී, අනාගතයේදී සිදුවන සැබෑ සිදුවීම් වලින් වෙනස් විය හැකි විවිධ උපකල්පන සිදුකළ යුතු වේ. ඒවා අතර වට්ටම් ප්‍රමාණ, ඉදිරි වැටුප් වැඩිවීම්, මාසික ගාස්තු ප්‍රමාණ ආදිය තීරණය කිරීම ඇතුළත් වේ. මෙම තක්සේරුවේ සංකීර්ණතාව, ගැබ්වී ඇති උපකල්පන හා ඒවායේ දිගුකාලීන ස්වභාවය හේතුවෙන් මෙකී උපකල්පන හමුවේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වහා වෙනස්වන සුළු වේ. මෙම සියලුම උපකල්පන සෑම වාර්තා කරන දිනයකදීම සමාලෝචනය කෙරේ.

යෝග්‍ය වට්ටම් අනුපාතික තීරණය කිරීමේදී, නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ අපේක්ෂිත කාල පරිච්ඡේදයට අනුරූපී බහිරනිවේශිත කල්පිරීම් සහිත ශ්‍රී ලංකා රජයේ බැදුම්කර වල යෙදවීම කළමනාකාරිත්වය විසින් සලකා බලනු ලැබේ. මෙහිදී මාර්ගතා අනුපාතය තීරණය කිරීමට පොදු මාර්ගතා වගු පාදක කරගනු ලැබේ. ඉදිරි වැටුප් වැඩිකිරීම් සඳහා අපේක්ෂිත ඉදිරි උද්ධමන අනුපාතික හා සමාගමේ අපේක්ෂිත ඉදිරි වැටුප් වර්ධක අනුපාත පාදක කරගනු ලැබේ.

4. විශේෂිත ගණකාධිකරණ ප්‍රත්පත්ති පිළිබඳ සාරාංශය

ස්වකීය මූලය ප්‍රකාශ සකස් කිරීමේදී සමාගම විසින් අනුගමනය කරනු ලබන විශේෂිත ගණකාධිකරණ ප්‍රත්පත්ති වලට පහත සඳහන් ප්‍රත්පත්ති ඇතුළත් වේ. අන්‍යාකාරයෙන් දක්වා නොමැති නම්, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති කාල පරිච්ඡේද සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ගණකාධිකරණ ප්‍රත්පත්ති නිරන්තරයෙන් අදාළ කරගන්නා ලදී.

4.1 ආදායම් ගණනය කිරීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ අත්වනු ඇති බවට සම්භාවිතාවක් පැවතීම හා ආදායම හා ඒ සඳහා දැරූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් මැණීමට හැකිවීම යන පමණට ආදායම ගණනය කරනු ලැබේ. වෙළඳ වට්ටම් හා විකිණුම් බදු අඩුකර ලද හෝ ලැබීමට ඇති ප්‍රතිශ්ධාවේ සාධාරණ අගය මත ආදායම ගණනය කරනු ලැබේ. ආදායම් ගණනය කිරීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිත කෙරේ.

අ) සේවා

සේවා සැපයීමෙන් ලද ආදායම් එම සේවා සැලසූ හෝ ක්‍රියාත්මක කළ ගණකාධිකරණ කාල පරිච්ඡේදයට අදාළ වන සේ ගණනය කරනු ලැබේ.

ආ) කාමර හා අලෙවිසල් ආදායම

කාමරවල වාසය කිරීම් දෛනික පදනමක් මත කාමර ආදායම ද ආහාර හා පාන ආදායම ඒවා අලෙවි කරන මොහොතේදීම ගණනය කරනු ලැබේ.

ඇ) පොළී ආදායම්

සඵල පොළී අනුපාතික (EIR) ක්‍රමවේදය උපයෝගීකර ගනිමින් පොළී ආදායම් ගණනය කරනු ලැබේ.

ඈ) කුලී ආදායම්

උපචිත පදනමක් මත කුලී ආදායම් ගණනය කරනු ලැබේ.

4.2 වියදම් ගණනය කිරීම

දැරූ පිරිවැය හා ආදායමේ නිශ්චිත අයිතමයන්ගේ ඉපැයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම්කර ගනිමින් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ගණනය කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වා ගැනීම හා හෝටල් දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා දැරූ සියලු පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හරකර ඇත.

විස්තීරණ ආදායම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ කාර්යසාධන මූලිකාංග යම්කාත් දුරට එමඟින් නිරූපනය වන්නේය යන පදනමින් "වියදම් කාර්යභාර" ක්‍රමවේදය උපයෝගී කරගනී.

ආදායම් බදු වියදම ප්‍රවර්තන හා විලම්බිත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගණනයකර දක්වා ඇත.

4.3 බදුකරණය

4.3.1 ප්‍රවර්තන බදු

ප්‍රවර්තන වර්ෂයට අදාළව හා පූර්ව වර්ෂ සම්බන්ධයෙන් ගෙවියයුතු බදුවල කවර හෝ ගැලපීමකට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් අයකර ගැනීමට හෝ ඔහුට ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණවලින් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. වාර්තාකරන දිනට පනවා ඇති හෝ සාරානුකූලව පනවා ඇති අනුපාතික හා බදු නීතිබදු මුදල් ගණනය කිරීම සඳහා උපයෝගීකර ගන්නා බදු අනුපාතික හා බදු නීති වේ.

4.3.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරන කාර්යය සඳහා වත්කම් හා වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තාකරන කාල පරාසයේ දිනට පවතින තාවකාලික වෙනස්කම් පිළිබඳ ආධීනතා ක්‍රමවේදය යොදාගනිමින් විලම්බිත බදු සඳහා විධිවිධාන සලසනු ලැබේ.

අඩුකළ හැකි සියලු වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. අඩුකළ හැකි සියලු තාවකාලික වෙනස්කම් හා ප්‍රයෝජනයට නොගත් බදු බැරකිරීම් සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙනයාම් ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි බදු අයකළ හැකි ලාභ පවතීමට ඇති සම්භාවිතාවේ ප්‍රමාණයට පමණක් ප්‍රයෝජනයට නොගත් බදු බැරකිරීම් සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙනයාම සිදු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කමක ධාරණ අගය සෑම වාර්තා කරන දිනකදීම සමාලෝචනය කර, විලම්බිත බදු වත්කම සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් හෝ භාවිත කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් බදු අය

කළ හැකි ලාභ තවදුරටත් පැවතීමේ සම්භාවිතාවක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තා කරන දිනකදීම නැවත තක්සේරුකොට, ඉදිරියෙදී බදු අය කළ හැකි ලාභ මඟින් විලම්බිත බදු වත්කම නැවත අයකරගැනීමට අවකාශ සැලසීමේ සම්භාවිතාවේ ප්‍රමාණයට හඳුනාගනු ලැබේ. වාර්තාකරන දිනය වන විට පනවනු ලැබ ඇති හෝ තදනන්තරව පනවනු ලබන බදු අනුපාතික හා බදු අණපනත් පදනම්කර ගනිමින් වත්කම් උපලබ්ධි වීමේදී හෝ වගකීම් පියවීමේදී අදාළකර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතික මත විලම්බිත බදු වත්කම් හා වගකීම් තක්සේරු කරනු ලැබේ.

4.4 මූල්‍ය නොවන වත්කම්

4.4.1 දේපළ, පිරියත හා උපකරණ

අ) හඳුනාගැනීම සහ තක්සේරු කිරීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇත්නම්, සහ දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ LKAS 16 - ප්‍රමිතියට අනුව වත්කමේ පිරිවැය විශ්වසනීය ආකාරයෙන් මැණිය හැකිනම් දේපළ, පිරියත හා උපකරණ පිළිගනු ලැබේ. දේපළ හා උපකරණ ආරම්භයේදී පිරිවැයට අනුව හඳුනාගනු ලැබේ.

පිරිවැය ආකෘතිය

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ එදිනෙදා සේවාකිරීම් පිරිවැය හැර උපචිත ක්ෂය හා උපචිත අවකරණ අඩුකොට, පිරිවැය අගය මත දක්වා ඇත. එම පිරිවැයට උපකරණවල කොටස් අලුතින් සවිකිරීම් සිදුකළ විට අදාළ පිළිගැනුම් නිර්ණායක සපුරා ඇත්නම්, එම පිරිවැය ද ඇතුළත් වේ.

තදනන්තර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගැනීම හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ශක්තිය වර්ධනය කිරීම පිණිස ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, ව්‍යාප්ත කිරීම, හෝ වැඩි දියුණු කිරීම සඳහා තදනන්තරව දරන ලද පිරිවැය ප්‍රාග්ධන පිරිවැය ලෙස සැලකෙන අතර එවැනි පිරිවැය වත්කමක ධාරණ අගය තුළ හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ ඒවායේ එදිනෙදා සේවාකිරීම් හා බැඳුණු දරන ලද පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

ක්ෂය කිරීම්

දේපළේ සහ උපකරණයේ පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවකාලය තුළ ශේෂ වටිනාකම දක්වා අඩුවන පරිදි සෘජු-රේඛා ක්‍රමවේදය භාවිතකොට ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ. ක්ෂය කිරීම් මිලදීගත් දින සිට අපහරණය කරනු ලබන දින දක්වා ප්‍රොරේටි පදනම මත සිදු කරනු ලැබේ. ක්ෂය අනුපාත පහත සඳහන් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවකාල මත පදනම් වේ:

වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
පිරියත හා උපකරණ	7.5
ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ	7.5
පරිගණක හා රූපවාහිනී	20
මෝටර් රථවාහන	25
ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ	10
මෙහෙයුම් උපකරණ	33

වත්කමේශේෂ අගය, ප්‍රයෝජනවත් ජීවකාලය, සහ ක්ෂය ක්‍රමවේදය එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැලපීම් කරනු ලැබේ.

හඳුනාගැනීම ඉවත්කිරීම

දේපළ, පිරියත හා උපකරණ ඒවා අපහරණයෙන් පසුව හෝ එය භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකෙරෙ නම් තවදුරටත් ඒවා හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. වත්කම් හඳුනා ගැනීම ඉවත් කිරීම මඟින් ඇතිවන කවර හෝ ලාභය හෝ අලාභය (ශුද්ධ අපහරණ ප්‍රතිශ්ධාවේ හා වත්කමේ ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලබන වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනු ලැබ ඇත.

4.4.2 අමූල්‍ය වත්කම් අවකරණය

සමාගම විසින් එක් එක් වාර්තාකරන දිනයේදී යම් වත්කමක් අවකරණය කළහැකිවන යම් සංඥාවක් වේ ද යන්න තක්සේරු කරනු ඇත. යම් සංඥාවක් වෙතොත්, හෝ යම් වත්කමක් පිළිබඳ වාර්ෂික අවකරණ පරීක්ෂාව සිදුකළයුතු වේ නම්, සමාගම විසින් වත්කමේ ලබාගත හැකි අගය තක්සේරු කරනු ලැබේ.

4.5 පෙරගෙවුම් බදු වාරිකය

අදාළ බදු කාල පරිච්ඡේදය වන 99 අවුරුද්ද පුරා බදු ඉඩම සම වාර්ෂික පදනමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. එම ක්‍රමක්ෂය කිරීම 2012 ජූනි මාසයේ සිට ආරම්භව ඉදිරියට කරගෙන යනු ලැබේ.

4.6 ඉන්වෙන්ට්‍රිය

යල්පිණු හා මන්දගාමීව වැයවන අයිතමයන් සඳහා නිසි පරිදි ප්‍රතිපාදන සැලසීමෙන් පසුව පහළයන පිරිවැය මත සහ විකිණීමෙන් ලබාගත හැකි ඇස්තමේන්තුගත ශුද්ධ වටිනාකම මත ඉන්වෙන්ට්‍රි අයිතම තක්සේරු කරනු ලැබේ. විකිණීමෙන් ලබාගත හැකි ශුද්ධ අගය යනු ඉන්වෙන්ට්‍රි අයිතමවල වත්මන් තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැය දැරීමෙන් පසුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ඇතුළත එම භාණ්ඩ විකිණිය හැකි මිල වේ.

ඉන්වෙන්ට්‍රි අයිතමවල එක් එක් කාණ්ඩයේ පිරිවැය බරතැබූ සාමාන්‍යය පදම මත නිශ්චය කරනු ලැබේ.

4.7 මූල්‍ය වත්කම් - හඳුනාගැනීම හා තක්සේරුව

4.7.1 මූලික හඳුනා ගැනීම

සියලුම මූල්‍ය වත්කම් වෙළඳ දින දී එනම් සමාගම අදාළ සාධනපත්‍රයේ ගිවිසුම් ගත විධිවිධාන සඳහා පරශ්වකරුවෙකු වූ දින මූලිකව හඳුනාගනු ලැබේ. "විධිමත් පරිදි සිදුකරන වෙළඳ කටයුතු" එනම් වෙළඳ පොළ තුළ නියාමනය හෝ සම්මුතිය මඟින් පොදුවේ පිහිටුවා ගත් කලරාමුව ඇතුළත ගෙනවිත් භාර දීමට නියමිත මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකිණීම් ඊට අයත් වේ.

4.7.2 මූලික තක්සේරුව

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය එම සාධනපත්‍රවල කාර්යය හා නෛයිසර්ගික ලක්ෂණ සහ ඒවා අත්කර ගැනීමේදී කළමනාකරිත්වයේ අභිප්‍රාය යන කරුණු මත පදනම් වේ. සියලු මූල්‍ය සාධන පත්‍ර ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්තා කරනු ලබන අවස්ථාවන්හි හැර, ගණුදෙනු කිරීමේ පිරිවැය ඇතුළුව ඒවායේ සාධාරණ අගය මත මූලිකව තක්සේරු කරනු ලැබේ.

4.7.3 තදනන්තර තක්සේරුව

ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත වෙළඳාම සඳහා වන මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජන, ණය හා ලැබිය යුතු මුදල් සහ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ආදී ප්‍රවර්ගවලට වර්ගීකරණය කරමින් සමාගම විසින් එකී ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් තදනන්තර වශයෙන් තක්සේරු කරනු ලැබේ.

අ) ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත වෙළඳාම සඳහා වන මූල්‍ය වත්කම් (FVTPL)

යම් මූල්‍ය වත්කමක් වෙළඳාම සඳහා තබා ඇත්නම් හෝ ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත නියම කරනු ලැබ ඇත්නම්, එවැනි මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත වෙළඳාම සඳහා වන මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය කරනු ලැබේ.

ආ) කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය ආයෝජන සාධනපත්‍ර

කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය ආයෝජන යනු ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් හා ස්ථාවර කල්පිරීම් කාල සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර එම වත්කම් කල්පිරීමතෙක් තබාගැනීමට අපේක්ෂාව හා හැකියාව සමාගම සතු වේ. මූලික තක්සේරුවෙන් පසු අවස්ථාවකදී, කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය ආයෝජන, සඵල පොළී අනුපාතිකය (EIR) යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත අවකරණ අඩුකොට නැවත තක්සේරු කරනු ලැබේ.

ඇ) ණය හා ලැබිය යුතු මුදල්

ණය හා ලැබිය යුතු මුදල් වලට විකිණීම සඳහා සක්‍රීය වෙළඳපොලකට ඉදිරිපත් නොකළ ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වන අතර පහත සඳහන් වත්කම් ඊට අයත් නොවේ:

- වහාම හෝ ඉතා ඉක්මණින් විකිණීමට සමාගම අපේක්ෂා කරන සහ මූලික හඳුනාගැනීමෙන් පසුව ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත වෙළඳාම සඳහා වන මූල්‍ය වත්කම් ලෙස සමාගම නම්කරන මූල්‍ය වත්කම්
- මූලික හඳුනාගැනීමෙන් පසුව වෙළඳාම සඳහා පවතින බවට සමාගම නම්කරන මූල්‍ය වත්කම්
- ණය පිරිහීම හේතුවෙන් හැර වෙනත් හේතූන් මත සිය පූර්ණ ආයෝජන මුදල සැලකියයුතු ලෙස ආපසු ලබාගැනීමට සමාගමට නොහැකි වන මූල්‍ය වත්කම්

මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු මුදල් EIR ක්‍රමවේදය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අවකරණ ප්‍රතිපාදන අඩුකර, තක්සේරු කරනු ලැබේ. EIR ක්‍රමවේදයේ අනුකල අංතයක් වන වත්කම අත්කරගැනීමේ කවර හෝ වට්ටම් හෝ පාරිතෝෂික සහ ගාස්තු හා වියදම් පිලිබඳව සැලකිල්ල යොමු කරමින්, ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ඇත. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ "පොළී ආදායම්" යටතේ ක්‍රමක්ෂය කිරීම් ඇතුළත්කර ඇත. අවකරණ පාඩු "ණය හා ලැබිය යුතු මුදල් මත අවකරණ ලාභ/අලාභ" යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබ ඇත.

ණය ඉතා කෙටි කලකින් විකිණීමට අරමුණු කර ඇති බැවින් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කිරීමට අපේක්ෂිත එවැනි ණය බැඳීම් වලට ඇතුළත් වීමට ඇතැම් විට සමාගමට සිදුවිය හැක. මෙවැනි ණය බැඳීම් ව්‍යුත්පන්න ණය ලෙස දැක්වනු ලබන අතර ලාභ අලාභ මත සාධාරණ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. ආයෝජන අඩු කිරීම පිණිස සමාගම විසින් ණය මුදල් කෙටි කාලයකදී විකිණීමෙන් තොරව, රැඳවා ගැනීමට අපේක්ෂා කරන විට එවැනි ණය බැඳීම් අලාභ ලැබීමට තුඩුදිය හැකි දුර්හර ගිවිසුමක් වන්නේ නම් පමණක් ඒවා වර්තා කරනු ලැබේ.

ඈ) විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජන

වෙළඳාම සඳහා හෝ ලාභය හෝ අලාභය මත සාධාරණ පිරිවැයට නම් කරනු ලැබූ හෝ නොවන මූල්‍ය වත්කම් විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජන වශයෙන් දැක්විය හැකිය. සමාගම විසින් කිසිදු ණය මුදලක් හෝ ලැබිය යුතු මුදලක් විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජන ලෙස වර්ගකර නොමැත. මූලික තක්සේරුවෙන් පසුව, විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජන සාධාරණ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. උපලබ්ධි නොවූ ලාභ හා අලාභ කොටස් ප්‍රාග්ධනයේ "විකිණීම සඳහා වන සංචිතය" තුළ (වෙනත් විස්තීරණ ආදායම්) සෘජුව හඳුනාගනු ලබන අතර ආයෝජන අපහරණය කිරීමේදී, ඉන් පෙර කොටස් ප්‍රාග්ධනය තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලැබේ.

4.7.4 මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය

මූලික හඳුනාගැනීමෙන් පසුව, පහත සඳහන් ඇතැම් අවස්ථාවලදී සමාගම විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගය මත වෙළඳාම සඳහා වන මූල්‍ය වත්කම් (FVTPL) හැර සෙසු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරනු ලැබිය හැකිය:

- වෙළඳාම සඳහා වන කාණ්ඩයෙන් ඉවත්කොට විකිණීම සඳහා වන කාණ්ඩයට හෝ ණය හා ලැබිය යුතු හෝ කල්පිරෙන තෙක් තබා ඇති යන කාණ්ඩවලට ප්‍රතිවර්ගීකරණය කිරීම
- විකිණීම සඳහා වන කාණ්ඩයෙන් ඉවත්කොට, ණය හා ලැබිය යුතු කාණ්ඩයට හෝ විකිණීම සඳහා වන කාණ්ඩයට හෝ කල්පිරෙන තෙක් තබා ඇති කාණ්ඩයට එක් කිරීම. ප්‍රතිවර්ගීකරණ දිනයේදී, සාධාරණ පිරිවැයට ප්‍රතිවර්ගීකරණ වාර්තාගත කරන අතර එය නව ක්‍රමක්ෂය අගය බවට පත්වේ. විකිණීම සඳහා වන කාණ්ඩයෙන් ඉවතට යම් මූල්‍ය වත්කමක් ප්‍රතිවර්ගීකරණය කළ විට කොටස් ප්‍රාග්ධනය තුළ හඳුනාගනු ලැබූ එම වත්කම මත අත්වූ පූර්ව ලාභය හෝ අලාභය සඵල පොළී අනුපාතිකය භාවිත කරමින් ආයෝජනයේ ඉතිරි ජීවකාලය තුළ අත්වන ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. එම නව ක්‍රමක්ෂය කළ පිරිවැය හා අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහය අතර වෙනස ද සඵල පොළී අනුපාතිකය භාවිත කරමින් ආයෝජනයේ ඉතිරි ජීවකාලය තුළ අත්වන ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාළ වත්කම පසු අවස්ථාවක අවකරණය කළයුතු බවට තීරණය කළහොත්, එවිට කොටස් ප්‍රාග්ධනයේ වාර්තාකළ අගය විස්තීරණ ආදායම් ප්‍රතාශයේ ඇතුළත් කළ යුතු ය.
- යම් මූල්‍ය වත්කමක් ණය හා ලැබිය යුතු කාණ්ඩයේ අර්ථ නිරූපණයට ගැලපේ නම් හා පෙනෙන අනාගතය තෙක් හෝ කල්පිරෙන තෙක් එය රඳවාගැනීමට අපේක්ෂාව හා හැකියාව සමාගම සතුවේ නම්, එම මූල්‍ය වත්කම වෙළඳාම සඳහා වන කාණ්ඩයෙන් ඉවත්කොට, ණය හා ලැබිය යුතු කාණ්ඩයට ඇතුළු කරනු ලැබේ. යම් මූල්‍ය වත්කමක් ප්‍රතිවර්ගීකරණය කරනු ලැබුවහොත් සහ සමාගම පසු අවස්ථාවක මුදල් ලැබීම් අයකර ගත හැකි බව වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස අනාගත මුදල් ලැබීම් ඇස්තමේන්තු ඉහළ දැමීමට තීරණය කළහොත්, එම වැඩිවීමේ බලපෑම එම ඇස්තමේන්තු සංශෝධනය කළ දින සිට සඵල පොළී අනුපාතයේ ගැලපීමක් ලෙස හඳුනාගනු ලැබේ.

කළමනාකාරිත්වයේ මනාපය පරිදි ප්‍රතිවර්ගීකරණය කරනු ලබන අතර එය එක් එක් සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට පදනම්න් තීරණය කරනු ලැබේ.

4.7.5 මූල්‍ය වත්කම් හඳුනාගැනීම ඉවත් කිරීම

- යම් වත්කමින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය කල් ඉකුත්වූ විට;
- වත්කමින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට සමාගමට ඇති අයිතිය සමාගම විසින් පවරාදුන් විට හෝ ගිවිසුමෙන් ඔබ්බට යන වැඩපිළිවෙලක් මඟින් වත්කමින් ලැබෙන මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන් කිසිදු සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවැනි පාර්ශ්වයකට ලබාදීමට බැඳීමක් ඇතිකරගත් විට; සහ
    - වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් සමාගම විසින් පවරාදී හෝ
    - වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් සමාගම විසින් පවරානොදී හෝ රඳවා නොගෙන සිටින නමුත් වත්කමේ පාලනය පවරාදී ඇති විට;

එවැනි මූල්‍ය වත්කමක (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක හෝ) හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ:

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති ස්වකීය අයිතිය සමාගම විසින් පවරාදී ගිවිසුමෙන් ඔබ්බට යන වැඩපිළිවෙලකට ඇතුළත්ව, වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් සමාගම විසින් පවරා නොදී, හෝ රඳවා නොගෙන සිටිමින් වත්කමේ පාලනය ද පවරාදී නොදී ඇති විට, එම වත්කම සම්බන්ධයෙන් සමාගමේ බැඳියාව අබණ්ඩව පවතින ප්‍රමාණයට පමණක් අදාළ වත්කම හඳුනාගනු ඇත. එවැනි අවස්ථාවක, සමාගම විසින් එම වත්කම හා බැඳි ආධීනතාව ද හඳුනාගනු ඇත. සමාගම රඳවාගත් අයිතිවාසිකම් හා බැඳීම් ප්‍රතිබිම්බනය වන පදනමක් මත පවරාදුන් වත්කම හා ආශ්‍රිත ආධීනතාව තක්සේරු කරනු ඇත. පවරාදුන් වත්කම පිළිබඳ වගවීමක ආකාරයේ සමාගමේ අබණ්ඩ බැඳියාව වත්කමේ මුල් ධාරණ අගයේ අවමය හා ආපසු ගෙවීමට සමාගමට නියම විය හැකි ප්‍රතිශ්ධාවේ උපරිම අගය මත තක්සේරු කරනු ලැබේ.

4.7.6 අවකරණය හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා ඇගයීම

එක් එක් වාර්තා කරන දිනයේදී, ලාභ හෝ අලාභ අවකරණය කරනු ලබන නමුත් මූල්‍ය වත්කම් සාධාරණ පිරිවැයට ඉදිරියට ගෙනගොස් නොමැති බවට විෂය මූලික සාක්ෂි පවතී ද යන්න සමාගම විසින් ඇගයීමට ලක් කරනු ලැබේ. විෂය මූලික සාක්ෂි මඟින් වත්කමේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව පාඩුවක් සිදුව ඇති බව සහ වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයට විශ්වසනීය ආකාරයෙන් ඇස්තමේන්තු කළ බලපෑමක් එම පාඩුව නිසා ඇතිවන බව පෙනී යයි නම් එවැනි යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අවකරණය කරනු ලැබේ.

ණය, අත්තිකාරම් හා ආයෝජන ඇප ආපසු රැස්කර ගත නොහැකි බවට තීරණය කළ විට සමාගම විසින් එවැනි ණය, අත්තිකාරම්, හා ආයෝජන ඇප ආදිය පොත්වලින් කපා හරිනු ඇත.

4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ, අතේ ඇති මුදල් හා බැංකුවේ ශේෂය වශයෙන් අර්ථ නිරූපනය කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් හා සමාන වත්කම් අතේ ඇති මුදල් හා හිඟ බැංකු අයිරා අඩුකොට බැංකුවේ ඇති තැන්පතු වලින් සමන්විත වේ. මාස තුනක හෝ ඊට අඩු කලපිරීම් සහිත කෙටි කාලීන ආයෝජන ද මුදල් හා සමාන වත්කම් ලෙස සැලකේ.

4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ වශයෙන් වර්ගීකරණය කර ඇත. කොටස් සාධනපත්‍ර නිකුත් කිරීමේ සෘජු වියදම් අඩුකොට ලද, හෝ ලැබිය යුතු මුදල් හෝ වෙනත් සම්පත් වල සාධාරණ අගයට කොටස් සාධනපත්‍ර තක්සේරු කරනු ලැබේ.

4.10 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ බැඳීම

4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගත් ආධීනතාව මඟින් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමවේදය යොදා ගනිමින් ආයුගණක අගය පදනම් කරගනිමින් තක්සේරු කරන ලද වාර්තා කරන දින පවතින නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන අගය නියෝජනය වේ. ආයුගණක අගය ගණනයේදී, වට්ටම් අනුපාත හා අනාගත වැටුප් වර්ධක පිළිබඳව උපකල්පන කිරීමට සිදුවේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මෙකී උපකල්පන වලට අතිශයින් සංවේදී වන අතර මෙම ප්‍රතිලාභ බාහිරෙන් මූල්‍යයනය නොකෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මඟින් උද්ගතවන ආයු ගණක ලාභ හා අලාභ සමාගම විසින් වහාම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාර පාරිතෝෂික ගෙවීමේ බැඳියාව උද්ගත වන්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සපුරා ඇත්නම් පමණි.

4.10.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු ඒ යටතේ යම් ආයතනයක් විසින් තවත් ආස්ථිත්වයකට ස්ථාවර ප්‍රතිලාභ ගෙවනු ලබන සහ තවදුරටත් ප්‍රතිලාභ ගෙවීමට නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් ඇති නොවන සේවා නියුක්තියෙන් පසුව ප්‍රතිලාභ ලබාදෙන සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකට දායකත්ව ලබාදීමට ඇති බැඳීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සේවකයන් විසින් සේවය කරනු ලබන සේවා කාලයට අදාළ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

ආ) සේවක අර්ථසාධක අරමුදල

පිළිගත් අර්ථසාධක අරමුදලකට එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 12%ක් හා 8%ක් සමාගම හා සේවකයා විසින් දායකත්වය ලබා දෙනු ලැබේ.

ආ) සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල සඳහා සමාගම විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් 3%ක දායකත්වය ලබා දෙනු ලැබේ.

4.11 මූල්‍ය වගකීම්

4.11.1 මූලික හඳුනාගැනීම හා තක්සේරුව

සමාගම විසින් මූල්‍ය වගකීම් ගිවිසුම්ගත විධිවිධාන සහ මූල්‍ය වගකීම් පිළිබඳ අර්ථ නිරූපණ වලට අනුව ලාභය හෝ අලාභය තුළ සාධාරණ පිරිවැය මත මූල්‍ය වගකීම් (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් යනුවෙන් වර්ගීකරණය කරනු ලැබේ.

මූල්‍ය වගකීමේ ගිවිසුම්ගත විධිවිධානවල සමාගම පාර්ශ්වකරුවෙක් වූ විට සමාගම විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම වගකීම් හඳුනාගනු ලැබේ.

ආ) FVTPL මත මූල්‍ය වගකීම

FVTPL මත මූල්‍ය වගකීම වලට මූලික හඳුනා ගැනීමේදී වෙළඳාම සඳහා රඳවාගෙන ඇති හෝ එසේ නම් කරන ලද මූල්‍ය වගකීම් ඇතුළත් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසු අවස්ථාවක FVTPL මත මූල්‍ය වගකීම් සාධාරණ පිරිවැයට සහ ලාභ හෝ අලාභවල හඳුනාගත් වෙනස්කම් වලට අනුව තක්සේරු කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීමෙන් පසුව, වත්කම අත්කර ගැනීමට සෘජුව අදාළ වන ගණුදෙනුවේ පිරිවැය දැරීමට සිදුවන පරිදි ලාභයේ හෝ අලාභයේ හඳුනාගනු ඇත. මූලික හඳුනා ගැනීමෙන් පසුව, FVTPL මත මූල්‍ය වගකීම් නම්කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක FVTPL මත මූල්‍ය වත්කම් සඳහා යොදාගන්නා නිර්ණායක වලට සමාන වේ.

ඇ) වෙනත් මූල්‍ය වගකීම්

වෙනත් මූල්‍ය වගකීම් වලට තැන්පතු, සමාගම විසින් නිකුත් කළ ණය හා වෙනත් ණයට ගත් අරමුදල් ඇතුළත් වන අතර ඒවා අත්කර ගැනීමට සෘජුව දරන ලද පිරිවැය අඩුකොට සාධාරණ පිරිවැයට මූලිකව තක්සේරු කර පසුව, සඵල පොළී අනුපාතික ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. කවර හෝ වට්ටම් හෝ කොටස් අධිමිල සහ සඵල පොළී අනුපාතිකයේ අනුකල අංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

4.11.2 මූල්‍ය වගකීම් හඳුනාගැනීම ඉවත්කිරීම

යම් වගකීමක් මත ඇතිවන බැඳීම පියවා දැමීම, හෝ අවලංගු වීම හෝ කල්ඉකුත්වීම මත එම මූල්‍ය වගකීම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකියයුතු වෙනස්කම් සහිත කොන්දේසි මත අදාළ ණය දෙන්නාගෙන්ම ලබා ගන්නා වෙනත් වගකීමක් පවත්නා මූල්‍ය වගකීමට ආදේශකළ විට හෝ පවත්නා මූල්‍ය වගකීමට අදාළ කොන්දේසි සැලකියයුතු සේ සංශෝධනය කරනු ලැබුවහොත්, එවැනි ආදේශ කිරීම හෝ සංශෝධනය මුල් වගකීම හඳුනා ගැනීම ඉවත් කිරීමක් සේ සලකනු ලබන අතර ඒ සඳහා ගෙවූ ප්‍රතිශ්ධාව ලාභ හෝ අලාභවල හඳුනාගැනේ.

4.12 ප්‍රතිපාදන

යම් අතීත සිදුවීමක ප්‍රතිඵලය ලෙස උද්ගතවූ වත්මන් (නෛතික හෝ අනුමිත) බැඳීමක් සමාගම සතුවේ නම්, සහ එම වගකීම පියවීමට ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වේ නම්, සහ වගකීමේ අගය පිළිබඳව විශ්වසනීය තක්සේරුවක් කිරීමට හැකි වේ නම්, ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. යම් ප්‍රතිපාදනයකට අදාළ වියදම් කවර හෝ ප්‍රතිපූරණය කිරීම් අඩුකොට විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ.

4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ LKAS 7- ප්‍රමිතියේ දක්වා ඇති පරිදි අනියම් ක්‍රමවේදය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කරනු ලැබේ. මුදල් හා මුදල් හා සමාන වත්කම් වලට, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකු අයිරා අයත් වේ.

4.14 ආංශික තොරතුරු

සේවා සම්පාදනයේ නියුතු වූ, සෙසු අංශ වලින් වෙනස් වූ අවදානම් හා ප්‍රතිලාබ්ධි සහිත වූ වෙන්කර හඳුනාගත හැකි සංරචකයක් අංශයක් ලෙස දැක් වේ. සමාගමේ සියලුම මෙහෙයුම් එකම අංශයක් ලෙස සලකන බැවින් අංශ වශයෙන් සලකණු ලබන වෙන්කර හඳුනාගත හැකි සංරචකයන් සමාගම සතු නොවේ.

4.15.1 නිකුත්කළ නමුත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති

නිකුත්කළ නමුත් හෝටලයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන මේ දක්වා බලාත්මක නොවූ ප්‍රමිති හා අර්ථ නිරූපණ පහත දක්වා ඇත. ඒවා බලාත්මක වූවිට අදාළ පරිදි ක්‍රියාවට නැංවීමට හෝටලය අපේක්ෂා කරයි.

මූල්‍ය සාධනපත්‍ර පිළිබඳ SLFRS 9 ප්‍රමිතිය

මූල්‍ය සාධනපත්‍ර පිළිගැනීම හා තක්සේරු කිරීම පිළිබඳ වත්මන් මාර්ගෝපදේශය වන LKAS 39 වෙනුවට SLFRS 9 ආදේශ කර ඇත. මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය හා තක්සේරු කිරීම පිළිබඳ සංශෝධිත මාර්ගොපදේශ, මූල්‍ය වත්කම් අවකරණය ගණනය කිරීමේ නව අපේක්ෂිත ණය අලාභ ආදර්ශයක් සහ නව පොදු ඉදිරි රැකුම් ගණකාධිකරණ නියමයන් SLFRS 9ට අයත් වේ. මූල්‍ය සාධනපත්‍ර පිළිගැනීම හා පිළිගැනීම ඉවත්කිරීම පිළිබඳ LKAS 39 මාර්ගොපදේශ මෙමඟින් ද එලෙසින් නිර්දේශ කර ඇත.

2018 ජනවාරි 01 දින හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණය සඳහා SLFRS 9 ප්‍රමිතිය බලාත්මක වන අතර එය ඉන් පෙරද අදාළ කර ගැනීමට අවසර ලබාදී ඇත.

සේවාලාභීන් සමඟ වන ගිවිසුම් මඟින් ලද ආදායම් පිළිබඳ SLFRS 15 ප්‍රමිතිය

ආදායම කොපමණ ප්‍රමාණයකින්, කුමන අවස්ථාවක හඳුනාගන්නේද්‍යායි යන්න සඳහා විස්තීරණ රාමුවක් SLFRS 15 ප්‍රමිතිය මඟින් ස්ථාපිත කෙරේ. දැනට බලාත්මක ආදායම් පිළිබඳ LKAS 18, ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳ LKAS 11 සහ සේවාලාභී ලොයල්ටි වැඩසටහන පිළිබඳ IFRIC 13 ප්‍රමිති සඳහා මෙය ආදේශ වේ.

2018 ජනවාරි 01 දින හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණය සඳහා SLFRS 15 ප්‍රමිතිය බලාත්මක වන අතර එය ඉන් පෙරද අදාළකර ගැනීමට අවසර ලබාදී ඇත.

බදුකර පිළිබඳ SLFRS 16 ප්‍රමිතිය

කෝවල බදුකර ගිණුම්කරණ ආදර්ශයක් SLFRS 16 ප්‍රමිතිය මඟින් ඉදිරිපත් කර ඇති අතර එමඟින් බදු දීමනාකාර ගිණුම් දැනට ක්‍රියාත්මක කරන ආකාරයට වෙනසක් නොමැතිව ඉදිරියටත් ක්‍රියාත්මක වුවද, සෑම බදුකරයක් සම්බන්ධයෙන්ම බදු කාලය මාස 12ක් හෝ ඊට අඩු නොවන්නේ නම් හෝ අදාල වත්කමේ අගය ඉතා සුළු වන්නේ නම් මිස සියලුම බදුකර සඳහා වත්කම් හා වගකීම් හඳුනා ගැනීමට බදු ගැනුම්කරුට නියම වී ඇත. බදුකර පිළිබඳ LKAS 17 ප්‍රමිතිය, යම් වැඩිපිළිවෙලක බදුකරයක් අන්තර්ගත වේ ද යන්න තීරණය කෙරෙන IFRIC 4 ප්‍රමිතිය, මෙහෙයුම් බදුකර දිරිගැන්වීම් පිළිබඳ SIC 15 ප්‍රමිතිය, සහ බදුකරයේ නෛතිකත්වය අදාළ වන ගණුදෙනුවේ හරය ඇගයීම පිළිබඳ SIC 27 ප්‍රමිතිය මෙමඟින් අවලංගු වේ.

ගණුදෙනුකරුවන් සමඟ වන කොන්ත්‍රාත් මඟින් ආදායම් ලබාගැනීම පිළිබඳ SLFRS 15 අදාළ කරගන්නා ආයතන වලට මෙය කළින් භාවිතයට ගැනීමේ අවසරය තිබේ.

2019 ජනවාරි 01 දින හෝ ඊට පසු වාර්ෂික වාර්තාකරණය සඳහා SLFRS 16 ප්‍රමිතිය බලාත්මක වේ.

සවිස්තර බලපෑම් විශ්ලේෂණය නිමකරනු ලබන තෙක්, වාර්තාකරණ දිනය වන විට SLFRS 9, SLFRS 15 සහ SLFRS 16 හි බලපෑම මැනවින් ඇස්තමේන්තු කිරීම කළ නොහැකි වනු ඇත.

පහත සඳහන් සංශෝධන මඟින් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට සැලකියයුතු බලපෑමක් ඇතිකරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ:

- SLFRS 10 සහ LKAS 28 සඳහා සංශෝධන: ආයෝජකයෙකු හා එහි ආශ්‍රිත හෝ හවුල් ව්‍යාපාරයක් සමඟ විකුණුම් හෝ දායකත්ව
- LKAS 7 අනාවරණ මූලාරම්භනය - LKAS 7 සඳහා සංශෝධන
- උපලබ්ධි නොවූ අලාභ සඳහා විලම්බිත බදු ආදායම් හඳුනාගැනීම පිළිබඳ LKAS 12 ප්‍රමිතිය: LKAS 12 සඳහා සංශෝධන
- කොටස් පාදක ගෙවීම් ගණුදෙනු වර්ගීකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ SLFR 2 ප්‍රමිතිය - SLFRS 2 සඳහා සංශෝධන

5. ආදායම

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
කාමර ආදායම	1,317,248	1,151,953
ආහාර හා පාන ආදායම	1,635,026	1,330,543
අනෙකුත් මෙහෙයුම් දෙපාර්තමේන්තු	63,088	58,184
	3,015,362	2,540,680

6. ආයෝජන ආදායම

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
පොළී ආදායම - ණය හා ලැබිය යුතු		
භාණ්ඩාගාර බිලපත් මත පොළිය	8,738	1,062
කාර්ය මණ්ඩල ණය පොළී	5	9
නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පොළිය	999	1,542
ස්ථාවර තැන්පතු පොළිය	14,089	11,596
FF&E ප්‍රතිෂ්ඨාපන සංචිතය මත පොළී ආදායම ඇමතුම්	1,702	4,995
ඇමතුම් තැන්පතු මත පොළිය	-	8,371
	25,533	27,575

7. වෙනත් ලාභ හා අලාභ

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභය	6,620	4,238
සාප්පු කුලිය	10,200	11,400
උපලබ්ධි නොවූ විනිමය ලාභ	884	9,428
උපලබ්ධි වූ විනිමය ලාභ	636	4,924
වෙනත් ආදායම්	50	-
විවිධ ආදායම්	11,039	9,924
	29,429	39,914

8. මූල්‍ය පිරිවැය

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
බැංකු ගාස්තු	81	38
අයිරා පොළිය	9,824	-
	9,905	38

9. අදාළ කාල පරිච්ඡේදයේ ලාභය

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
පහත සඳහන් වියදම් ද ඇතුළු සියලු වියදම් පියවීමෙන් අනතුරුව අදාළ කාලය සඳහා ලාභය:		
අධ්‍යක්ෂවරුන්ගේ වේතන	4,853	6,397
විගණකයන්ගේ පාරිශ්‍රමික - සමාගමේ	916	600
- හිල්ටන් කළමිබෝ	1,553	1,401
ක්ෂය කිරීම්	461,542	368,254
කාර්ය මණ්ඩල පිරිවැය (පහත සඳහන් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ද ඇතුළත් වේ)	448,163	413,941
- නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	22,577	18,307
- නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - සේ.අර.අ. සහ සේ.භා.අ.	60,735	59,045
කළමනාකරණ ගාස්තු	29,625	18,972
සමූහ සේවා හා අර්ථලාභ භාරය - හිල්ටන් ඉන්ටර්නැෂනල්	61,164	51,478
නෛතික ගාස්තු	140	100

10. ආදායම් බදු වියදම්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
සමාලෝචිත කාලයට අදාළ ප්‍රතිපාදන	11,691	11,394
පෙර වර්ෂයේ උණ ප්‍රතිපාදන	5,913	47
විලම්බිත (ආදායම්) බදු වියදම්	(102,645)	20,491
	(85,041)	31,932

10.1 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ හා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ බදු අයකළ හැකි ලාභය හා ගිණුම්ගත ලාභය අතර සන්සන්දනාත්මක විග්‍රහයක් පහත දක්වා ඇත:

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
ආදායම් බදු පෙර ගිණුම්ගත ලාභය	172,976	172,944
එකතුකළ ඉඩ නොදුන් අයිතම	567,223	446,113
එකතුකළ ඉඩදුන් අයිතම	(647,558)	(532,698)
වෙළඳ ලාභය හා වෙනත් ආදායම් මූලාශ්‍ර @ 12%	92,641	86,359
වෙනත් වගකිව යුතු ආදායම් මූලාශ්‍ර @ 28%	24,534	26,024
බදු අයකළ හැකි මුළු ලාභය	117,175	112,383
හිමිකම් පෑ අලාභ	(41,011)	(38,984)
බදු අයකළ හැකි ලාභය	**76,164**	73,399
බදු අයකළ හැකි වෙළඳ ලාභය @ 12%	60,217	55,484
බදු අයකළ හැකි වෙනත් ආදායම් මූලාශ්‍ර @ 28%	15,947	16,916
වෙළඳ ලාභය මත බදු	7,226	6,658
වෙනත් ආදායම් මූලාශ්‍ර මත බදු	4,465	4,736
ප්‍රවර්ථන වර්ෂයේ මුළු බදු වියදම	**11,691**	11,394

10.2 විලම්බිත බදු

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
තාවකාලික වෙනස්වීම් ඇතකිරීම හෝ ආපසු හැරවීමෙන් හටගන්නා විලම්බිත බදු (සටහන 23)	102,645	20,491
සමස්ත විලම්බිත බදු වගකීම ඉදිරියට ගෙනා බදු අලාභ	102,645	20,491

10.3 ඉදිරියට ගෙනා බදු අලාභ

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
ඉදිරියට ගෙනා බදු අලාභ	9,743,748	9,782,732
පවත්නා කාලසීමාව තුල සිදුකල බදු අලාභ	(41,011)	(38,984)
ඉදිරි කාලය සඳහා ඉදිරියට ගෙනගිය බදු අලාභ	9,702,737	9,743,748

11. කොටසක ඉපැයීම් - මූලික

සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවිය යුතු වර්ෂයේ ලාභය වර්ෂය තුළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලැබේ.

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
සාමාන්‍ය කොටසක ලාභය	0.13	0.07
ලවය ලෙස යොදා ගන්නා මුදල	**රු. '000**	**රු. '000**
සාමාන්‍ය කොටස් හිමියන්ට බෙදිය යුතු ලාභය	258,017	141,012
හරය ලෙස යොදා ගන්නා අගය	**ප්‍රමාණය '000**	**ප්‍රමාණය '000**
කොටසක මූලික ලාභය ගණනය කිරීම සඳහා බරතැබූ සාමාන්‍ය කොටස් සාමාන්‍යය අගය	2,046,646	2,046,646

12. දේපළ, පිරියත හා උපකරණ

දෙපළ, පිරියත හා උපකරණ	බදු ඉඩම් මත පිහිටි ගොඩනැගිලි රු. '000	පිරියත හා යන්ත්‍රසූත්‍ර රු. '000	හෝටල් ගාහභාණ්ඩ හා සවිකිරීම් රු. '000	මෝටර් රථ රු. '000	ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ රු. '000	රූපවාහිනී හා පරිගණක රු. '000	මෙහෙයුම් උපකරණ රු. '000	එකතුව රු. '000
පිරිවැය/ප්‍රතිතක්සේරුව								
2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවර්ගීකෘත ශේෂය	6,667,589	482,118	1,117,174	92,939	437,475	261,553	-	9,058,847
වර්ෂය තුළ එකතු කිරීම්	8,383	4,253	31,937	-	18,228	15,763	105,332	183,896
ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මත පැවරුම්	1,844,960	61,372	328,883	-	275,219	390	13,994	2,524,819
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,520,932	547,743	1,477,994	92,939	730,922	277,706	119,326	11,767,562
වර්ෂය තුළ එකතු කිරීම්	14,876	14,900	47,725	-	20,019	11,064	2,545	111,128
ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මත පැවරුම්	492,342	-	30,690	-	125,397	-	-	648,428
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,028,150	562,643	1,556,409	92,939	876,338	288,770	121,871	12,527,118
සමුච්චිත ක්ෂයකිරීම්								
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,954,293	432,694	1,011,125	84,569	314,121	223,504	-	4,020,304
වර්ෂය සඳහා බැඳීම	183,737	12,206	42,376	6,281	25,059	16,312	11,577	297,547
පෙර වාර්තා කළ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	2,138,029	444,899	1,053,500	90,849	339,180	239,815	11,577	4,317,851
අතිරික්ත ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්ථනය	-	-	-	(1,352)	-	-	-	(1,352)
2016 දෙසැම්බර් 31 දිනට ගැලපූ ශේෂය	2,138,029	444,899	1,053,500	89,497	339,180	239,815	11,577	4,316,499
වර්ෂයේ වගකීම	218,892	12,775	60,687	2,195	39,644	17,635	40,357	392,184
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	2,356,921	457,674	1,114,187	91,693	378,824	257,451	51,934	4,708,683
ලේඛණගත අගය								
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	4,713,296	49,424	106,050	8,370	123,354	38,049	-	5,038,544
පෙර වාර්තා කළ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,382,902	102,844	424,494	2,090	391,742	37,891	107,749	7,449,712
2016 දෙසැම්බර් 31 දිනට ගැලපූ ශේෂය	6,382,902	102,844	424,494	3,442	391,742	37,891	107,749	7,451,063
2017 දෙසැම්බර් 31 දිනට ගැලපූ ශේෂය	6,671,229	104,968	442,221	1,246	497,514	31,319	69,937	7,818,434

හෝටලයේ දේපළ, පිරියත හා උපකරණ වල පූර්ණ හිමිකාරත්වය සහ පාලනය හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම සතුවේ.

12.2 එ.ජ. ඩොලර් 360,000ක මුදලක් වැය කරමින් 1998 වර්ෂයේදී ලෝක වෙළඳ මධ්‍යස්ථානය හා හිල්ටන් හොටලය යා කරමින් පාලමක් ඉදිකළ අතර, ඒ සඳහා සීමාසහිත ඔවරසීස් රියල්ටි සමාගම සහ හිල්ටන් ඉන්ටර්නැෂනල් සමාගම පිළිවෙලින් එ.ජ. ඩොලර් 180,000 සහ 90,000 බැගින් දායක විය ඉතිරි මුදල සමාගම විසින් දරන ලදී, සමාගම විසින් දරන ලද එ.ජ. ඩොලර් 90,000ක මුදල ගෙඩනැගිලි යටතේ මූල්‍ය ප්‍රකාශවල ප්‍රාග්ධනීකෘතෙ කර ඇත.

12.3 රු.1,986,019,251/- ක (2016 වර්ෂයේ රු. මිලියන 1,933) පිරිවැයකට දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂයකර ඇති නමුත් සමාගම විසින් තවදුරටත් භාවිතයට ගමින් සිටී. සමාගම විසින් ආරනස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ සහාය ලබන වරලත් තක්සේරුකරුවකු මඟින් සෑම වත්කමක් පිළිබඳවම සවිස්තර වත්කම් සත්‍යාගණනයක් කරනු ලැබ ඇත. මෙම පැවරුම එහි අවසන් අදියරට දැන් පැමිණ ඇත.

12.4 2010 වර්ෂයේදී, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ගොඩනැගිල්ල රු. මිලියන 5,600කට ප්‍රතිතක්සේරු කරන ලදී, පූර්ව ගණකාධිකරණ ප්‍රමිතිය වූ SLAS යටතේ ගොඩනැගිල්ලේ ප්‍රතිතක්සේරු මුදල LKAS ප්‍රමිතීන්ට මාරුවීමේ දිනට කල්පිත පිරිවැය ලෙස සැලකීම සමාගම විසින් පිළිගන්නා ලදී, එහි ප්‍රතිඵලය ලෙස එකී මාරුවීමේ දිනට (රු.000) 4,706,460 ක තක්සේරු සංචිත සමාගම විසින් රඳවාගත් ඉපැයීම් වලට මාරු කරන ලදී.

12.5 ප්‍රතිසංස්කරණ කටයුතුවල පළමු අදියර 2017 අගෝස්තු වන විට නිමකර තිබූ අතර එමඟින් උද්ගත වූ ප්‍රාග්ධනීකරණ පිරිවැය උපදේශකගේ වාර්තාවේ නිම කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය මත පදනම් වී ඇත.

13. බදු ඉඩම

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
ඉ/ගේ ශේෂය	6,681,237	6,751,944
අඳාළ කාලයේ ක්‍රමක්ෂය	(70,707)	(70,707)
අවසන් ශේෂය	6,610,530	6,681,237

ඉඩමේ බදුකරය 99 අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති අතර එය වර්ෂ 2012 ජූනි 18 දින සිට බලාත්මක වේ. බදු ඉඩමේ තක්සේරු අගය වන රු. බිලියන 7ක මුදල ප්‍රාග්ධනීකරණය කර ඇති අතර ශ්‍රී ලංකා රජයට ඒ සඳහා කොටස් නිකුත්කර ඇත. තවද, ක්‍රීඩා සංකීර්ණය ඉදිකර ඇති ඉඩම කුලී රහිත පදනම්න් 2012 ජූනි 28 දින සිට වසර 5ක් සඳහා බදු දීමට 2012 ඔක්තොබර් 3 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී, 2016.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම ඉඩමේ බදුකරය ප්‍රධාන ගොඩනැගිල්ලේ බදුකරය හා සමපාත වන පරිදි 2111 දක්වා දීර්ඝ කරන ලද අතර එහි බදු කොන්දේසි නශ්වය කිරීම මෙතෙක් සිදුව නොමැත.

14. භාණ්ඩ තොගය

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
ආහාර	11,748	7,067
පාන වර්ග	34,494	32,576
පොදු ගබඩාව	8,163	8,279
ඉන්ජිනේරු ගබඩාව	3,604	3,566
	58,009	51,488

15. වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
ලැබිය යුතු වෙළඳ ශේෂ	153,388	150,591
අවකාරණය	(1,748)	(1,748)
	151,640	148,843

16. සම්බන්ධිත පාර්ශ්වකරුවන්ගෙන් ලැබිය යුතු මුදල්

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
හිල්ටන් ගාර්ඩින් ඉන්	-	201
හිල්ටන් සිංගප්පූරුව	-	49
හිල්ටන් කළමිබෝ රෙසිඩන්ස්	240	1,339
හිල්ටන් ඉන්ටර්නැෂනල්	-	63
හිල්ටන් ගෝවේ	-	115
හිල්ටන් ක්වාලාලම්පූර්	196	-
හිල්ටන් වීරවිල	918	-
	1,354	1,767

17. වෙනත් වත්කම්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
තැන්පතු, පෙරගෙවුම් හා අත්තිකාරම්	86,421	96,926
වෙනත් අයවිය යුතු මුදල්	45,468	32,392
අත්තිකාරම් - අලුත්වැඩියා වියදම්	26,950	65,277
අයවිය යුතු ආදායම් බදු	24,681	21,550
	183,520	216,145

18. ජංගම මූල්‍ය වත්කම්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
කෙටි කාලීන ආයෝජන		
ඇමතුම් තැන්පතු	114,558	172,042
	114,558	172,042
ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ සංචිත ආයෝජන		
ඇමතුම් තැන්පතු	21,050	30,618
	21,050	30,618
මුළු කෙටි-කාලීන ආයෝජන	135,608	202,660

හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් කෝපරේෂන් සහ හොටේල් ඩිවේලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම අතර එළැඹි 2012 ඔක්තෝබර් මස 18 දින දරන කළමනාකරණ ගිවිසුමේ V වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාර ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ භාවිතාව සහ ඒවා ආදේශ කිරීමට භාවිත කිරීම සඳහා ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ සංචිතයට ආයෝජන සීමාකර ඇත. මෙම ආයෝජන හෝටලයේ අලුත්වැඩියා කටයුතු සඳහා උපයෝගී කරගෙන ඇති බැවින්, ඒවා පෙර වර්ගීකරණය කර තිබූ ජංගම නොවන මූල්‍ය වත්කම් කාණ්ඩයෙන් ඉවත්කර ජංගම මූල්‍ය වත්කම් කාණ්ඩය යටතේ නැවත වර්ගීකරණය කර ඇත.

19. මුදල් හා බැංකු ශේෂ

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
ඉතිරිකිරීමේ ගිණුම ලංකා බැංකුව - එ.ජ.ඩො	32,544	250,301
මෙහෙයුම් බැංකු ගිණුම	193,005	144,753
මුදල්	50	50
	225,599	395,104

එ.ජ. ඩොලර් ගිණුමේ වර්ෂ අවසාන ශේෂය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ශේෂපත්‍ර දිනය අවසන අනුපාතය මත ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කර ඇත.

20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

20.1 නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
2,046,645,685 සාමාන්‍ය කොටස්	20,466,456	20,466,456

21. සංචිත

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සංචිතය (සටහන් 21.1)	161,348	21,896

21.1 ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීම

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
වර්ෂ ආරම්භක ශේෂය	21,896	117,421
එකතුකළා: වර්ෂය තුළ සලසා දුන් ප්‍රතිපාදන	268,435	108,389
අඩුකළා: ස්කන්ධ ප්‍රකාශයට මාරුකළ අගයන්		
ගෘහභාණ්ඩ හා සවිකිරීම් මිලදී ගැනීම් හා ආදේශ කිරීම්		
- සඳහා භාවිතකළ මුදල්	(128,983)	(203,914)
වර්ෂ අවසාන ශේෂය	161,348	21,896

වර්ෂය තුළ එ.ජ. ඩොලර් 700,00කට සමාන මුදලක් ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපරණ සංචිතයට මාරුකර ඇත.

22. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ බැඳීම

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
වර්ෂ ආරම්භයේ ශේෂය	125,326	104,524
වර්ෂය තුළ අයකිරීම	9,105	7,855
සංක්‍රාන්තිමය වගකීම/ (වත්කම) සහ ආයුගණක අලාභ/ (ලාභ) හඳුනාගැනීම (නිවැරදිය)	10,042	9,042
උපකල්පනයන්හී සිදුවූ වෙනස්කම් මඟින් හෝ පෙර වර්ෂවල		
සලසාදුන් අධි /(ඌණ) ප්‍රතිපාදන මඟින් හටගත් පාඩුව / (ලාභය)	(12,457)	(3,976)
වර්ෂයේ පොළී පිරිවැය	13,472	10,452
වර්ෂය තුළ කරන ලද ගෙවීම්	(22,907)	(2,571)
වර්ෂ අවසානයේ ශේෂය	122,581	125,326

පියල් එස්. ගුණතිලක ඇසෝසියේට් ආයතනය විසින් කරන ලද ආයුගණක තක්සේරුවක් මත සමාගමේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ බැඳියාව පදනම් වී ඇත. වට්ටම් අනුපාතික උපකල්පනය සහ වාර්ෂික මූලික වැටුප් වර්ධකය හැර සෙසු සියලුම උපකල්පන එලෙසින්ම පවතින අතර ඉදිරි වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට ලබාදෙන දායකත්වයේ කිසිදු වෙනස්කමක් අපේක්ෂා නොකෙරේ. භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික නියෝජනය වන පරිදි වට්ටම් අනුපාතික 10.25% (පසුගිය වර්ෂයේ 10.75ක් විය) වන පරිදි ප්‍රතිශෝධනය කරන ලදී. පහත සඳහන් ප්‍රධාන උපකල්පන සේවක ප්‍රතිලාභවල පිරිවැය නිශ්චය කිරීම සඳහා උපයෝගී කරගනී:

වට්ටම් අනුපාතය	10.25%	10.75%
අනාගත වැටුප් වර්ධක	6.00%	9.00%

සංවේදිතාව හා කල්පිරීමේ කාලය	වට්ටම් අනුපාතිකය		වැටුප් වර්ධකය	
	2017	2016	2017	2016
සියයට එකක අගයකින් වැඩිවීම	(4,934)	(4,928)	(4,751)	5,140
සියයට එකක අගයකින් අඩුවීම	4,510	5,417	4,414	(4,761)

	31.12.2017 රු.'000
2017 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පිළිබඳ කල්පිරීම් විශ්ලේෂණය - වට්ටම් නොකළ	
ඉදිරි මාස 12 තුළ	4,720
වර්ෂ 1 සහ 2 අතර	16,542
වර්ෂ 2 සහ 5 අතර	50,020
වර්ෂ 5 සහ 10 අතර	50,111
අපේක්ෂිත මුළු ගෙවීම්	121,393

23. විලම්බිත බදු වගකීම්

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
වර්ෂයේ ආරම්භක ශේෂය	499,215	478,724
විලම්බිත බදු වියදම / ආදායම	(102,645)	20,491
වර්ෂ අවසානයේ ශේෂය	396,570	499,215

23.1 අවසන් විලම්බිත බදු වගකීම් ශේෂ පහත සඳහන් පරිදි අදාළ කරගනු ලැබේ:

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
බදු කාර්යය සඳහා කඩිනම් ක්ෂය කිරීම්	732,903	603,481
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව	(17,161)	(15,039)
ඉදිරියට ගෙනා බදු අලාභ උපයෝජනයට අදාළවන	(319,172)	(89,227)
- විලම්බිත බදු වත්කම		
	396,570	499,215

2017 වර්ෂයේදී විලම්බිත බදු වත්කම 14%ක (2016 දී 12%) අනුපාතය මත ගණනය කර ඇත.

24. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
වෙළඳ කටයුතුවලට අදාළ ගෙවිය යුතු මුදල්	138,318	122,405
උපචිත වියදම් ඇතුළු විවිධ ණයහිමියෝ	151,512	183,417
ගෙවියයුතු කළමනාකරණ ගාස්තු	7,654	9,774
ගෙවියයුතු තැන්පතු	68,228	95,490
වෙනත් වගකීම්	39,860	30,842
කැඩුණු බිඳුණු භාණ්ඩ ප්‍රතිෂ්ඨාපනය	10,938	9,609
ගෙවියයුතු ව්‍යවස්ථාපිත මුදල්	63,064	59,672
	479,574	511,209

25. සම්බන්ධිත පාර්ශව වෙත ගෙවිය යුතු මුදල්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
හිල්ටන් ඉන්ටර්නැෂනල් ආසියා ශාන්තිකර	6,874	6,197
හිල්ටන් ඉන්ටර්නැෂනල් ඇ.එ.ජ.	5,684	4,401
	12,558	10,598

26. ආදායම් බදු වගකීම්

	31.12.2017 රු. '000	31.12.2016 රු. '000
ආරම්භක ශේෂය	(21,548)	12,379
අදාළ කාලය සඳහා ප්‍රතිපාදන	11,691	11,394
පෙර වර්ෂයේ ඌන ප්‍රතිපාදන	5,913	47
බදු බැර		
ආර්ථික සේවා ගාස්තු	(12,313)	(12,817)
රඳවුම් බද්ද	(1,409)	(1,160)
කල්පිත බද්ද	(1,044)	(1,443)
ස්වයං තක්සේරු ගෙවීම්	(5,971)	(29,948)
වර්ෂය අවසානයේ ශේෂය (වෙනත් වත්කම් වලට මාරුකළ ප්‍රවර්ථන වර්ෂයේ ශේෂය)	**(24,681)**	(21,548)

27. මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාළ සටහන්

27.1 වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම්

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
මුදල් හා බැංකු ශේෂය	395,104	215,214
ඇමතුම් තැන්පතු	202,660	257,208
භාණ්ඩාගාර බිල්පත්	-	59,325
බැංකු අයිරා	(340,250)	(126,414)
එ.ජ. ඩොලර් ඉතුරුම් ගිණුමේ උපලබ්ධි නොවූ විනිමය ඉපැයීම්	884	9,428
	258,398	414,761

27.2 වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම්

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
මුදල් හා බැංකු ශේෂය	225,599	395,104
ඇමතුම් තැන්පතු	135,608	202,660
බැංකු අයිරා	(272,468)	(340,250)
	88,739	257,514

28. 2017 දෙසැම්බර් 31 දිනට තක්සේරු පදනමින් මූල්‍ය සාධනපත්‍ර විශ්ලේෂණය

	31.12.2017 රු. '000	31.12.2016 රු.'000
මූල්‍ය වත්කම් කාණ්ඩ වශයෙන්		
ජංගම වත්කම් තුළ මූල්‍ය සාධනපත්‍ර		
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	151,640	148,843
වෙනත් වත්කම්	183,520	216,145
සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල්	1,354	1,767
වෙනත් ජංගම මූල්‍ය වත්කම්	135,608	202,660
අත ඇති හා බැංකුවේ ඇති මුදල්	225,599	395,104
එකතුව	697,721	964,519
මූල්‍ය වගකීම් කාණ්ඩ වශයෙන්		
ජංගමතුළ මූල්‍ය සාධනපත්‍ර		
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල	490,021	511,209
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්	12,558	10,598
බැංකු අයිරා	272,468	340,250
එකතුව	775,047	862,057

29. මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගමේ ව්‍යාපාරික කාර්යයන් (විනිමය අවදානම, පොළී අනුපාතික අවදානම, හා මිල අවදානම ඇතුළු) වෙළඳපොල අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ආදී විවිධ වූ මූල්‍ය අවදානම් වලට පාත්‍ර වන්නේය. සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ මූල්‍ය අවදානම් පුරෝකථනය නොකළ හැකි බව යන්න පිළිබඳව දැඩි අවධානය යොමුකරමින්, එමඟින් සමාගමේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම අවමකර ගැනීමට අපේක්ෂා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති යටතේ මුදල් දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ඉටු කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන මූල්‍ය සාධනපත්‍ර වලට කෙටි-කාලීන තැන්පතතු, මූල්‍ය වෙළඳපොල ආයෝජන හා මුදල් අයත් වේ. මෙකී මූල්‍ය සාධනපත්‍රවල ප්‍රමුඛ කාර්යය වන්නේ සමාගමේ මෙහෙයුම්වල ද්‍රවශීලතාව ඉහළනැංවා පවත්වා ගැනීම සහ සමාගමේ මූල්‍ය සංවිතවල ප්‍රතිලාභ උපරිම කිරීමයි. ස්වකීය ව්‍යාපාරික කටයුතු වලින් සෘජුව පැනනගින අයවියයුතු මුදල්, සහ ගෙවිය යුතු මුදල් ආදී අනෙකුත් විවිධ මූල්‍ය සාධනපත්‍ර සමාගම සතුවේ.

29.1 ණය අවදානම

ණය අවදානම යනු, යම් මූල්‍ය සාධනපත්‍රයක් යටතේ සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට යම් ප්‍රතිපාර්ශ්වයක් අසමත් වීමෙන් අනාගතයේ අලාභ සිදුවීමට ඇති හැකියාවයි. ස්වකීය මෙහෙයුම් කාර්යයන් (ප්‍රාථමික වෙළඳ කටයුතු වලින් අයවියයුතු) මඟින් සහ ස්වකීය මූල්‍යමය කාර්යයන් මඟින් හෝටලය ණය අවදානමට පාත්‍ර වේ.

පිළිගත් හා විශ්වසනීය ණය ලබාගැනීමට සුදුසු තෙවන පාර්ශ්ව සමඟ පමණක් හිල්ටන් හෝටලය ගණුදෙනු සිදු කරයි. ණය කොන්දේසි යටතේ ගණුදෙනු කිරීමට අපේක්ෂා කරන සියලුම ගණුදෙනුකරුවන් ණය සත්‍යාපන ක්‍රියාවලියකට යටත් විය යුතු බව හෝටලයේ ප්‍රතිපත්තියයි. ඊට අමතරව, අයවියයුතු ශේෂ අඛණ්ඩ පදනමකින් අධීක්ෂණයට ලක්කෙරෙන අතර හෝටලයේ බොල් ණය පාත්‍රතාව ඉතා අවම මට්ටමකින් පවත්වා ගැනීම එහි අරමුණ යි.

මුදල් හා සමාන වත්කම් සහ වෙනත් අමූල්‍ය වත්කම් හා සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් ආදී හෝටලයේ අනෙකුත් මූල්‍ය වත්කම් වලින් පැහැනගින ණය අවදානම සම්බන්ධයෙන් වන හෝටලයේ ණය අවදානම් පාත්‍රතාව ප්‍රතිපාර්ශ්වයන්ගේ අපොහොසත් වීම් මඟින් උද්ගත වේ. ප්‍රතිපාර්ශ්වීය අවදානම් අධික ලෙස සංකේන්ද්‍රණය වීම වළක්වා ගැනීමට හැකිවන පරිදි සිය මෙහෙයුම් පවත්වා ගැනීමට හෝටල් කළමනාකාරීත්වය කටයුතු කරන අතර ප්‍රතිපාර්ශ්ව විසින් සිය බැඳීම් නොපිරිහෙලා ඉටුකරනු ලබන බව තහවුරු කිරීමට සියලු පියවර ගනී.

29.2 ණය අවදානම් පාත්‍රතාව

ණය අවදානමට පාත්‍රවන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වය (අතිරේක ඇපකර තිබේදැයි යන්න නොසලකා) ඒවායේ ධාරණ අගයන්ට සමාන වේ. උපරිම අවදානම් තත්ත්වය පහත වගුවේ පෙන්වා දී ඇත:

	2017 දෙසැම්බර් 31 දිනට				
රු. '000 වලින්	අතේ හා බැංකුවේ ඇති මුදල්	කෙටි-කාලීන ආයෝජන	වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	ඥාති පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්	එකතුව
බැංකුවේ තැන්පතු		135,608			135,608
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්			151,640		151,640
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්				1,354	1,354
අතේ හා බැංකුවේ ඇති මුදල් සමස්ත	193,055	32,544			225,599
සමස්ත ණය අවදානම් පාත්‍රතාව	193,055	168,152	151,640	1,354	514,201

29.2 ණය අවදානම් පාත්‍රතාව (තවදුරටත්..)

	2016 දෙසැම්බර් 31 දිනට				
රු. '000 වලින්	අතේ හා බැංකුවේ ඇති මුදල්	කෙටි-කාලීන ආයෝජන	වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්	ඥාති පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්	එකතුව
බැංකුවේ තැන්පතු		202,660			202,660
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්			148,843		148,843
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්				1,767	1,767
අතේ හා බැංකුවේ ඇති මුදල් සමස්ත	144,803	250,301			395,104
සමස්ත ණය අවදානම් පාත්‍රතාව	144,803	452,961	148,843	1,767	748,374

29.3 වෙළඳ හා වෙනත් අයවිය යුතු මුදල්

		2017 දෙසැම්බර් 31 දිනට	2016 දෙසැම්බර් 31 දිනට
හිඟහිටි හෝ අවකරණය නොකළ		121,542	107,694
හිඟහිටි හෝ අවකරණය කළ	30-60	18,894	28,118
	61-90	5,252	7,707
	91-120	918	556
	121-150	1,817	527
	151>	4,965	5,988
අවකරණය කළ			
දළ ධාරණ අගය		153,388	150,591
අඩුකළා: අවකරණ ප්‍රතිපාදන			
තනි තනි වශයෙන් තක්සේරුකළ අවකරණ ප්‍රතිපාදනය		(1,748)	(1,748)
එකතුව		151,640	148,843

29.4 සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්

හිල්ටන් හෝටල් ජාලයේ අනුබද්ධිත සමාගම් වලින් ලැබිය යුතු මුදල් වලින් ශේෂය සමන්විත වේ.

29.5 මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අදාළ ණය අවදානම

ගිණුම්කරණ මූලිකාංග විශ්ලේෂණ හා වෙළඳපල දර්ශක සැලකිල්ලට ගනිමින්, ප්‍රවර්ථන ශ්‍රේණිගත කිරීම් හා ආර්ථික දර්ශනය පදනම්කර ගනිමින් පිලිගතහැකි මූල්‍ය ප්‍රතිපාර්ශ්වයන්ගේ අනුමත ලැයිස්තුවක් සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනට රුපියල් 88,739,077/- ක මුදල් සහ මුදල් සමාන වත්කම් හෝටලය සතුව පැවතුනි (2017 දෙසැම්බර් 31 දිනට එය රුපියල් 257,513,892/- ක් විය).

29.6 ද්‍රවශීල අවදානම

සමාගමේ ස්වභාවික වර්ධනය ඇතුළු එහි කෙටි හා මැද කාලීන අරමුදල් බැඳියාවන් සපුරාලීමටත්, කවර හෝ අනපේක්ෂිත බැඳීම් හෝ අවස්ථාවන් සපුරාලීමටත් සමාගම සතුව අරමුදල් පවතින බව තහවුරු කිරීමට ප්‍රමාණවත් අරමුදල් මට්ටමක් දක්වා මුදල් තබාගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ ය.

දෛනික මුදල් කළමනාකරණ ක්‍රියාවලියක් තුළින් අරමුදල් ඌනතාවක් ඇතිවීමේ අවදානම සමාගම විසින් අධීක්ෂණය කෙරේ. මෙම ක්‍රියාවලියේදී සමාගමේ මූල්‍ය ආයෝජන සහ මූල්‍ය වත්කම් (උදා: ලැබිය යුතු ගිණුම්, වෙනත් මූල්‍ය වත්කම්) කල්පිරීම සහ මෙහෙයුම් මඟින් ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහ පිලිබඳව සැලකිල්ලට ගනු ලැබේ.

ශුද්ධ (ණය)/මුදල	2017	2016
	දෙසැම්බර් 31	දෙසැම්බර් 31
රුපියල් වලින්	දිනට	දිනට
කෙටි කාලීන ආයෝජන	135,608	202,660
මුදල් සහ මුදල් සමාන වත්කම්	225,599	395,104
මුළු ද්‍රවශීල වත්කම්	361,207	597,764
බැංකු අයිරා	272,468	340,250
මුළු ණය ගැනීම්	272,468	340,250
ශුද්ධ (ණය)/මුදල්	88,739	257,514

29.7 කල්පිරීම් විශ්ලේෂණය

සමාගමේ ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම් වූ 2017 දෙසැම්බර් 31 දිනට හෝටලයේ මූල්‍ය අධීනතා පිළිබඳ කල්පිරීම් කාලරාමු පහත වගුවේ සංක්ෂිප්තව දක්වා ඇත

	2017 දෙසැම්බර් 31 දිනට		2016 දෙසැම්බර් 31 දිනට	
රුපියල් වලින්	අවුරුද්දක් තුළ	එකතුව	අවුරුද්දක් තුළ	එකතුව
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	479,574	479,574	511,209	511,209
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් රුඳවුම් ගාස්තු	12,558	12,558	10,598	10,598
රුඳවුම් ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	111,028	111,028	103,208	103,208
බැංකු අයිරා	272,468	272,468	340,250	340,250
	875,628	875,628	965,265	965,265

29.8 වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යනු මූල්‍ය සාධනපත්‍රයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ අගය වෙළඳපොල මිල හේතුවෙන් උච්ඡාවචනයන්ට ලක්වීමේ අවදානමයි. සිය මූල්‍ය සාධනපත්‍ර භාවිතාව තුළින් ද විශේෂයෙන් විනිමය අවදානම හා වෙනත් මිල අවදානම් හේතුවෙන් ද හෝටලය වෙළඳපොල අවදානමට ගොදුරු වේ.

30. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණයන් සිදුකිරීමට අවශ්‍ය නොවන වැදගත් සිදුවීම් කිසිවක් වාර්තාකරණ දිනට පසුව සිදුවී නොමැත.

31. ප්‍රාග්ධන බැඳීම්

පහත සඳහන් බැඳීම් හැර මෙම මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කළ යුතු ප්‍රාග්ධන බැඳීම් හෝ අසම්භව්‍ය බැරකම් කිසිවක් නොමැත:

31.1 සමාගම විසින් 2014 ඔක්තොබර් මාසයේ සිට හෝටලයේ මහ පරිමාණ අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ අතර එවක් පටන් හිල්ටන කළමිබෝ හෝටලය සුවිශාල ප්‍රතිසංස්කරණයන්ට භාජනය වෙමින් පවතී. එම ප්‍රතිසංස්කරණ කටයුතු මඟින් හෝටලයේ කාමර, ආහාර හා පාන වර්ග අලෙවිසල් හා රැස්වීම් ශාලා ආදී සියලුම අංගෝපාංග අලංකාර ලෙස වැඩි දියුණු කිරීමට ලක් වෙනු ඇත. මෙම අලුත්වැඩියා කිරීමේ වැඩසටහන තීරු බදු සහිතව එ.ජ. / මිලියන 52කට ඇස්තමේන්තුගත කර ඇති අතර එම මුදලින් එ.ජ. / මිලියන 27ක් එ.ජ. ඩොලර් ණය මුදලකින් ද, ඉතිරිය අභ්‍යන්තරන සම්පාදන අරමුදල් වලින්ද සපුරා ගැනීමට නියමිතය. මේ සඳහා ප්‍රාග්ධන බැඳීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමිව ඇති අතර එ.ජ. / මිලියන 27ක (ආසන්න වශයෙන් රු. බිලියන 4.1ක) මුදලක් සඳහා ගිවිසුම් ගතවී නොමැත.

අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් සමාගම දැනටමත් එළඹ ඇති ගිවිසුම් සහ හිඟ ශේෂයන් පහත දක්වා ඇති පරිදි වේ:

එ.ජ. ඩෝ. '000	කොන්ත්‍රාත් අගය	ගෙවූ මුදල	ඉතිරිය
සිවිල්/නිමැවුම් සකස් කිරීම්/වෙනත් කොන්ත්‍රාත්	17,945	13,839	4,106
උපදේශන කොන්ත්‍රාත්	5,730	5,217	513

32. අසම්භව්‍ය බැරකම

සේවානියුක්තිය අවසන් කිරීම සහ යම් උත්සව අවස්ථාවක විදුලිය බිඳවැටීම හේතුවෙන් සිදුවූ අලාභ හා හානි සඳහා වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් වන නඩු කිහිපයක හෝටලය වගඋත්තරකරු කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දින වන විට එම නඩුකරවල ප්‍රතිඵල පිළිබඳව පුරෝකථනය කිරීමට කළමනාකාරිත්වයට හැකියාවක් නොමැත. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශවල මෙවැනි බැරකම් කිසිවක් සඳහා ප්‍රතිපාදන සලසා දී නැත.

කොළඹ මහ නගර සභාව 2007 ජූලි 6 වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මඟින් 2007 ජනවාරි මස 01 දිනෙන් ආරම්භ වන අදාළ කාලපරිච්ඡේදය සඳහා හොටල්, ආපනශාලා හා නවාතැන්පල සම්බන්ධයෙන් වන බලපත්‍ර ගාස්තුව ප්‍රතිශෝධනය කරන ලදී. අප හෝටලය ඇතුළු කොළඹ නගරයේ පිහිටි හෝටල් මෙම බලපත්‍ර ගාස්තු වැඩිකිරීම සම්බන්ධයෙන් විරෝධය පළ කළ අතර අදාළ ගැටලුව විසඳා ගැනීමට මැදිහත්ව කටයුතු කරන සංචාරක අමාත්‍යාංශය සමඟ ඒ පිළිබඳව දැනට සාකච්ඡා කෙරෙමින් පවතී. 2011 ජූලි 28 දින දරන ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමයේ රැස්වීම් වාර්තාව පාදකකර ගනිමින්, මාසයකට රු. 50,000/-ක් බැගින් වූ ප්‍රතිපාදන හොටලය විසින් මේ සඳහා වෙන්කර ඇත. කොළඹ නගර සභාව විසින් 2007, 2008, 2014 හා 2015 වර්ෂවල ගෙවීමට නියම කරන ලද බලපත්‍ර ගාස්තුව අභියෝගයට ලක්කරමින් හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම විසින් අධිකරණයේ නඩු පවරන ලදුව, ශ්‍රී ලංකා මහේස්ත්‍රාත් අධිකරණය කොළඹ නගර සභාවේ ඉල්ලීම නිශ්ප්‍රභ කිරීමේ පසුබිම තුළ කොළඹ නගර සභාව විසින් මෙවරද ඉදිරිපත්කර ඇති බලපත්‍ර ගාස්තු ගෙවීමට සිදු නොවනු ඇති බවට හෝටලය විශ්වාසය පළ කරයි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රීලං.රු. 6,932,522ක ප්‍රතිපාදන එකී නඩු කටයුත්ත සඳහා හිල්ටන් කළමිබෝ හෝටලය විසින් පවත්වා ගෙන යනු ලැබේ.

33. ඇපකර වශයෙන් ඔඩපනය කරන ලද වත්කම්

හෝටලයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් එ.ජ.ඩෝලර් මිලියන 27ක සම්මේලක ණය පහසුකමක් ලබා ගැනීමට ලංකා බැංකුව සහ සම්පත් බැංකුව පීඑල්සී සමඟ අත්සන් කළ ගිවිසුමට අදාළව හෝටලයේ ප්‍රධාන දේපළ හෝටලය විසින් උකස්කර ඇත. කෙසේවුවද, මෙම ණය පහසුකම මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නැත.

34. සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ

34.1 ප්‍රමුඛ කළමනාකරණ නිලධාරීන් සමඟ කෙරෙන ගණුදෙනු

සම්බන්ධිත පාර්ශ්ව අතරට සමාගමේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් වගකීම උසුලන නිලධාරීන් වශයෙන් අර්ථ නිරූපණය කරන ලද ප්‍රමුඛ කළමනාකරණ නිලධාරීන් අයත්වේ. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ 2011 අංක 43 දරන ඍණකාර්යසාධිත ව්‍යාපාර සහ ඍණඋපයෝජිත වත්කම් පුණරජීවන පනතේ විධිවිධාන ප්‍රකාර පත්කරන ලද නිසි බලධාරියාගෙන් ප්‍රමුඛ කළමනාකරණ නිලධාරීන් සමන්විත වේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවූ පාරිශ්‍රමික හා නිසි බලධාරියාට කරන ලද ගෙවීම් රු. 6,052,500/-ක් විය. (පසුගිය 2016 වර්ෂයේ ගෙවූ මුදල රු. 7,597,000/-ක් විය).

ක්‍රිශාන්ත කුරේ මහතා, ධීෂනා අමරසේකර මෙනවිය, ප්‍රියන්ත ජයමහ මහතා, අතුල සේනානායක මහතා, ටෙහානි එස්.ඒ. මැතිවිස් මෙනවිය, දිණුක් කොළඹගේ මහතා, එම්. ශෙෂ්මින් මන්සූර මහතා, ඩබ්.එස්.අයි.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා, සොනාලි ලියනමාන්න මෙනවිය, ප්‍රවීර සමරසිංහ මහතා යන මහත්ම මහත්මීන් ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නම්කරන ලද අතර සාමාන්‍ය කොටස් අයිතියෙන් 100% ක් දැනට ශ්‍රී ලංකා රජය සතුවේ.

35. වාර්තාකරන දින වන විට පනවා ඇති නඩු කටයුතු

35.1 SC HCCA LA 225/16

මෙම නඩුකරය කර්නල් ඇන්ඩ් කො. ලිමිටඩ් විසින් අංක HCCA LA 69/14 දරන නඩුවේ 2016 මාර්තු 31 දිනැති අධිකරණ නියෝගයට එරෙහිව ගොණුකරන ලද අභියාචනයකි. මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා 2018 ඔක්තෝබර් 12 වන දිනට දින නියමකර ඇත.

35.2 H.C. [Civil] 1/98 [2] [ගොණුකළ දිනය 31/3/1998]

මෙම නඩුකරය හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම (5වන වගඋත්තරකරු) ඇතුළුව මිටිසුයි ඇන්ඩ් කො.ලිමිටඩ්, තායිසේ කොපරේෂන් සහ තවත් 9 දෙනෙකු එරෙහිව කර්නල් ඇන්ඩ් කො.ලිමිටඩ් විසින් ගොණු කර ඇත.

පැමිණිලිකරු විසින් බස්නාහිර පළාත්බද මහාධිකරණයේ මෙම නඩුකරය ගොණුකර, අධිකරණය වෙත කරුණු සැලකරමින් පැමිණිල්ලේ [m] සහ [n] ඡේද යටතේ වූ ආයාචනා ප්‍රකාර සමථකරණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් ඒක පාර්ශ්වීය වාරණ නියෝගයක් ලබාගන්නා ලදී.

අධිකරණය විසින් මෙම නඩුව 29.10.2003 දින සිට සමථකරණයක් ඇතිකරගැනීමට යටත් කොට පසෙක තබා ඇත.

35.3 කොළඹ දිසා අධිකරණ නඩු අංක 21819/MR

මෙම නඩුකරය 1 වන විත්තිකාර ගාමිණී ලක්ෂ්මන් පීරිස් මහතාට එදිරිව නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් රු. 35,938,000.00 ක මුදලක් සඳහා පවරන ලද අතර හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම එහි 2 වන වගඋත්තරකරු විය.

අධිකරණය විසින් මෙම නඩුව 2004 මාර්තු 17 දින සිට සමථකරණයක් ඇති කරගැනීමට යටත් කොට පසෙක තබා ඇත.

35.4 කොළඹ දිසා අධිකරණ නඩු අංක 15322/MR [ගොණුකළ දිනය 4/8/1994]

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම මෙම නඩුකරයේ පැමිණිලිකරු වේ.

රුපියල් 26,626,613.00 ක මුදලක් හි ඒ මත නෛතික පොළියද සමඟ අයකර ගැනීමටා නඩු හීන්දුවක් ලබාගැනීම පිණිස මෙම නඩුකරය විත්තිකාර නිහාල් ශ්‍රී අමරසේකර මහතාට එරෙහිව ගොණු කරන ලදී.

අධිකරණය විසින් මෙම නඩුව 2007 පෙබරවාරි 28 දින සිට සමථකරණයක් ඇතිකර ගැනීමට යටත් කොට පසෙක තබා ඇත.

රැස්වීම් පිළිබඳ නිවේදනය

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම 2018 අගෝස්තු මස 02 දින ප.ව. 3.30 ට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, හිල්ටන් කළමිබෝ හෝටලයේ තෙවැනි මහලේ ඕපල් 2 ශාලාවේදී පැවැත්වෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

න්‍යායපත්‍රය

1. රැස්වීමේ නිවේදනය පිළිගැනීම පිණිස පහත සඳහන් යෝජනාව සම්මත කරගැනීම

   "සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම පිළිබඳව දැනුවත් කෙරෙන 2018 ජූලි 23 දින දරන නිවේදනය, සාංගමික ව්‍යවස්ථාවලියේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිශ්චිතව දක්වා ඇති කාල පරිච්ඡේදයට වඩා අඩු කාලයක් තුළ රැස්වීම කැඳවා තිබීම යන කාරණය නොසලකා, වලංගු නිවේදනයක් ලෙස මෙයින් පිළිගනු ලබන බවට යෝජනා සම්මත කරනු ලැබේ".

2. 2017 දෙසැම්බර් 1 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව, සමාගමේ ගිණුම් ප්‍රකාශය සහ ශේෂ පත්‍රය සහ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගැනීම හා සලකා බැලීම

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනයට අනුව විගණකාධිපති සමාගමේ විගණක වශයෙන් ඉදිරියටත් කටයුතු කරනු ලබන බව සැලකිල්ලට ගැනීම.

හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පිවල්සී සමාගමේ
අධ්‍යක්ෂ මණ්ඩලයේ ආණ පරිදි

සීමා සහිත එස්.එස්.පී. කොපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම
සමාගම් ලේකම්වරුන්

2018 ජූලි 23 දින
කොළඹදී, ය.

සටහන :

- තමන් වෙනුවෙන් රැස්වීම්වලට සහභාගී වීමටත්, ඡන්දය පාවිච්චි කිරීමටත්, පෙරකලාසිකරුවෙකු පත්කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් හිමිකම් ලැබිය යුතුය.
- එසේ පත්කරනු ලබන පෙරකලාසිකරු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වීම අත්‍යවශ්‍ය නොවේ.
- මේ සමඟ ඒවා ඇති අදාළ පෙරකලාසිය රැස්වීමට යටත් පිරිසෙයින් පැය 48කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

සටහන්

සටහන්

පෙරකලාසි ආකෘති පත්‍රය

..... හි පදිංචි

..... වන මම/අපි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගමේ සාමාජිකයෙක්/සාමාජිකාවක්/සාමාජිකයෝ වශයෙන්, 2018 අගෝස්තු මස 02 දින පැවැත්වීමට නියමිත වාර්ෂික මහ සභා රැස්වීමේදී සහ එහි යම් කල්තැබූ සැසිවාරයකදී මා/අප නියෝජනය කරමින් ඊට සහභාගීවීමටත් එම රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පවත්වන සෑම ඡන්ද විමසීමකදීම මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමටත්, මාගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් :

කොළඹ පදිංචි ක්‍රිශාන්ත කුරේ මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ධීෂනා අමරසේකර මෙනවිය පත් කරමි/මු. ඇය අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ජේ.එම්.යූ.පී. ජයමහ මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි අතුල සේනානායක මහතා, පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ටෙහානි එස්.ඒ. මැතිව්ස් මෙනවිය පත් කරමි/මු. ඇය අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි දිණුක් කොළඹගේ මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ශෙෂ්මින් මන්සූර් මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ඩබ්.එස්.අයි.ඒ.ඩී.ආර්. සමරසිංහ මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි එම්. සොනාලි ලියනමාන්න මෙනවිය පත් කරමි/මු. ඇය අපොහොසත් වේනම්,
කොළඹ පදිංචි ප්‍රවීර සමරසිංහ මහතා පත් කරමි/මු. ඔහු අපොහොසත් වේනම්,

..... හි පදිංචි

..... යන අය මෙයින් පත් කරමි/මු.

	න්‍යාය පත්‍රයේ විෂයයන්	**පක්ෂයි**	**විපක්ෂයි**
1.	රැස්වීම පිළිබඳ නිවේදනය පිළිගැනීම.	☐	☐
2.	2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව හා ගිණුම් ප්‍රකාශය සහ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගැනීම හා සලකාබැලීම.	☐	☐
3.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනයට අනුව විගණකාධිපති සමාගමේ විගණක වශයෙන් ඉදිරියටත් කටයුතු කරනු ලබන බව සැලකිල්ලට ගැනීම.	☐	☐

වර්ෂ 2018 ක් වූ ..... මස .....වන මෙදින අත්සන් තබන්නට යෙදුනා ඇත.

.....
කොටස්හිමිකරුගේ අත්සන

සටහන:

1. ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් 4 වන පිටුවේ දක්වා ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙක් වීම අවශ්‍ය නොවේ.
3. ඡන්දය ලබාදීම සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් ලබාදීමට කරුණාකර අදාළ කොටුවේ "X" සලකුණු කරන්න.

පෙරකලාසිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. අදාළ හිස්තැනෙහි ඔබගේ නම, ලිපිනය, පැහැදිලි ලියා අත්සන හා දිනය යොදා පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කරන්න.
2. පෙරකලාසිය නීතිඥයෙකු විසින් අත්සන්කර ඇත්නම් හා ඒ සඳහා වන ඇටෝර්නි බලය සමාගමේ ලියාපදිංචිකර නොමැතිනම්, පෙරකලාසිය සමඟ අදාළ ඇටෝර්නි බලපත්‍රයද ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.
3. සමාගමක්/සංස්ථාවක් සම්බන්ධයෙන් පෙරකලාසිය නීත්‍යනුකූලව නියමකර ඇති ආකාරයෙන් සම්පූර්ණ කර, සහතික කළ යුතු ය.
4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, රැස්වීම ආරම්භවීමට යටත් පිරිසෙයින් පැය 48කට පෙර, සමාගම් ලේකම්වරුන් වන, කොළඹ 03, ඉනර් ෆ්ලවර් රෝඩ්, අංක 101 දරන ස්ථානයේ සීමාසහිත එස්.එස්.පී. කොපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගමට ගෙනවිත් භාරදිය යුතුය.
5. රැස්වීම සඳහා සහභාගීවීමට (සමාගමේ අධ්‍යක්ෂවරයෙක් නොවන) පෙරකලාසිකරුවෙකු පත්කරනු ලබන කොටස් හිමියෙකු විසින්, එම පෙරකලාසිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පෙරකලාසි පත්‍රය මත සඳහන් කළ යුතු අතර, රැස්වීමට පැමිණීමේදී ජාතික හැඳුනුම්පත රැගෙනයන ලෙස පෙරකලාසාකරුට දැනුම්දිය යුතුය.

සමාගම පිළිබඳ තොරතුරු

සමාගමේ නම	:	හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම
නෛතික ආස්ථිත්වය	:	සීමිත වගකීම් සහිත පොදු ලැයිස්තුගත සමාගමකි
සංස්ථාපනය කළ දිනය	:	1983 මාර්තු මස 15 දින
සමාගම් ලියාපදිංචි අංකය	:	PQ 143
නිසි බලධාරි	:	චන්දුකුමාර රාමචන්ද්‍ර මහතා
අධ්‍යක්ෂවරු	:	ක්‍රිශාන්ත කුරේ මහතා ජේ.එම්.යූ.පී. ජයමහ මහතා අතුල සේනානායක මහතා ධීෂනා අමරසේකර මෙනවිය ටෙහානි එස්.ඒ. මැතිවිස් මෙනවිය දිණුක් කොළඹගේ මහතා එම්. ශෙෂ්මින් මන්සූර් මහතා ඩබ්.එස්.අයි.ඒ.බී.ආර්. සමරසිංහ මහතා සොනාලි ලියනමාන්න මෙනවිය ප්‍රවීර් ධනෝෂ් සමරසිංහ මහතා
ලියාපදිංචි කාර්යාලය	:	හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) පීඑල්සී සමාගම අංක 2, ශ්‍රීමත් විත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02. දු.ක. : + 94 11 2433435 ෆැක්ස් : + 94 11 2446545 ඊමේල් : hdl_hilton@sltnet.lk වෙබ් අඩවිය : www.hoteldevelopers.lk
ලේකම්වරුන් හා රෙජිස්ට්‍රාර්	:	සීමාසහිත එස්.එස්.පී. කොපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම අංක 101, ඉනර් ෆ්ලවර් රෝඩ්, කොළඹ 03.
බැංකුකරුවන්	:	ලංකා බැංකුව, සමායතන ශාඛාව, අංක 4, ලංකා බැංකු මාවත, කොළඹ 01.
නීතිඥවරු	:	ඩී.අයි. ඇන්ඩ් එෆ්. ද සේරම් සමාගම නීතීඥවරුන් හා ප්‍රසිද්ධ නොතාරිස්වරුන් 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
විගනකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව පොල්දූව පාර, බත්තරමුල්ල.

Concept & Designed by
Copyline
a great equation
Printed by Printel (Pvt) Ltd